

INTERNATIONAL CENTRE FOR ETHNIC STUDIES

ROSA LUXEMBURG STIFTUNG SOUTH ASIA

# ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන: ඉතිහාසය සහ නෛතික රාමුව

සොෆි බිස්පින්ග්

# ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන:
# ඉතිහාසය සහ නෛතික රාමුව

සොෆී බිස්පින්ග්

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය
2023

ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථානඃ ඉතිහාසය සහ නෛතික රාමුව

@ **2023** ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

2, කින්සි ටෙරස්, කොළඹ 8, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපෑල : admin@ices.lk
URL : www.ices.lk
පළමු ප්‍රකාශය - 2023

ISBN: : 978-624-5502-19-6

මෙම ප්‍රකාශනය පදනම් වී ඇත්තේ ජර්මනියේ ෆෙඩරල් ජනරජයේ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වන ෆෙඩරල් අමාත්‍යාංශයේ අරමුදල් සමඟ Rosa Luxemburg Stiftung (RLS) විසින් සහාය දක්වන ලද පර්යේෂණ මත ය. මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන අයිතිය ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රස්ථානයට (ICES) අයත් වේ. මුල් ප්‍රකාශනයට නිසි සඳහනක් සපයන තෙක් මෙම ප්‍රකාශනය හෝ එහි කොටස් වෙනත් අයට නොමිලේ භාවිතා කළ හැක. අධ්‍යයනයේ ප්‍රකාශිත අර්ථකථන සහ නිගමන කතුවරයාගේ වන අතර ඒවා නිසැකවම ICES හෝ RLS හි අදහස් සහ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

ROSA
LUXEMBURG
STIFTUNG
SOUTH ASIA

ඉදිරිපස කවරයේ ඡායාරූපය රුවින් ද සිල්වා විසිනි.
ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය - මල්කාන්ති ගමගේ

මුද්‍රණය :
හොරයිසන් ප්‍රින්ටින් (පුද්) සමාගම.
1616/6, හතරමං හන්දිය,
මාළඹේ පාර, කොට්ටාව,
පන්නිපිටිය.

# ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන: ඉතිහාසය සහ නෛතික රාමුව

**සොෆි බිස්පින්ග්**

* සොෆි බිස්පින්ග් දැනට කැනඩාවේ Montreal හි McGill විශ්ව විද්‍යාලයේ නීති උපාධිය සම්පූර්ණ කරන අතර මීට පෙර රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධව සේවය කර ඇත. ඇයගේ ප්‍රධාන පර්යේෂණ අවශ්‍යතා අතරට සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ගැටළු, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, ව්‍යවස්ථාමය නීතිය සහ දේශීය නීති සම්ප්‍රදායන් ඇතුළත් වේ.

# පිළිගැන්වීම

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයේ සියලු දෙනාගේ නොමසුරු සහය නොවන්නට මෙම වාර්තාව සිදු කිරීමට නොහැකි වනු ඇත. ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන පිළිබඳ නිහතමානී සහ වැදගත් මාතෘකාවක් සම්බන්ධයෙන් වැඩ කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන එහි අධ්‍යක්ෂ මාරියෝ ගෝමස් මහතාට මම ස්තුතිවන්ත වෙමි. නදින් වන්නියසින්කම් සමග කළ සංවාද නිසාවෙන් මා හට මෙම පර්යේෂණය ශ්‍රී ලාංකේය සමාජයේ විශාල සන්දර්භය තුළ ස්ථානගත කිරීමට හැකි වූ අතර, මොහොමඩ් මව්සිල්ගේ සහාය නොමැතිව සම්මුඛ සාකච්ඡා සංවිධානය කිරීමට සහ පැවැත්වීමට නොහැකි වනු ඇත. මෙම වාර්තාවේ පදනමේ ඇති ඓතිහාසික හා නීතිමය පර්යේෂණවලින් ඔබ්බට, මා හට සම්මුඛ සාකච්ඡා කිරීමට හැකි වූ විද්වතුන්, ක්‍රියාකාරීන් සහ නීතිඥයින්ට මම කෘතඥ වෙමි. ඔවුන්ගේ කාලය, විශේෂඥභාවය සහ මෙම ව්‍යාපෘතිය සඳහා උපකාර කිරීමට ඇති කැමැත්ත වෙනුවෙන් මම බ්‍රිටෝ ප්‍රනාන්දු, චූලනි කොඩිකාර, සාරා කබීර් සහ රුකී ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන්ට ස්තුතිවන්ත වෙමි. අපගේ සංවාද මෙම කාර්යයේ දිශාව දර්ශනය කර දුන් අතර විවිධ දෘෂ්ටිකෝණයන් ඒකාබද්ධ කිරීමට මට උපකාර විය.

මැක්ගිල් විශ්ව විද්‍යාලයේ මානව හිමිකම් සහ නීතිමය බහුත්ව මධ්‍යස්ථානයට, විශේෂයෙන්ම එහි සම අධ්‍යක්ෂිකා නන්දිනී රාමනුජම්ට, ඇයගේ සහයෝගයට සහ මට ICES සමඟ වැඩ කිරීමට ඉඩ සලසන ආයතනික රාමුව නිර්මාණය කිරීම ගැන මම ස්තුතිවන්ත වෙමි. මෙම කෘතියේ මුල් කෙටුම්පත පිළිබඳ ඔවුන්ගේ ප්‍රයෝජනවත් සහ තීක්ෂණ බුද්ධිය සහිත අදහස් දැක්වීම සඳහා, මම බියට්‍රිස් ගොඩාඩ්, නිකොලස් හෙවෙකර්, ඇල්බට් ඩෙගස්පේ සහ ලාරා විජේසූරියට කෘතඥ වෙමි. මෙම වාර්තාව රුකී ෆර්නෑන්ඩු සහ ලියා කෙන්ට් ගේ සමාලෝචනවලින් ද බොහෝ සෙයින් ප්‍රයෝජන ලද අතර, ඔවුන්ගේ ප්‍රතිපෝෂණය මෙම කාර්යය වඩාත් නිරවද්‍ය, අධ්‍යයනයට පහසු සහ අදාළ කර ඇත. පිටපත් සංස්කරණයට සහ පිටු සැකසීම වෙනුවෙන් දිනුෂි වල්පොලට සහ මරිස්සා ජැන්ස්ට මගේ ස්තුතිය පුද කරමි. ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන හා සම්බන්ධ ඓතිහාසික සන්දර්භය සහ නීතිමය ගැටලුව පිළිබඳ දළ විශ්ලේෂණයක් පාඨකයන්ට ලබා ගැනීමට මෙම කෘතිය උපකාර වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

# පටුන


1. හැඳින්වීම 1

2. ප්‍රධාන විමර්ශනයන් හා බැඳුණු ඉතිහාසය 8

සූරියකන්ද (1994) 11

චෙම්මනි (1998) 13

දුරයප්පාක්‍රීඩාංගණය - යාපනය (1999) 14

මාතලේ (2012) 15

කලවංචිකුඩි (2014) 17

මන්නාරම (2013) 17

මන්නාරම (2018) 18

3. නෛතික රාමුව 20

A. අනාවරණය 22

B. විමර්ෂණය 26

C. නඩු පැවරීම 29

D. පවුල්වලඅයිතිවාසිකම් 31

E. අනුස්මරණය කිරීම 33

4. සාකච්ඡාව සහ වඩාත් යහපත් භාවිතයන් 36

5. නිගමනය 40

1 වන ඇමුණුම : හඳුනාගෙන ඇති මිනීවළවල් අකාරාදී පිළිවෙලට ලැයිස්තුගත කිරීම 43

2 වන ඇමුණුම : අන්තර්-ජාතික සහ විදේශීය නීති විද්‍යාව 48

3 වන ඇමුණුම : උපුටා දක්වා ඇති නීති 51

දේශීය 51

අන්තර්-ජාතික නීති 51

4 වන ඇමුණුම: තවදුරටත් අදාළ මාර්ගෝපදේශ 52

ග්‍රන්ථනාමාවලිය 53

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය දශක තුනක කාලයක් මුළුල්ලේ පැවති අතර, නිල වශයෙන් එය 1983 දී ආරම්භ වී 2009 දී අවසන් විය. උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ සුළුතරය සඳහා ස්වාධීන රාජ්‍යයක් පිහිටවන ලෙස ඉල්ලමින් උද්ඝෝෂනය කළ දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ) කැරලිකාර කණ්ඩායමට එරෙහිව සිංහල ජාතිය ආධිපත්‍යය දැරූ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සිදුකළ සටනක් ලෙස මෙය සැලකිය හැක (ආනන්දකුගන් 2020). ගැටුම නිල වශයෙන් ආරම්භ වූයේ 1983 ජූලි මාසයේදීය, එය කොළඹ දෙමළ ජනයා ඉලක්ක කර ගනිමින් ප්‍රචණ්ඩකාරී කැරලි කෝලහාල ඇති වූ මාසයකි, පසුව එය "කළු ජූලිය" ලෙස ප්‍රසිද්ධ විය. තමන් විසින් LTTE නායකයා මරා දැමූ බවට ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අංශ ප්‍රකාශ කිරීමත් සමඟ දශක තුනක් මුළුල්ලේ පැවති මෙම යුද්ධය 2009 මැයි මාසයේදී අවසන් විය. ගැටුම අවසන් වී වසර දහයකට වැඩි කාලයක් ගතව ගොස් ඇතත් තවමත් බොහෝ ගැටලු නොවිසඳී එලෙසම ඉතිරිව ඇත. ඉන් එක් ගැටළුවක් වන්නේ දිවයිනේ ඇතැම් ප්‍රදේශවලින් හඳුනාගනු ලැබූ සමූහ මිනීවල සංඛ්‍යාවයි. 2014 දී, ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ සමූහ මිනීවල 28 ක් (ඉලංගමුව 2014) පවතින බව ලැයිස්තුගත කර තිබුණ අතර එතැන් සිට කාලය තුළ තවත් සමූහ මිනීවළවල් 4 ක් සොයාගෙන ඇත. පුවත්පත් ලිපි, රජයේ මාධ්‍ය නිවේදන සහ මානව හිමිකම් සංවිධානවල මූලාශ්‍ර ඒකාබද්ධ කිරීමෙන්, සමස්ථ සමූහ මිනීවළවල් සංඛ්‍යාව 32ක් ලෙස මේ වන විට මෙම වාර්තාවී ඇත.[1] මෙම ස්ථානවලින් හයක් 2004 සුනාමි ව්‍යසනයෙන් පසු නිර්මාණය වූ සොහොන් බව හඳුනාගෙන ඇති අතර, ඒවා මෙම වාර්තාවේ අවධානයට ලක් නොවේ. අනෙකුත් ස්ථාන ගත් කළ ඒ සම්බන්ධයෙන් නිල විමර්ශන කිහිපයක් පමණක් සිදුකර ඇත. දේශීය හා ජාත්‍යන්තර නීතිමය ව්‍යුහය තුළ එසේ කළ යුතු බවට රජයට නීතිමය බැඳීමක් තිබියදීත්, සහ වළලා දමා ඇති තම ආදරණීයන්ගේ සිරුරු නැවත ගොඩගන්නා ලෙස ප්‍රජාවන්ගෙන් බලපෑම් තිබියදීත්, ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට හෝ ඒ හා අදාළ වින්දිතයන් හඳුනා ගැනීමට ඒ කිසිවක් හේතු වී නැත.[2]

වල දමා ඇති සිරුරු නැවත ගොඩගන්නා ලෙස ඉල්ලමින් උද්ඝෝෂණවල නිරත වන පුරවැසියන් ඇතැම් විට බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් හඳුනා ගැනීමේ සහ රජයේ නිලධාරීන් විසින් ගැටළුව සඳහා ලබා දුන් විසඳුම් සම්බන්ධයෙන් දේශපාලන අරගලවල නිරත වේ. සමූහ මිනීවළවල්වල මිහිදන් කරන ලද වින්දිතයන්ගෙන් ඇතැමෙක් බලහත්කාරයෙන් අතුරුදන් කළ

---

[1] එක් එක් ස්ථාන සහ එහි අනාවරණයන් පිළිබඳ නිශ්චිත තොරතුරු සඳහා ඇමුණුම 1 හි ඇතුළත් වගුව බලන්න.

[2] උදාහරණයක් ලෙස, කලුවංචිකුඩි සමූහ මිනීවළේ සිද්ධිය බලන්න, එහිදී ගම්වාසීන් සහ යුද්ධයෙන් විපතට පත් මුස්ලිම් ජාතිකයන්ගේ ඥාතීන් 66 දෙනෙකු තම ආදරණීයන් වෙනුවෙන් නිසි භූමදානයක් සිදු කිරීම සඳහා ඔවුන්ගේ සිරුරු නැවත ගොඩගන්නා ලෙස ඉල්ලා ඇත (විජේදාස 2014). සූරියකන්ද මිනීවළ සම්බන්ධයෙන් ගම්වැසියන් ද සිරුරු නැවත ගොඩගන්නා ලෙස ඉල්ලීම් කර ඇත (බෝහම් සහ ආරච්චි 2018).

පුද්ගලයන් බවට බොහෝ විට සැක කෙරේ.[3] බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාවෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම සමඟ ලියාපදිංචි වී සිටින, ලොව දෙවනියට වැඩිම නඩු සංඛ්‍යාවකට හිමිකම් කියන රට බවට පත්ව ඇත්තේ ශ්‍රී ලංකාවයඃ 1983 යුද්ධයේ ආරම්භයේ සිට (ගංගුලි 2021) පුද්ගලයින් 60,000 ත් 100,000 ත් අතර සංඛ්‍යාවක් බලහත්කාර අතුරුදහන් කිරීම්වලට ලක්ව ඇති බව ගණන් බලා ඇත. සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම අතුරුදහන් වූවන්ගේ පවුල්වලට අවශ්‍ය බොහෝ පිළිතුරු ලබා දීමට හේතු විය හැකි අතර, යුද්ධය අතර සිදුවූ සමූහික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් රජය සතු වගකීම ද පහදා දේ. කෙසේ වෙතත්, බලහත්කාරයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ විමර්ශන ඉල්ලා සිටින උද්ඝෝෂන සැම විටම සමූහ මිනීවලවල් ගොඩගැනීම සම්බන්ධයෙන් පවතින දැඩි කැමැත්ත හා ඒකාබද්ධ නොවේ, මන්ද අතුරුදහන් වූවන්ගේ මව්වරුන් සහ අතුරුදහන් වූවන්ගේ පවුල් වැනි කණ්ඩායම් සමඟ වැඩකරන ඇතැම් ක්‍රියාකාරීන් අතුරුදහන් වූ තම ආදරණීයන් මියගොස් ඇති බවට පිළිගැනීමට අකමැති ය. තවද, බලහත්කාරයෙන් සිදුකරන අතුරුදන් කිරීම් හැරුණ කොට වෙනත් අපරාධවල ප්‍රතිඵලයක් ලෙස ද සමූහ මිනීවළවල් ඇති විය හැක. කෙසේ වෙතත්, මෙකී කණ්ඩායම්වල දේශපාලන අරගලය සඳහා වල දැමූ සිරුරු නැවත ගොඩගැනීම තුළ අත්පත වන ප්‍රතිඵලය කුමක් ද යන්න විමසූ විට, අතුරුදහන් වූවන්ගේ පවුල් පිළිබඳ සිවිල් සමාජ සංවිධානයේ සභාපති බ්‍රිටෝ ප්‍රනාන්දු ප්‍රකාශ කළේ, සොයාගත් සියලුම සමූහ මිනීවළවල්වල ඇති සිරුරු ගොඩගෙන, වින්දිතයන් හඳුනාගෙන, ඔවුන්ගේ දේහ නැවත ඔවුන්ගේ පවුල්වලට ලබා දිය යුතු බවත්, තම අහිමි වූ ආදරණීයන් වෙනුවෙන් ශෝකවීමට හෝ වැලපීමට එය ඔවුන්ට අවස්ථාව ලබා දෙන බවත් ය (බ්‍රිටෝ ප්‍රනාන්දු 2022).

මෙම සාමූහික මිනීවළවල් පිළිබඳ තොරතුරු සහ ඒවා සොයා ගැනීම, විමර්ශනය කිරීම සහ අනුස්මරණය හා අදාළ නීති වෙන් වෙන් වශයෙන් පවතින අතර ඒවා විවිධ මූලාශ්‍රවල විසිරී ඇත. මෙම වාර්තාව මෙකී හිඩැසට පිළියම් සෙවීම අරමුණු කරන අතර රජයේ ලේඛන, මාධ්‍ය මූලාශ්‍ර, මානව හිමිකම් සංවිධාන විසින් ප්‍රකාශයට පත් කළ ශාස්ත්‍රීය ග්‍රන්ථ සමාලෝචන සහ 2022 දී ක්‍රියාකාරීව කටයුතු කළ ශ්‍රී ලාංකික ක්‍රියාකාරීන් සහ නීතීඥයින් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා මත පදනම්ව ඇත.[4] මෙම කාර්යයේදී ප්‍රථමයෙන්ම මෙම සමූහ මිනීවළවල් පිළිබඳ දැනට හඳුනාගෙන ඇති තොරතුරු ඉදිරිපත් කර ඇති අතර මේ වනවිට විමර්ශනය කරන ලද ප්‍රධාන ස්ථාන පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත. ඉන් අනතුරුව සමූහ මිනීවළවල් විමර්ශනය කළ හැකි සහ වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා

---

[3] බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ පූර්විකාව සහ 2 වැනි වගන්තිය බලහත්කාර අතුරුදහන් කිරීමක් ලෙස අර්ථ දක්වා ඇත්තේ රාජ්‍ය නියෝජිතයන් විසින් හෝ රාජ්‍යයේ අවසරය, සහයෝගය හෝ අනුදැනුම ඇතිව ක්‍රියා කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින්, අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, පැහැර ගැනීම හෝ වෙනත් ඕනෑම ආකාරයක නිදහසක් අහිමි කිරීම සහ ඔහුගේ නිදහස අහිමි කිරීම පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම හෝ ඔහු සිටින ස්ථානය වසන් කරමින් එවැනි පුද්ගලයෙකු නීතියේ ආරක්ෂාවෙන් බැහැර කිරීමයි.

[4] මෙම වාර්තාව පිළියෙල කිරීමේ දී සම්මුඛ සාකච්ඡාවට ලක් කළ පුද්ගලයන් අතර අතුරුදන් වූවන්ගේ පවුල්වල සභාපති බ්‍රිටෝ ප්‍රනාන්දු, කතුවරියක වූ සාරා කබීර්, ශාස්ත්‍රීය දැනුමින් යුත් වූලනී කොඩිකාර සහ ක්‍රියාකරුවෙකු වූ රුකී ප්‍රනාන්දු ඇතුළත් වේ.

කරන නීතිමය ව්‍යුහයන් ස්ථාපිත කිරීමට උත්සාහ ගෙන ඇත. මෙම තොරතුරු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ කටයුතු කරන නීතීඥයින්ට පමණක් නොව, මෙම ප්‍රශ්නය පිළිබඳව වඩා හොඳින් දැනුවත් වීමට කැමති ඕනෑම පුද්ගලයෙකුට ද ප්‍රයෝජනවත් වනු ඇත. මෙම වාර්තාවේ මූලික අරමුණ වන්නේ ගැටුම්වලින් පසු සමාජයක, සමූහ මිනීවළවල් කළමනාකරණය කිරීමේ සෑම පියවරක්ම, එනම් ඒවා හඳුනාගැනීමේ සිට අනුස්මරණය දක්වා පාලනය වන නීතිවලට වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි තත්ත්වයක් නිර්මාණය කිරීමයි. ඊට සමගාමීව, මෙම වාර්තාව මීට පෙර ලොව පුරා පැවති සමූහ මිනීවළවල් පිළිබඳ සිදුකළ විමර්ශනවලින් උකහා ගත් පාඩම් කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ බලහත්කාර අතුරුදහන් කරවීම සහ වගවීම පිළිබඳ ගැටළු පිළිබඳව සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඉදිරියේ දි සිදුකරන සාකච්ඡා මේ තුළින් දැනුවත් කරනු ඇත.

මෙම කාර්යයේ විෂය පථය සමූහ මිනීවළවල්වලට පමණක් සීමා වී ඇති අතර, "මරණය ආශ්‍රිත තත්ත්වයන් සහ/හෝ සිරුර බැහැර කිරීම සඳහා භාවිතා කළ ක්‍රමවේදයේ නීත්‍යානුකූල භාවය පිළිබඳ විමර්ශනයක් අවශ්‍ය" හඳුනා නොගත් වින්දිතයින් තිදෙනෙකුගේ හෝ වැඩි ගණනකගේ දේහයන් ඇතුළත් සුසාන භූමියක් ලෙස අර්ථ දක්වා ඇත, (ක්ලින්ක්නර් 2020, 4). කෙසේ වෙතත් තවමත්, සමූහ මිනීවළක් නිර්වචනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර නෛතික එකඟතාවයක් නොමැත (Callamard 2020). ඇතමුන් එය එකට වළලනු ලැබූ සිරුරු දෙකක් හෝ වැඩි ගණනක් ලෙස නිර්වචනය කරයි (Minnesota Protocol 2017, 110), තවත් පිරිසක් පවසන්නේ , එයට පුද්ගලයන් හය දෙනෙකු හෝ වැඩි ගණනක් ඇතුළත් වන බවයි. (Haglund, Connor, and Scott 2001). අධිකරණ වෛද්‍ය විශේෂඥයන් සමූහ මිනීවළවල් විස්තර කරන්නේ "බොහෝ දේහයන් සම්මිශ්‍රවූ" (Pass and Embar-Seddon 2015), "අගලක්, වළක්, හොඳින් සකස් කරන ලද හෝ කොටස් කළ සහ විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් මිනිස් සිරුරු සහිත ස්ථානයක් ලෙසය." (Fernández-Alvareza et al 2016" 10).

නීතිවිරෝධී, චාරිත්‍රානුකූල නීතිමය විධිවිධානවලින් තොරව හෝ අත්තනෝමතික ක්‍රියාත්මක කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු, "සමූහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ සහ/හෝ එය විමර්ශනය කිරීමට වගකීමක් ඇති කරන" ස්ථානයක් බව උපකල්පනය කිරීමේ පූර්ව අවශ්‍යතාවය එක් කරයි. (Callarmard 2020, 4) මේ අනුව විවිධ මානව හිමිකම් කඩවීම් සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමේ හැකියාව ද සමූහ මිනීවළවල්වලට ඇත. මෙම වාර්තාවේ භාවිතා කර ඇති පාරිභාෂික වචන අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථ වලින් උකහා ගෙන ඇත. මේ අනුව, 'කැණීම්' යන යෙදුම භාවිතා කරනුයේ වළලනු ලැබූ නටබුන් සහ වෙනත් සාක්ෂි සොයා ගැනීම සඳහා පොළොව ඉවත් කිරීම දැක්වීමට ය. ඒ තුළින් සාමාන්‍යයෙන් අදහස් වන්නේ මිනිසුන් නොවන වෙනත් වළලන ලද දෑ පිළිබඳ සාක්ෂි සොයා ගැනීමයි. 'මළ සිරුරක් හරා ගොඩගැනීම්' යන්නෙන් අදහස් කරන්නේ අනාවරණය වූ මළ සිරුරු ගොඩගැනීමේ නිශ්චිත ක්‍රියාවයි. මෙම ක්‍රියා දෙකම සමූහ මිනීවළක් පිළිබඳ විමර්ශනය හා සම්බන්ධ වේ.

ලොව පුරා, සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් බොහෝ විශේෂිත තල (සමාජ, දේශපාලන, ආගමික සහ තවත්) රාශියක් ඇති අතර අදාළ ශාස්ත්‍රීය ග්‍රන්ථ විවිධ වූ දැනුම් පද්ධති මත ගොඩනගා ඇත. ඉතිහාසඥයින් ඒවා නිර්මාණය කිරීමට හේතු වූ තත්ත්වයන් සහ සිදුවීම් පිළිබඳව අවබෝධය ලබා දීමට උත්සාහ කරන අතර, දේශපාලන විද්‍යාඥයින් සහ දාර්ශනිකයන් සමූහ ප්‍රචණ්ඩත්වයේ උත්පත්තිය සහ සමූහ මිනීවළවල් නිර්මාණය කිරීමට ඉඩ සලසන දේශපාලන වාතාවරණයන් පිළිබඳ න්‍යායන් ඉදිරිපත් කරයි.[5] සමූහ මිනීවළවල් අපරාධයක සාක්ෂි ලෙස තක්සේරු කරමින්, සමූහ අපරාධයක් විධිමත්ව විශ්ලේෂණය කර (Anstett and Dreyfus 2016, 4) ඒවාට නඩු පැවරීමට නීතිමය ව්‍යුහයක් නිර්මාණය කිරීමට නීති විශාරදයන් උත්සාහ කර ඇත. අධිකරණ වෛද්‍ය මානව විද්‍යාඥයන් සහ පුරාවිද්‍යාඥයන් වින්දිතයන්ගේ අනන්‍යතාවය සහ ඔවුන් මිය ගිය වේලාව තීරණය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රියා පටිපාටි සකස් කර ඇත. මියගිය අය සම්බන්ධයෙන් නිවැරදි සහ ගෞරවනීය ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට උපකාර කරමින් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කරමින් මානුෂීය අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රය නංවාලමින් මෑත වසරවලදී, මානුෂීය ක්‍රියාවන්ට සහාය වීම සඳහා අධිකරණ වෛද්‍ය විද්‍යාව වැඩි වැඩියෙන් භාවිතා කර ඇත (Cordner and Tidball-Binz 2017). මෙම ශාස්ත්‍රීය සංවාදවලින් මෙන්ම පසුගිය දශකය තුළ බිහි වූ සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ප්‍රකාශන වලින් බැහැරවූ ප්‍රකාශන තුළින් ද මෙම වාර්තාවට අවශ්‍ය දැනුම ලබා ගන්නා ලදි.

සමූහ මිනීවළවල් විමර්ශනය කිරීමේ සංකීර්ණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධාන විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ, ප්‍රොටෝකෝල සහ යහභාවිතයන් ඇතුළත් ලිපි ලේඛන වැඩි වෙමින් පවතී. මෙහිදී සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සහ විමර්ශනය පිළිබඳ 2020 Bournemouth ප්‍රොටෝකෝලය විශේෂයෙන්ම වැදගත් වේ. Bournemouth විශ්ව විද්‍යාලයේ විද්වතුන් විසින් අතුරුදහන් වූවන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (ICMP) සමඟ එක්ව මෙම ප්‍රොටෝකෝලය ලියා ඇත. සමූහ මිනීවළවල් සොයාගැනීමේ සිට ඒවා අනුස්මරණය කිරීම දක්වා වූ කාර්යයන් තුළ සමූහ මිනීවළවල් හා සම්බන්ධ විවිධ ක්‍රියාකාරීන්ට සහයෝගය දැක්වීම සඳහා නීති රීති සහ දැනුවත් භාවිතයන් ඇතුළත් කිරීම තුළින් සමූහ මිනීවළවල් විමර්ශනය කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මග පෙන්වීමක් ඒ තුළින් ලබා දෙයි. ජාත්‍යන්තර නීති රාමු තුළ සමූහ මිනීවළවල් ඇත්තේ කුමන ස්ථානයේ ද යන්න පිළිබිඹු කිරීම සඳහා මෙම වාර්තාව එකී ප්‍රොටෝකෝලයෙන් ද කරුණු උකහා ගෙන ඇත.

කෙසේ වෙතත්, සෑම තත්ත්වයකටම යොදාගත හැකි ආදර්ශයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයක් ලෙස Bournemouth ප්‍රොටෝකෝලය පවතී. හොඳම භාවිතයන් සඳහා උත්සාහ කිරීමේදී, ප්‍රොටෝකෝලයේ නිර්දේශ ඇතැම් විට සමූහ මිනීවළක් ගොඩ ගැනීම, විමර්ශනය කිරීම, සිරුරු හඳුනා ගැනීම සහ අනුස්මරණය සඳහා පවතින දේශීය සම්පත්වලින් වෙන් වී ඇති බවක්

---

[5] මහජන ප්‍රචණ්ඩත්වයේ ආරම්භය පිළිබඳ දාර්ශනික න්‍යායන් සඳහා උදාහරණයක් ලෙස Hannah Arendt ගේ කෘතීන් බලන්න. මෑත දශක කිහිපය තුළ, සමූහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැනුම වර්ධනය වීම ජන සංහාර අධ්‍යයන ක්ෂේත්‍රය සහ සමූහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සඟරාව, ජන සංහාර පර්යේෂණ සහ ඒවා වැළැක්වීම වැනි ප්‍රකාශනවලට හේතු වී තිබේ.

පෙනෙන්නට ඇත. සාර්ථක අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අවට වෙසෙන ප්‍රජාවන්ගෙන් DNA දත්ත සාම්පල DNA දත්ත ගබඩාවකට එක්රැස් කිරීම සහ එක් එක් පුද්ගලයා හඳුනා ගැනීම සඳහා රසායනාගාර ක්‍රියා පටිපාටි අවශ්‍ය වන අතර එය දත්ත රැස් කිරීම දීර්ඝ සහ වෙහෙසකාරී ක්‍රියාවලියකි. සමූහ මිනීවළවල් විමර්ශන ගෝලීය අසමානතා සලකුණු කරන ආකාරය කතුවරයෙකු වන Adam Rosenblatt විස්තර කර ඇත. මන්ද, ගෝලීය වශයෙන් ගත් කළ උතුරේ සහ දකුණේ (Rosenblatt 2020) පවතින සම්පත් අතර විශාල වෙනසක් ඇත. මෙකී සමූහ මිනීවළවල් විමර්ශනය කරන ලෙස රටවල්වලින් ඉල්ලා සිටින ජාත්‍යන්තර සංවිධාන ඇතැම් විට මෙම වෙනස කෙරෙහි කිසිදු හැඟීමක් නැති බවක් පෙනෙන්නට ඇත.

අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධවන ගැටළුවක් වන්නේ මේ සම්පත් ලබාදීමට හිතකර දේශපාලන සන්දර්භයක් නොමැතිකමයි. සමූහ ප්‍රචණ්ඩත්වයේ අවස්ථා අත්විඳ ඇති බොහෝ සමාජවලට "ලේඛනගත කිරීමට පෙර සංරක්ෂණය කරන ලද ලිපි ලේඛන වෙත වඩාත් නිදහසින් ප්‍රවේශ වීමට ඇති හැකියාව සමඟ හිතකර දේශපාලන සන්දර්භයක් නිර්මාණය වන තෙක් බලා සිටීමට සිදු විය" (Anstett and Dreyfus 2016, විධික්‍රම සඳහා ප්‍රවේශයන්, 2). හිතකර නොවූ දේශපාලන සන්දර්භයන් තුළ කැණීම් සිදු කරන විට, සමාජය තුළ තවදුරටත් බෙදීම් ඇති කරවන සමාජ අවදානම පිළිබඳ සලකා බැලීම වැදගත් වේ. විද්වතුන් වන Elizabeth Anstett සහ Jean-Marc Dreyfus තර්ක කරන්නේ, වින්දිතයන් හඳුනා ගැනීමට ගන්නා උත්සාහයන් තව තවත් ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කරන අවදානමක් නියෝජනය කරන විට, මිය ගිය පුද්ගලයන් නැවත ගොඩගැනීමකින් අපේක්ෂා කරන ප්‍රතිලාභවලට වඩා ඒ තුළ නිර්මාණය කරන ගැටළු වර්ධනය වේද යන්න සලකා බැලීම වැදගත් බවයි (Anstett and Dreyfus 2015, මිනිස් අස්ථි කොටස් හා හඳුනාගැනීම, 4).

අධිකරණ වෛද්‍ය ප්‍රතිඵල සඳහා අප ලබා දෙන පැහැදිලි කිරීමේ බලය ස්ථානගත කිරීම ද වැදගත් ය. මෙම මිනීවලවල් බිහිවීමට තුඩු දෙන තත්ත්වයන් තේරුම් ගැනීම අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකින් කිසිසේත් නොහැකි වේ. 1980 ගණන්වල මැද භාගයේ සිට, සමූහ ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති සමාජයන් සිදුවූ දේ පිළිබඳ අවබෝධාත්මක වාර්තාවක් ගොඩනැගීම සඳහා දිවි ගලවා ගත් අයගේ ආඛ්‍යානවලට වඩා ද්‍රව්‍යමය සාක්ෂි කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත (Anstett and Dreyfus 2015, Human Remains and Identification 7). සමූහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විමර්ශන සම්පූර්ණයෙන් ම විද්‍යාත්මක ක්‍රම සහ ශිල්පීය ක්‍රම මත පැවරීමක් ලෙස (Dziuban 2017, 12) මෙය හැඳින්විය හැක.

අපරාධ විමර්ශනය කිරීමේ දි අධිකරණ වෛද්‍ය සාක්ෂි අවශ්‍ය වුවද, ප්‍රජාව විමසන ප්‍රශ්නවලට උත්තර ලබා දීමේ එකම ක්‍රමය එය නොවේ. තවද, විද්වතුන් වන එරික් ස්ටෝවර් සහ රේචල් ෂිගෙකේන් යෝජනා කරන්නේ විමර්ශනයකදී මිනිස් අස්ථි කොටස් සාක්ෂි ලෙස සැලකීම ඇතැම් විට තම මිය ගිය ආදරණීයන් නැවත භූමදානය කිරීමට ප්‍රජාව තුළ ඇති අවශ්‍යතාව නොසලකා හැරීමක් විය හැකි බවයි (ස්ටෝවර් සහ ෂිගෙකේන් 2002). විශේෂයෙන්ම එම කැණීම් රාජ්‍ය ආරක්ෂක අංශ විසින් සිදුකරනු ලබන්නේ නම්, ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් රාජ්‍යය සමඟ ඇති

අම්හිරි ඉතිහාසයේ අත්දැකීම් විඳ ඇති ප්‍රජාවන්ට සමූහ මිනීවළවල් පිළිබඳ සිදුකරන අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පිළිබඳ අනාරක්ෂිත හැඟීමක් ඇති කළ හැකිය. කතුවරියක වන සාරා කබීර් පවසා සිටින්නේ තවමත් දැඩි ලෙස මිලිටරිකරණයට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත්වන මිනිසුන් තුළ මෙම හැඟීම මේ ආකාරයටම ඇති විය හැකි බවයි.[6] මෙය පෙරලා එකී ප්‍රජාවන් මෙකී විශ්ලේෂණයන්හි ප්‍රතිඵල විශ්වාස නොකිරීමට හේතු විය හැකි අතර, එහිදී අධිකරණ වෛද්‍ය පරීක්ෂණ ප්‍රාදේශීය ප්‍රජාවන් විසින් පිළිගන්නා සත්‍යයක් අනාවරණය කිරීමට ඉඩ නොදෙනු ඇත.

සැබවින්ම, දෙමළ සහ සිංහල සිවිල් සමාජ කණ්ඩායම් දෙකම තර්ක කරන්නේ සිවිල් යුද්ධ හා බැඳුණ වර්තමාන අනුස්මරණ ක්‍රියාවලිය සහ ලේඛනගත කිරීම් ඒකපාර්ශ්වික වන අතර[7] එය ප්‍රජාවන් අතර පවතින බෙදීම් තව තව වර්ධනය කළ හැකි බවයි. සංහිඳියාව සහ සාමය ඇති කිරීම සඳහා සැබවින්ම පෙනී නොසිටින, සමාජය තුළ බෙදීම් ඇති කරන එවැනි පක්ෂිවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය විය හැකි බැවින් මිය ගිය අයගේ සිරුරු සෙවීමේදී සහ හඳුනාගැනීමේදී ජයග්‍රාහී ආඛ්‍යානයන්ට එරෙහි වීම වැදගත්ය. මෙම මාතෘකාව සම්බන්ධයෙන් පවතින සංවේදිතාව හේතු කොට ගෙන ඒ තුළින් දේශපාලනමය වාසි ලබා ගැනීමට සහ මාධ්‍ය තුළ ඒ පිළිබඳව අතිශයෝක්තියෙන් කතා බහ කිරීමට විශේෂයෙන් ලක් වේ. කෙසේ වෙතත්, මෙම වාර්තාව සකස් කිරීමේ දි අප සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වූ කතුවරුන් සහ ක්‍රියාකාරීන් සමූහ මිනිවළවල් පවතින ස්ථාන තුළ සිදු වූ දේ පිළිබඳ සාකච්ඡාවක් ගොඩනැගීමේ වැදගත්කම අවධාරණය කළහ. ශ්‍රී ලංකාවෙන් මෙතෙක් සොයාගෙන ඇති සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ගත් කළ මෙය ඉතා දුෂ්කර කාර්යයක් බව ඔප්පු වී ඇත. විපතට පත් ප්‍රජාවන් උදෙසා තාර්කික සහ අදාළ සියලු කරුණු ඇතුළත් පරිපූර්ණ ආඛ්‍යාන ස්ථාපිත කිරීමට විමර්ශනවලට තවමත් නොහැකි වී ඇත. බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සිය ලේඛනගත කිරීම්වලදි විද්වතියක් වන චූලනි කොඩිකාර, මෙම ගැටලුව පිළබඳ රජයේ කතිකාව සංකල්පගත කර ඇත්තේ අතීතය මකා දැමීමට ගන්නා උත්සාහයක් ලෙසයඃ මෙම ප්‍රශ්නයේ බරපතල කම පිළිගැනීම ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කිරීම තුළ විවාදාත්මකව මෙන්ම, අතුරුදහන් වී ඇති පුද්ගලයින් සංඛ්‍යාව තවමත් ගණනය නොකිරිම තුළ භෞතිකව (කොඩිකාර 2022). සමූහ මිනීවළවල් හඳුනාගත් පසු ඒ පිළිබඳ කතිකාව මෙම මකාදැමීමේ තර්කයට ඒකාබද්ධ කර ඇති බවක් පෙනේනට ඇත. මීළඟ කොටසින් පෙන්වා දෙන පරිදි, සමූහ මිනීවළවල් සහ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් අතර කිසිදු සම්බන්ධයක් නොමැති බවට අභියෝග කිරීමටත්, ඒවායේ පැවැත්ම පැහැදිලි කිරීමට විවිධ උපකල්පිතයන් ඉදිරිපත් කිරීමටත් රජයේ නිලධාරීන්

6 වැඩි විස්තර සඳහා "සදාකාලික යුද්ධය? ශ්‍රී ලංකාවේ උතුරේ හමුදා පාලනය", ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම 2014, < https://www.crisisgroup.org/asia/south-asia/sri-lanka/forever-war-military-control-sri-lanka-s-north>


7 නිදසුනක් ලෙස "Selective Memory: Erasure & memorialisation in Sri Lankazs North", 2017 දී කොළඹ පදනම් කරගෙන විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය සඳහා ලියා ඇති වාර්තාව, < https://www.cpalanka.org/selective-memory-erasure-memorialisation -in-sri-lankas-north/>; වෙතින් ලබා ගත හැකිය. එමෙන්ම 2021 දී යාපනය පදනම් කරගත් අඩයාලම් ප්‍රතිපත්ති පර්යේෂණ මධ්‍යස්ථානය විසින් ලියන ලද "තත්ත්ව සංක්ෂිප්ත අංක 4ඃ ශ්‍රී ලංකාවේ දෙමළ සමාජයේ මතක තබා ගැනීමේ අයිතිය මර්දනය කිරීම" යන ලිපිය http://adayaalam.org/situation-briefing-no-4-sri-lankas-repression-of-the-tamil-politys-right-to-remember/> වෙතින් ලබා ගත හැකිය.

යුහුසුළු වේ. සමූහ මිනීවළක් සාර්ථක ලෙස විමර්ශනය කිරීමට සහ ඒ පිළිබඳ අනුස්මරණයන් සිදු කිරීමට රජයට ඇති හැකියාව පිළිබඳව දේශීය ප්‍රජාවන් සහ ජාත්‍යන්තර කණ්ඩායම් අතර ඇති විශ්වාසය බිඳ වැටීමට මෙය දායක වේ. මෙම කාර්යය කොටස් තුනකට බෙදා ඇත. පළමුවැන්න තුළින් ඓතිහාසික පසුබිම ඉදිරිපත් කරන අතර ප්‍රධාන සමූහ මිනීවළවල් සහ ඒවායේ විමර්ශන කටයුතු පිළිබඳ දැනුම කැටිකරයි. දෙවැන්න තුළින් සමූහ මිනීවළක් සොයා ගැනීම, ඒ පිළිබඳ විමර්ශන සිදු කිරීම සහ අවසානයේ එම ස්ථානය  අනුස්මරණය කිරීම සඳහා දායකවන  දේශීය හා ජාත්‍යන්තර නීතිමය ව්‍යුහයන් ස්ථාපිත කරයි. ගැටුම්වලින් පසු  සමාජයක්  තුළ මෙකී සමූහ මිනීවළවල් පිහිටි ස්ථාන කළමනාකරණය කිරීම සඳහා  න්‍යායික දෘෂ්ටිකෝණ  සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශ මත පදනම්ව යොදා ගත හැකි යහ භාවිතයන් තුන්වන කොටස තුළින් සාකච්ඡා කරයි. ඇමුණුම් ඔස්සේ, පාඨකයාට  සමූහ මිනීවළවල් සහිත ප්‍රසිද්ධ ස්ථාන (ඇමුණුම 1), අදාළ අන්තර් ජාතික සහ විදේශීය නීති පිළිබඳ න්‍යායන් හෝ දර්ශන. (ඇමුණුම 2), වාර්තාවට ඇතුළත් කර ඇති නීති (ඇමුණුම 3) සහ සමූහ මිනීවළවල් කළමනාකරණය සම්බන්ධයෙන්  රාජ්‍ය නොවන සංවිධාන විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ (ඇමුණුම 4) පිළිබඳව පාඨකයාට අවබෝධ කරගත හැක.

මෙම  මාතෘකාව පිළිබඳව වැඩිදුර පර්යේෂණ සිදුකිරීම සඳහා මූලික අඩිතාලම සකස් කර දීමට මෙකී වාර්තාව  උත්සාහ කරයි. එය කොළඹ ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන සමූහ මිනී වළවල් සම්බන්ධයෙන් සිදුකරන විශාල ව්‍යාපෘතියක එක් අංගයකි. ඉන් අනතුරුව එම මාතෘකාව පිළිබඳ වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කිරීමට සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමඟ සම්මන්ත්‍රණ පැවැත්වීමට අපේක්ෂා කෙරේ. සමූහ මිනීවළවල් පිළිබඳ සිදුකරන ලද  ශාස්ත්‍රීය අධ්‍යයන සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ක්‍රියාකාරීන් තර්ක කරන්නේ ශ්‍රී ලංකාවේ තිරසාර පශ්චාත් ගැටුම් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ගොඩනැගීම සඳහා පිළිගත හැකි, සතුටුදායක විමර්ශන සිදුකිරීම සහ මෙකී ස්ථාන අනුස්මරණය කිරීම වැදගත් බවයි. එහෙත් මෙම සමූහ මිනීවළවල්  සම්බන්ධයෙන් විශ්වාසදායක සහ තහවුරු කරන ලද තොරතුරුවල හිඟයක් පවතී. මෙම වාර්තාව දැනට පවතින තොරතුරු මධ්‍යගත  කර මෙකී සමූහ මිනීවළවල්  හා  අදාළ නීතිමය කරුණු ඒ හා සම්බන්ධ කරයි. මේ වන විට විමර්ශනය කර ඇති සමූහ මිනිවළවල් පිළිබඳ ඉතිහාසය පිළිබඳ අප මුලින්ම විමසා  බලමු.

## 2. ප්‍රධාන විමර්ශනයන් හා අදාළ අතීත සිදුවීම්

මිනීවළවල් 32 ක් ලැයිස්තුගත කර ඇතත්, කැණීම් කටයුතු සිදු කර ඇත්තේ සූරියකන්ද, චෙම්මනි, යාපනය, මාතලේ, කලවංචිකුඩි සහ මන්නාරමේ ස්ථාන දෙකක් ඇතුළුව ස්ථාන හතක පමණි. මෙම සමූහ මිනීවළවල් බිහිවීමට බොහෝ දුරට හේතු වූ සිදුවීම් පිළිබඳ කෙටි විශ්ලේෂණයකින් පසුව, එකී ස්ථාන සොයාගැනීමේ මොහොතේ සිට විමර්ශනය අවසන් කරන තෙක්, එකි ස්ථාන හත පිළිබඳ වෙන් වෙන් වශයෙන් මෙම කොටස අවධානය යොමු කරනු ඇත. ඇතැම් විමර්ශන කාලානුරූපව එකිනෙක හා සම්බන්ධ වන අතර, මෙම කොටස තුළින් මෙම ස්ථාන එකින් එක, ඒවා සොයාගැනීමේ කාලානුක්‍රමික අනුපිළිවෙලට පෙළ ගස්වනු ඇත. මෙම සමූහ මිනීවළවල් බිහිවීමට හේතු වූ විශේෂිත සිදුවීම් පිළිබඳ තොරතුරු විරල ය. මෙම එක් එක් ස්ථාන සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම නිසා, එක් එක් සමූහ මිනීවළ සම්බන්ධයෙන් එකම ආකරයෙන් විස්තර විධිමත්ව ඉදිරිපත් කිරීම දුෂ්කර විය. කතුවරයාට එක් රැස් කර ගැනීමට හැකි වූ දේ පමණක් මෙම කොටස තුළින් ඉදිරිපත් කරනු ඇත. එක් එක් ස්ථානය පිළිබඳ තොරතුරු වඩාත් විධිමත්ව පෙන්වා දීමට, ඇමුණුම 1 හි ඇති වගුව ප්‍රයෝජනවත් විය හැක. ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද සිතියම (ඉලංගමුව 2014) සාකච්ඡාවට ලක් කරන ස්ථාන හත සොයා ගැනීමට ඔබට උපකාරී වනු ඇත.




Source( Ilangamuwa" Nilantha' —Sri Lanka" the island of mass graves˜" Asian Human Rights Commission" 3 June මූලාශ්‍රය: ඉලංගමුව, නිලන්ත. "සමූහ මිනීවළවල් පිරුණු දූපත - ශ්‍රී ලංකාව", ආසියානු මානව හිමිකම් කොමිසම, ජූනි 3 2014, http://www.humanrights.asia/news/ahrc-news/AHRC-ART-043-2014/'

සමූහවළවල් සහිත මෙකී ස්ථාන, ඒවා අයත් මහා සන්දර්භය තුළ ස්ථානගත කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ කෙටි විමසා බැලීමක් සිදුකිරීම අවශ්‍ය වේ. 1983 සිට 2009 දක්වා වූ කාලය තුළ පැවැති ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය බොහෝ සමූල ඝාතන සිදු වූ අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක. සිවිල් යුද්ධය හා සම්බන්ධව ගොඩනැගුන ආඛ්‍යානය තුළ, නොගැලපෙන නමුත් දිවයිනේ සමූහ මිනීවළවල් බිහිවීමට හේතු වූ බවට සැක කෙරෙන සිදුවීම්වල ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රචණ්ඩකාරී පිපිරීම් කිහිපයක් ඇත. බොහෝ සිවිල් යුද්ධවලදී මෙන්, මෙම සිදුවීම් සම්බන්ධයෙන් ද සැබෑ තොරතුරු බොහෝ විට නොපැහැදිලි ය. එල්.ටී.ටී.ඊ සහ ශ්‍රී ලංකා රජය යන දැවැන්ත දෙබෙදුම තුළ එක් එක් ප්‍රජාව අතර සහ තුළ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ සංකීර්ණත්වය සැමවිටම යටපත් කළ නොහැක. එවැනි අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයන් පිළිබඳ උදාහරණ හතරක් පෙන්වා දීම විශේෂයෙන් ම වැදගත් වනු ඇත.

පළමුව, දිවයිනේ උතුරු හා නැගෙනහිර පළාත්වල දේශපාලන පිබිදීම අතරතුර, එල්.ටී.ටී.ඊ. සංවිධානය, දෙමළ මිනිසුන්ගේ නිදහස වෙනුවෙන් උද්ඝෝෂනය කරන අනෙකුත් දෙමළ කණ්ඩායම් සමඟ ගැටුම් ඇති කර ගැනීමට සම්බන්ධ විය. මෙය කණ්ඩායම් අතර ගැටුම් ඇති කිරීමට හේතු වූ අතර විශේෂයෙන් ම 1986 දී එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් විසින් තවත් කැරලිකාර කණ්ඩායමක් වන දෙමළ ඊළාම් විමුක්ති සංවිධානයේ (TELO) (Cronin-Furman and Arulthas 2021) සටන්කාමීන් 100 කට වැඩි පිරිසක් ඝාතනය කරන ලදී.

දෙවනුව, රට මැද සහ දකුණේ, 1987 සිට 1989 දක්වා කාලය තුළ මාක්ස්වාදී-ලෙනින්වාදී දේශපාලන කණ්ඩායමයට අයත් ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල බිහිවිය (මින් ඉදිරියට ජවිපෙ; 'මහජනතාවගේ විමුක්තිය සඳහා වූ පෙරමුණ ('Peoplezs Liberation Front'). එකී පක්ෂය ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ පුරවැසියන්ගෙන් සමන්විත වූ අතර එම කැරැල්ල රජයේ ආරක්ෂක අංශ විසින් ප්‍රචණ්ඩකාරී ලෙස මර්දනය කරන ලදී. මෙම සිදුවීම සූරියකන්ද සහ මාතලේ සමූහ මිනීවලවල් බිහිවීමේ ආරම්භය ලෙස සැලකේ.

ප්‍රචණ්ඩත්වයේ තුන්වන හේතු කාරණාව වන්නේ උතුරේ එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ මුස්ලිම් ජනතාව අතර දිගුකලක් තිස්සේ පැවති පීඩනයයි. මෙහි ප්‍රතිඵලය වූයේ 1990 උතුරු පළාතෙන් මුස්ලිම්වරුන් නෙරපා හැරීම සහ 1992 දී එල්.ටී.ටී.ඊ. හමුදාව විසින් පල්ලියගොඩැල්ල ගම්මානයේ ජීවත් වූ මුස්ලිම් ජනතාව අමානුෂික ලෙස ඝාතනය කිරීමයි (McGilvray and Raheem 2007).

හතරවනුව, එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ සාමය ගොඩනගා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය 1987 සිට 1990 දක්වා ඉන්දීය සාම සාධක හමුදාව යොදා ගැනීමයි. එය, උතුරු පළාතේ ඉන්දීය සාම සාධක හමුදාව සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සටන් රැසක් සිදු වූ කාල වකවානුවකි.

1992 වසරේ සිට ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළවල් පවතින බව මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් දැන සිටියහ (Human Rights Watch 1992, 6). කෙසේ වෙතත්, පළමු පරීක්ෂණ

කටයුතු ආරම්භ කරන ලද්දේ 1994 දී චන්ද්‍රිකා කුමාරතුංග රජය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) රට පාලනය කරන සමයේ දී ය (වික්‍රමසිංහ 2014, 165). ඇයගේ රජය සාමය ඇති කිරීම සඳහා පෙනී සිටි අතර 1988 සිට 1994 දක්වා සිදු වූ බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විවිධ වර්ගයේ විමර්ශන කොමිෂන් සභා හතරක් පිහිටුවන ලදී (වික්‍රමසිංහ 2014, 309). මෙකී කොමිෂන් සභා 1994 සිට 2000 දක්වා ක්‍රියාත්මක විය.[8] 1994 සහ 1997 අතර කාලය තුළ මෙකී කොමිෂන් සභාවලට අතුරුදන්වීම් 27,526ක් වාර්තා වී ඇති අතර, ඉන් 16,742ක් විමර්ශනය කර (සේනානායක 2018, 111) සමූහ මිනී වළවල් 12ක් ලැයිස්තුගත කරන ලදී.[9] ඔවුන්ගේ අවසන් වාර්තාව 1998 දී ප්‍රකාශයට පත් කරන ලදී. ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව සහ අනෙකුත් රජයේ වාර්තා පෙන්වා දෙන පරිදි 1998 සහ 2022 අතර කාලය තුළ තවත් සමූහ මිනීවළවල් 20 ක් හඳුනාගෙන ඇත.

රජයේ ක්‍රියාකාරීන් විසින් නිල වශයෙන් විමර්ශනය කරන ලද ප්‍රධාන සමූහ මිනීවළවල් පිළිබඳ ඉතිහාසය මෙම වාර්තාව ගැඹුරින් විමසා බලනු ඇත. එකී ස්ථාන සොයා ගත් දිනය මත පදනම් ව කාලානුක්‍රමිකව ඒවා ඉදිරිපත් කෙරේඃ 1994 දී සූරියකන්ද, 1998 දී චෙම්මනි, 1999 දී යාපනය දොරේඅප්පා ක්‍රීඩාංගණය, 2012 දී මාතලේ, 2014 දී කලවංචිකුඩි, සහ අවසාන වශයෙන් 2013 සහ 2018 දී මන්නාරම දිස්ත්‍රික්කයේ සමූහ මිනීවළවල් දෙකක්. මෙම ස්ථාන තෝරාගෙන ඇත්තේ මිනීවළවල්වල විශාලත්වය (හෝ කලවංචිකුඩි සිද්ධියේ දී සැක සහිත විශාලත්වය) මත පදනම්ව සහ ඒවා ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනවල සංකීර්ණත්වය පෙන්නුම් කරන බැවිනි. 2000 දී මිරුසුවිල් සහ 2020 දී මාන්කුලම් (ඇමුණුම 1 බලන්න) වැනි තවත් ස්ථාන කිහිපයක් ද විමර්ශනය කර ඇති අතර එකී විමර්ශන පහත අවස්ථා වලදී පෙන්වා ඇති ආකාරයට ම ඒ හා සමාන දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇත. සෑම උප කොටසකම මිනීවළ සොයාගත් ආකාරය, විමර්ශන කිරීම සඳහා ගෙන ඇති පියවර සහ ඒවායේ ප්‍රතිඵල වේ නම් ඒවා ද ඉදිරිපත් කර ඇත. වින්දිතයන් හඳුනා ගැනීමට හෝ මිනීවළ බිහිවීමට තුඩු දුන් සිදුවීම් පිළිබඳ පැහැදිලි ආඛ්‍යාන ස්ථාපිත කිරීමට හෝ වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව නඩු පැවරීමට බොහෝ විමර්ශන ගත් උත්සාහයන් අසාර්ථක වී ඇත. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා ඇති බාධක නානාවිධ වන අතර මෙම වාර්තාව පුරාවටම ඒවා ගවේෂණය කරනු ඇත.

මාතලේ සහ මන්නාරම සමූහ මිනීවළවල් සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ DNA රසායනාගාරය පරීක්ෂා කිරීමට ගිය බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම 2015 දී එක් ගැටළුවක් ගෙනහැර දැක්වීය. "ඇතැම් ආරක්ෂක සහ විමර්ශන නිලධාරීන්, විශේෂයෙන් ම අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) යැයි පෙනී සිටින

8 මෙම කොමිෂන් සභාවල කටයුතු පිළිබඳ වැඩි විස්තර සඳහා, හියුමන් රයිට්ස් වොච්, නැවත නැවත දකින බියකරු සිහිනය ඃ ශ්‍රී ලංකාවේ "අතුරුදහන්වීම්" සහ පැහැරගැනීම් සඳහා රාජ්‍ය වගකීම, 2008 මාර්තු 6, වෙළුම 20, අංක 2(C), 20 පිටුවේ බලන්නඃ https://www.refworld.org/docid/47d0fab62.html

9 වැඩි විස්තර සඳහා, ශ්‍රී ලංකාවේ තත්ත්වය, ස්වේච්ඡාවෙන් අතුරුදහන් වීමට එරෙහි ආසියානු සම්මේලනය, https://www.afad-online.org/voice/maiden_01/cs_srilanka.htm බලන්න.

නිලධාරීන්ගෙන් බිය ගැන්වීම්, තර්ජන, ලිංගික අපයෝජන සහ වෙනත් ආකාරයේ බලකිරීම් හෝ දැඩි සෝදිසියට ලක්වීම" වැනි සිද්ධීන් සිදුවූ බව ඔප්පු වී ඇති අතර ඒ තුළ හෙළිදරව් වන්නේ සමූහ මිනීවළවල් විර්ශනය කළ ආකාරය සම්බන්ධයෙන් පවතින ගැටළුය. ඕනෑම රාජ්‍ය ලේඛනාගාරයකට ප්‍රවේශ වීමට නිදහස ඇති සහ වළ දැමූ සිරුරු ගොඩගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය අධිකරණ වෛද්‍ය විශේෂඥතාව ඇතුළු තාක්ෂණික හැකියාවෙන් යුත්, අතුරුදහන් වූවන් සෙවීමේ වගකීම දරන ස්වාධීන ආයතනයක් පිහිටුවීමට එය නිර්දේශ කර ඇත.

එක්සත් ජාතීන්ගේ මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරනු ලැබුවේ අතුරුදහන් වූවන් සෙවීම සඳහා කැප වූ ආයතනයක් පිහිටුවීමේ පනත ශ්‍රී ලංකා කැබිනට් මණ්ඩලය අනුමත කිරීමට ටික වේලාවකට පෙරය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රවේශයන්හි වෙනසක් සනිටුහන් කරමින්, 2016 මැයි මාසයේදී පිහිටුවන ලද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (Office on Missing Persons (OMP)) ඉන්පසු සමූහ මිනීවළවල් විමර්ශනය කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරන ලදි. නීතිමය රාමු පිළිබඳ 3 වන වගන්තියෙන් එහි කාර්යභාරය තවදුරටත් පරීක්ෂා කරනු ඇත. 2016 දී එය ස්ථාපිත කිරීමට අනුව, OMP ක්‍රියාකාරීව දායක වූයේ මෙම වාර්තාවේ විශ්ලේෂණය කරන ලද අවසන් සමූහ මිනීවළ විමර්ශනයේදී පමණි, එනම් 2018 දී සොයා ගන්නා ලද මන්නාරම දිස්ත්‍රික්කයේ දෙවන මිනීවළයි.

ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළවල් හා සම්බන්ධ විමර්ශනයන්හි ඉතිහාසය ගවේෂණය කිරීම, පහත කොටසේ දක්වා ඇති නීතිමය ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමට ඇති අභියෝග සහ බාධාවන් තේරුම් ගැනීමට උපකාරී වනු ඇත.

**සූරියකන්ද (1994)**

1994 දී ශ්‍රී ලංකා රජය විසින් ඇඹිලිපිටිය නගරයට ආසන්නව පිහිටි, සූරියකන්ද නම් වූ ගම්මානයේ කන්දක් මත ලංකා විදුලිබල මණ්ඩලයේ කුළුණක් සවි කිරීමේ ව්‍යාපෘතියක් පිළිබඳ නිවේදනයක් නිකුත් කරන ලදි. නිර්නාමික සාක්ෂිකරුවෙකු විසින්, මාධ්‍යවේදී වික්ටර් අයිවන් සහ දේශපාලඥ එස්.බී දිසානායක (එවකට විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී) අමතමින් මෙම කන්දේ (බෝර්හම් සහ ආරච්චි 2018) සමූහ මිනීවළක් පිහිටා ඇති බවට හෙළිදරව්වක් කරන ලදි.

1994 ජනවාරි මාසයේ දිනක දේශපාලනඥයින් සහ මාධ්‍යවේදීන් කණ්ඩායමක් ඒ පිළිබඳ විමසා බැලීමට එම ස්ථානයට ගොස් ඇත. එහි තිබී මිනිස් සිරුරුවලට අයත් ඇටකටු සොයා ගැනීමෙන් පසු, ඔවුන් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයට (Borham and Arachchi 2018) එකී සිද්ධිය වාර්තා කරන ලද අතර, එහි නිල කැණීම් ආරම්භ කරන ලෙස උසාවිය විසින් නියෝග කරන ලදි. සමූහ මිනීවළවල් සහිත මෙම ස්ථානය පිළිබඳ ආරංචිය පැතිර යාමත් සමඟම ගමේ මිනිසුන් සහ කලාපයේ වෙසෙන අතුරුදහන් වූවන්ගේ දෙමාපියන් එම ස්ථානයට රොක් විය. සන්ඩේ ඔබසවර් පුවත්පතට අනුව, එය සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නිල වශයෙන් සිදුකළ පළමු කැණීමයි ( බෝර්හම් සහ ආරච්චි 2018). අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් කැණීම

අධීක්ෂණය කළද, එම ස්ථානය මහජනතාවගෙන් ආරක්ෂා කර නොතිබූ බැවින්, බොහෝ පිරිසක් කැණීම සඳහා සහභාගි වූ අතර හඳුනාගන්නා සාක්ෂිවලට හානි නොවන පරිදි නිසි ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමක් එහි සිදුනොවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ඇටසැකිලි ගොඩට ගෙන ඒවායේ වූ ඇඳුම් ඉවත් කිරිම නිසා ඒවා හඳුනාගැනීමට එය බාධාවක් විය.

එකී සමූහ මිනීවළේ සිරුරු 300 ක් පමණ තිබූ බව විමර්ශනයෙන් ඇස්තමේන්තු කෙරිණ (ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භාවිතයන් පිළිබඳ එක්සත් ජනපදයේ වාර්තාව 1994). මියගිය අයගේ අනන්‍යතාවය සිංහල පුරවැසියන් බවට තහවුරු කරන ලද අතර ජනතා විමුක්ති පෙරමුණේ මාක්ස් ලෙනින්වාදීන්ගේ කැරැල්ල සිදුවූ 1987 සහ 89 අතර කාලයේ මෙම සමූහ මිනීවල නිර්මානය වී ඇති බවට තහවුරු විය. 1989 සහ 1990 වසරවල රාජ්‍ය නියෝජිතයන් විසින් පැහැරගෙන ගොස් ඝාතනය කරන ලද ඇඹිලිපිටියේ පාසල් සිසුන් 48 දෙනෙකුගේ සිරුරු මෙම මිනීවළේ තිබූ බවට ද විමර්ශන සිදුකරන අවස්ථාවේ විශ්වාස කෙරිණ.

කෙසේ වෙතත්, විමර්ශනය නතර කරන ලද අතර මළ සිරුරු හඳුනා ගැනීමට නොහැකි විය (ඇඹිලිපිටිය අතුරුදහන් වූ පාසල් දරුවන්ගේ දෙමාපිය සංවිධානය, 2022). ඇඹිලිපිටියේ සිදුවීම පිළිබඳ මෑතකාලීනව සිදුකරන ලද පර්යේෂණවලින් පෙනී යන්නේ දරුවන්ගේ සිරුරු මිහිදන් කර ඇත්තේ සූරියකන්ද ප්‍රදේශයේ නොව, තරුණයන් බලහත්කාරයෙන් අතුරුදන් කළ (ඇඹිලිපිටියේ අතුරුදන් වූ පාසල් දරුවන්ගේ දෙමාපිය සංවිධානය 2022) ස්ථානයට ඉතා ආසන්නව පිහිටි තේක්ක කැලේ නම් වූ ස්ථානයක බව ය. මළ සිරුරු කාගේ ද යන්න පිළිබඳ පැහැදිලි බවක් නොතිබුණ ද, සූරියකන්ද විමර්ශනය මගින් බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලට සම්බන්ධ බවට සැක කෙරෙන අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම කඩිනම් කරන ලදි. සිසුන් 25 දෙනෙකු ඝාතනය කිරීම, පැහැරගෙන යාම සහ කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් විද්‍යාලයේ විදුහල්පතිවරයා සහ හමුදා සෙබළුන් හය දෙනෙකු වැරදිකරුවන් වූ අතර ඔවුන්ට වසර 10 ක සිරදඬුවමක් (Hoole 2014) නියම කරන ලදී.

එම ස්ථානය අවට ආරක්ෂාව නොමැතිකම හේතුවෙන් අවසන් අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයකින් තොරව පරීක්ෂණය නතර කිරීමට අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් තීරණය කරන ලදි. බොහෝ ඇටසැකිලි තවමත් හඳුනාගෙන නොමැත. දේශපාලනඥ එස්.බී. දිසානායකට අනුව, 1994 සිදුකළ විමර්ශනය තුළ වූ දේශපාලන පසුබිම මෙයට හේතු වූ බවයි. ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් කෙරෙහි අවධානය යොමු කරනවාට වඩා සිංහල ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීමට සම්බන්ධ අධිකරණ විරෝධී ඝාතන සිදුකිරීමේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ වරද හෙළි කිරීම එහි එක් අරමුණක් බව ඔහු කියා සිටියේය (බෝර්හම් සහ ආරච්චි 2018). මහේස්ත්‍රාත්වරයා වෙත දැනුම් දෙන ලද දේහ හමුවූ ස්ථාන කවරේ ද යන්න මහජනතාවට හෙළි නොකළ අතර බොහෝ පවුල්වලට අතුරුදහන් වූ තම ඥාතීන් හඳුනා ගැනීමට නොහැකි විය. 1995 දී විමර්ශන කටයුතු නතර කිරීමෙන් පසු ඒ පිළිබඳව

තවදුරටත් කිසිවක් වාර්තා නොවීය.[10] අද, එම ස්ථානයේ ස්මාරක සලකුණක් නොමැති අතර කඳු මුදුනේ විවිධ විදුලි සංදේශ සමාගම්වලට අයත් කුළුණු පමණක් ඉතිරිව ඇත (Borham and Arachchi 2018).

**චෙම්මනි (1998)**

1998 වසරේ හිටපු හමුදා නිලධාරියෙකු වූ සෝමරත්න රාජපක්ෂගේ වාචික සාක්ෂිය හරහා චෙම්මනි සමූහ මිනීවළ ප්‍රසිද්ධියට පත් විය. 1998 දී, ක්‍රිෂාන්ති කුමාරස්වාමි නම් තරුණ දෙමළ දැරිය දූෂණය කර මරා දැමීම සහ 1996 දී සිදු වූ ඇගේ පවුල (බාලා 2017) ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඔහුට සහ තවත් සොල්දාදුවන් අට දෙනෙකුට මරණ දණ්ඩනය නියම විය. නඩු විභාගය අතරතුර, රාජපක්ෂ කියා සිටියේ 1996 දී ආරක්ෂක අංශ විසින් මිහිදන් කරන ලද දෙමළ පුරවැසියන්ගේ මළ සිරුරු 400ක් පමණ ඇතුළත් සමූහ මිනීවළවල් චෙම්මනි ගම්මානය ආසන්නයේ පවතින බව ඔහු දැන සිටින බවයි. (ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භාවිතයන් පිළිබඳ එක්සත් ජනපද ජාතික වාර්තාව 1999). රජයේ ආරක්ෂක අංශ විසින් යාපනය අර්ධද්වීපය එල්.ටී.ටී.ඊ. පාලනයෙන් යළි මුදවා ගැනීමත් සමඟ මෙය සිදු වූ බව පැවසේ (Human Rights Watch 2008).

එම චෝදනාව පොලීසිය විසින් විභාග කරන බව සහ අධිකරණ වෛද්‍ය විශේෂඥයින් එකී ස්ථාන වෙත ගොස් ඒවා පරීක්ෂා කරන බව 1998 ජූලි මාසයේදී ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිවේදනය කරන ලදි. 1999 ජනවාරි මාසයේදී නීතිපතිවරයා විසින් චෙම්මනි සමූහ මිනීවළවල් හි මිහිදන් කර ඇති සිරුරු ගොඩගැනීම් සඳහා ඉල්ලීමක් ගොනු කළද, ගොඩගැනීම් වහාම ආරම්භ වූයේ නැත. රජයට එල්ල වන දේශීය හා ජාත්‍යන්තර බලපෑම හේතුවෙන්, 1999 මාර්තු මාසයේදී රජයේ විශේෂඥයින් විසින් සාම්පල එකතු කිරීම සඳහා මෙම ස්ථානයට ගොස් ඇත (එක්සත් ජනපද ශ්‍රී ලංකා වාර්තාව 1999). අපක්ෂපාතීව එය සිදුකිරීමට සහ ඕනෑම සාක්ෂියක් අධිකරණයේ පිළිගත හැකි ආකාරයට ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව චෙම්මනි හි ගොඩගැනීම් සිදුකරන ලෙස ඉල්ලා ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය විසින් 1999 දි ප්‍රකාශයක් නිකුත් කරන ලදි (ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය 1999)

1999 ජූනි මාසයේදී, ජාත්‍යන්තර නිරීක්ෂකයින් සමඟ කැණීම් කටයුතු ආරම්භ කරන ලදි. එහිදි පුද්ගලයන් දෙදෙනෙකුගේ ඇටසැකිලි සොයා ගන්නා ලද අතර පසුව ඒවා 1996 දී අතුරුදහන් වූ දෙමළ මිනිසුන් දෙදෙනෙකුගේ ඇටසැකිලි ලෙස හඳුනා ගන්නා ලදී. 1999 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවලදී සිරුරු 120 ත් 140 ත් අතර ප්‍රමාණයක් භූමදාන කිරීමට ඔවුන්ට නියෝග කරන ලද විවිධ ස්ථාන 16 ක්, කුමාරස්වාමි නඩුවේ වරදකරුවන් වූ සොල්දාදුවන් 9 දෙනාගෙන් පස් දෙනෙක් පෙන්වා දුන්හ. කැණීම් වලදී තවත් සිරුරු 13ක් සොයා ගන්නා ලදී. 1999 දෙසැම්බරයේ ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය අධිකරණ වෛද්‍ය වාර්තාවෙන් හෙළිදරව්

[10] ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භාවිතයන් පිළිබඳ එක්සත් ජනපද ජාතික වාර්තාවල, මෙම සිද්ධිය සම්බන්ධයෙන් 1995 සිට 1999 දක්වා සෑම වසරකම සඳහන් වන්නේ කිසිදු ප්‍රගතියක් ලබා නොමැති බවය. ඉන් පසුව ඒ ගැන කිසිදු සඳහනක් කර නැත.

වූයේ පුද්ගලයන් 10 දෙනෙකු ශාරීරික පහරදීම් සහ ඝාතනය කරන ලද බවට පැහැදිලි සලකුණු පෙන්නුම් කරන බවට සහ අනෙක් තිදෙනාගේ මරණයට හේතු වූ කාරණා තීරණය කර නොමැති බවයි. සොයාගත් මුළු සිරුරු 15 න් 13 ක් තවමත් හඳුනාගෙන නොමැත. චෙම්මනි හි නීති විරෝධී ඝාතනවලට වගකිව යුතු යැයි කියනු ලබන ආරක්ෂක හමුදා නිලධාරීන් 20 දෙනෙකුගේ නම් කුමාරස්වාමි නඩුවේ වරදකරුවන් වූ සොල්දාදුවන් නව දෙනා විසින් හෙළිදරව් කරන ලදි. මෙම පුද්ගලයන්ට එරෙහිව මූලික චෝදනා ගොනු කරන ලද අතර නීතිපතිවරයා ප්‍රකාශ කළේ ඝාතනවලට සම්බන්ධ අයගේ අනන්‍යතාව තහවුරු කිරීමට රජයට සිදුවන බවයි (එක්සත් ජනපද ශ්‍රී ලංකා වාර්තාව 1999). කෙසේ වෙතත්, එම චෝදනාවලට ප්‍රතිචාර වශයෙන් කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැත.

කුමාරස්වාමි නඩුවේ වරදකරුවන් වූ රාජපක්ෂ ඇතුළු සොල්දාදුවන් නව දෙනාගෙන් හතර දෙනෙකුට මරණ දණ්ඩනය නියම විය, තිදෙනෙකු නිදොස් කොට නිදහස් කරන ලදී, එක් අයෙකු මිය ගියේය (සෝමරත්න රාජපක්ෂ සහ අනෙක් අයට එදිරිව ගරු නීතිපති, 2003). චෙම්මනි සමූහ මිනීවල නිර්මාණයට සම්බන්ධ යැයි කියන අපරාධකරුවන්ගේ නම් ඔවුන් විසින් ඉදිරිපත් කර තිබුණ ද එම තොරතුරු මහජනතාවට ලබාදී නොතිබුණි. තවද, යාපනයේ දී රජයේ හමුදා විසින් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන්ගේ අතුරුදන්වීම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා 1996 දී ස්ථාපනය කරන ලද ආරක්ෂක අමාත්‍යාංශයේ විමර්ශන මණ්ඩලය එහි වාර්තාව ප්‍රසිද්ධියට පත්කර නැත (බෝපගේ 2017). මෙමගින් රාජපක්ෂ සහ ඔහුගේ සෙසු සොල්දාදුවන් විසින් සඳහන් කරන ලද බලහත්කාර අතුරුදහන් කිරීම් සහ නීත්‍යානුකූල නොවූ ඝාතන පිළිබඳ තොරතුරු තහවුරු කිරීම වැළකුණි.

"අවසන් නොකළ කැනීම්, අවිනිශ්චිත DNA පරීක්ෂණ සහ දේශපාලන ප්‍රතිරෝධය" මත ඉතිරි සිරුරු 13 හඳුනා නොගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් 2006 දී, ආසියානු මානව හිමිකම් කොමිසම චෝදනා කළේය (ආසියානු මානව හිමිකම් කොමිසම 2006). ආරක්ෂක හමුදා සාමාජිකයන්ට එරෙහි මූලික චෝදනා කිසිදු නඩු පැවරීමකට තුඩු නොදුන් අතර විමර්ශනය 2006 වන විට ඇනහිට තිබුණි (BBC සිංහල පුවත් 2006). මෙම සමූහ මිනීවළ නිල වශයෙන් අනුස්මරණය නොකෙරේ.

**යාපනය දොරේඅප්පා ක්‍රීඩාංගණය (1999)**

1999 මාර්තු මාසයේ දී යාපනයේ දොරේඅප්පා ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා සිදුකළ කැණීම් කටයුතු වලදී නගර සභාවේ සේවය කළ සේවකයින් විසින්, පුද්ගලයන් කිහිප දෙනෙකුගේ අස්ථි කොටස් සොයා ගන්නා ලදී (බෝපගේ 2017, 30). ප්‍රාදේශීය පොලිස් බළකාය 1999 අප්‍රේල් 7 වන දින මෙම ස්ථානය විමර්ශනය කරන ලද අතර ඊළඟ මැයි මාසයේදී කැණීම් කටයුතු සිදු කරන ලදී. යාපනයේ දිසා විනිසුරුවරයෙකු සහ අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු (JMO) ඉදිරිපිට මෙම කැණීම් සිදු කර ඇත. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භාවිතයන් පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2000 ජාතික වාර්තාවට අනුව, අධිකරණ වෛද්‍ය සාක්ෂි පෙන්වා දෙන්නේ මෙම අස්ථි කොටස්

වසර 10 ක් පමණ පැරණි බවයි. ඒ වන විට ඉන්දීය සාම සාධක හමුදාව යාපනය පාලනය කරමින් සිටි අතර මෙම සොයා ගැනීම නිසා ඔවුන් සම්බන්ධයෙන් සැකයක් මතුවිය (ශ්‍රී ලංකාවේ මානව හිමිකම් භාවිතයන් පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ජාතික වාර්තාව 2000).

1987 (ඉක්බාල් 2010) ඉන්දීය සාම සාධක හමුදාව උතුරු පළාත පාලනය කරන සමයේ ඝාතනයට ලක් වූ ද්‍රවිඩ වින්දිතයන්ගේ ඇටසැකිලි බවට සැක කෙරෙන සිරුරු 49ක් විවිධ කැණීම් තුනකින් අනාවරණය විය. කෙසේ වෙතත්, විපතට පත් වූවන්ගේ අනන්‍යතාවය තීරණය කිරීමට උපකාර කිරීම සඳහා ප්‍රජාවගේ මැදිහත්වීම අඩු විය. යාපනය පදනම් කරගත් සිවිල් සමාජ කණ්ඩායමක් වූ මානව හිමිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු තර්ක කළේ කෙටි කාලයක් තුළ විවිධ කණ්ඩායම් මෙම භූමිය අත්පත් කර ගෙන සිටි බැවින් අපරාධකරුවන් හඳුනා ගැනීමට කිසිදු උත්සාහයක් ගෙන නොතිබූ බවයි. ඉන්දීය සාම සාධක හමුදාව 1989 අවසානය දක්වා එහි සිටි අතර, එල්.ටී.ටී.ඊ. සංවිධානය 1990 සැප්තැම්බර් සිට 1995 ඔක්තෝබර් දක්වා ප්‍රදේශය පාලනය කළ අතර පසුව ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කරන ලදී (UTHR විශේෂ වාර්තාව 1999). 1999 දී හඳුනා ගැනීම සඳහා ඇටකටු කොළඹට යවන ලද නමුත් රජයේ නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් වැඩිදුර ප්‍රකාශ නිකුත් නොකරන ලදි (Associate Pres 1999). සමූහ මිනීවළ ගැන නිල සඳහනක් නොමැතිව එම ස්ථානය මේවන විට දොරේඅප්පා ක්‍රීඩාංගණය ලෙස භාවිතා වේ. එය දැන් යාපනය අර්ධද්වීපයේ ක්‍රීඩා පිටියක් වන අතර විවිධ ක්‍රියාකාරකම් සඳහා එය භාවිතා වේ.

**මාතලේ (2012)**

යාපනයේ දොරේඅප්පා ක්‍රීඩාංගනයේ සමූහ මිනීවළ සොයා ගැනීම හා සමාන ආකාරයෙන්, 2012 වසරේ මුල් භාගයේදී මාතලේ මහ රෝහලට මුල්ගල තැබීමේදී, ඉදිකිරීම් කටයුතු වල නිරතව සිටි කම්කරුවන් විසින් මාතලේ (මධ්‍යම පළාත) සමූහ මිනීවළ සොයා ගන්නා ලදී. 2012 නොවැම්බර් මාසයේදී මහේස්ත්‍රාත් විනිසුරුවරිය චතුරිකා ද සිල්වා විසින් එම ස්ථානයේ කැණීම් කටයුතු සිදුකරන ලෙස නියෝග කරන ලදී (බෝපගේ 2017). අධිකරණ වෛද්‍ය නිලධාරී අජිත් ජයසේන මහතා සහ අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාඥ රාජ් සෝමදේව මහතා විසින් මෙම ස්ථානය අධීක්ෂණය කරන ලදී. සොයාගත් මිනිස් අස්ථි කොටස් මත පදනම්ව, සෝමදේව මෙම ස්ථානය 1986 සහ 1990 අතර කාලයේ බිහිවූවක් ලෙස නිර්ණය කළ අතර එය ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල ඇති වූ කාලයට අනුරූප වේ. මෙම ස්ථානය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් කැරැල්ල ප්‍රචණ්ඩකාරී ලෙස මර්දනය කිරීමට භාවිතා කළ කේන්ද්‍රස්ථානයක් විය (අල්-ජසීරා 2013). ඇටසැකිලි කිහිපයක හිස ගසා දැමීම, කැබලි කිරීම සහ හඳුනාගැනීමට නොහැකි වනසේ විකෘති කිරීම ඇතුළු වධහිංසාවන්ට ලක්කිරීමේ සහ දරුණු ප්‍රචණ්ඩත්වයේ සලකුණු තිබූ බව අධිකරණ වෛද්‍ය වාර්තාව හෙළි කරයි. ඇටසැකිලි ස්ථර දෙකක ස්ථානගත කිරීමෙන් ද එම ස්ථානය සුසාන භූමියකට වඩා සමූහ මිනීවළක් බව පෙන්නුම් කළේය (සෝමදේව 2013). 2013 පෙබරවාරි වන විට පුද්ගලයින් 154 දෙනෙකුගේ දේහයන් ගොඩගෙන ඇති අතර එය රටේ දකුණින් සොයාගත් විශාලතම සමූහ මිනීවළ බවට පත් විය.

සමූහ මිනීවළ කැණීමෙන් පසු විනිසුරුවරිය ද සිල්වා 2013 මාර්තු මාසයේදී සාක්ෂිකරුවන්ට පෙනී සිටින ලෙස ඉල්ලා සිටියාය. ඇතැමුන් කියා සිටියේ එම ස්ථානය ශ්‍රී ලංකා යුධ හමුදාවේ ගජබා රෙජිමේන්තුව විසින් මිනිසුන් වධ හිංසාවන්ට  ලක් කළ ස්ථානයකට ආසන්න බවයි. එම ස්ථානයේ ඥාතීන් මිහිදන් කර ඇති බව කියන පවුල් 13කට ජනතා විමුක්ති පෙරමුණේ නීතීඥයින් සහය වූ අතර, ශ්‍රී ලංකා නීතිඥ සංගමය ද මැදිහත් විය (Bala 2017). සෝමදේවගේ වාර්තාවේ නිර්දේශය මත ඇතැම් අස්ථි කොටස් එක්සත් ජනපදයේ බීටා ඇනලිටික් ඉන්කෝපරේෂන් නම් රසායනාගාරයට රේඩියෝ කාබන් පරීක්ෂණය සඳහා යවන ලදී. සාම්පල යවා ඇත්තේ මෙම සාක්ෂිය හා මූලික වූ  අනුපිළිවෙලින් වාර්තා කරන ලද කාලානුක්‍රමික ලියකියවිලි කිසිවක් නොමැතිවය. 2014 නොවැම්බරයේදී අපරාධ විමර්ශන වාර්තාව අධිකරණයට දන්වා සිටියේ බීටා ඇනලිටික් ඉන්කෝපරේෂන් ප්‍රතිඵල මගින් සාම්පල 1950 ට පෙර (රත්නවල්ලි 2014) අයිති එකක් බව පෙන්නුම් කරන බවයි. මහාචාර්ය සෝමදේව සාක්ෂි දෙමින් කියා සිටියේ අදාළ ස්ථානය හොඳින් ආරක්ෂා කර නොතිබීමත්, වර්ෂා ජලයෙන් දෙවරක් පිරී තිබීමත් නිසා සාම්පල අපවිත්‍ර වන්නට ඇති බවයි. බීටා ඇනලිටික් ඉන්කෝපරේෂන් හි ප්‍රතිඵල තහවුරු කර ගැනීම සඳහා එකී සාම්පල වෙනත් රසායනාගාරයකට ද යවා නොමැත.

2013 ජූනි මාසයේදී එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් මෙම සමූහ මිනීවළ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිසමක් පිහිටුවන ලදී (කොළඹ ටෙලිග්‍රාෆ් 2013 ජූනි 22). බීටා ඇනලිටික් ඉන්කෝපරේෂන් හි ප්‍රතිඵලවලට පක්ෂව මහාචාර්ය සෝමදේවගේ සාක්ෂිය නොසලකා හරින ලද ජනාධිපති කොමිසම 2015 දී නඩුව නීතිපති කාර්යාලයට මාරු කරන ලදි. අතුරුදහන් වූවන්ගේ පවුල් සමූහයේ සභාපති බ්‍රිටෝ ප්‍රනාන්දු පවසන්නේ ක්‍රියාකාරීන් සෑම දිනකම උසාවිය ඉදිරිපිට විරෝධතා දැක්වූ බවත් වින්දිතයන්ගේ පවුල්වලින් දිවුරුම් ප්‍රකාශ එකතු කර ගත් බවත්ය. ද සිල්වා විනිසුරුවරිය  මෙම ලිපි ලේඛන සහ විරෝධතාවන්ට  එකඟතාවක් පෙන්වා ඇත. කෙසේ වෙතත්, නඩුව නීතිපති කාර්යාලයට මාරු කළ පසු, ද සිල්වා විනිසුරුවරිය නිෂ්ප්‍රභා කර නව විනිසුරුවරයෙකු පත් කරන ලද අතර ඔහු විසින් විරෝධතා පිළිනොගත් අතර ක්‍රියාකාරීන් විසින් ගොනු කරන ලද දිවුරුම් ප්‍රකාශ සලකා බැලීම ප්‍රතික්ෂේප කරන ලදි (බ්‍රිටෝ ප්‍රනාන්දු 2022). ගෝඨාභය රාජපක්ෂගේ මැදිහත්වීම මත ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම මැඩලීම සඳහා විමර්ශන අවසන් කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිසමට ද කැමැත්තක් තිබූ බව ද කොළඹ ටෙලිග්‍රැෆික් පුවත්පත වාර්තා කරයි (කොළඹ ටෙලිග්‍රාෆ්, 2013 ජූනි 22). 2015 වසරේදී කොමිසම විසින් ඉන්පසුව බලයට පත් වූ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ ද එය ප්‍රසිද්ධියට පත් නොකළ අතර ඉන් අනතුරුව නඩුව අවසන් විය. මෙම ස්ථානය පිළිබඳ නිල ස්මාරකයක් නොමැත, නමුත් ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව මෙම සමූහ මිනීවළට ආසන්නව වෙසක් දින සැමරුමක් ඉදිරිපත් කරමින් මෙම ස්ථානය සැමරීමට උත්සාහ කර ඇත (කොළඹ ටෙලිග්‍රාෆ්, 2013 මැයි 24). 2022 දී මෙම වාර්තාව ලියන අවස්ථාව වන විටත් එකී සැමරුම් සිදුවෙමින් පවතී ද යන්න  අවිනිශ්චිත ය.

**කලවංචිකුඩි (2014)**

2014 දී කලවංචිකුඩි (නැගෙනහිර පළාත) හි පදිංචිකරුවෙකු විසින් මුස්ලිම් වින්දිතයින් 100 දෙනෙකුගේ පමණ අස්ථි කොටස් (බැංකොක් පෝස්ට් 2014) ඇති බවට ඔහු ප්‍රකාශ කළ ස්ථානයක් විමර්ශනය කරන ලෙස ප්‍රාදේශීය අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදි. 1990 ජූලි 12 වැනි දින කල්මුණේ සිට එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයින් පිරිසක් විසින් කුරුක්කල්මඩම් වෙරළ තීරයේ දී තම භාරයට ගෙන ඝාතනය කරන ලද පුරවැසියන් 168 දෙනාගේ සිරුරු මෙම ස්ථානයේ ඇති බවට ද සැක කෙරේ (Business Standard 2014).

කැණීම් කිරීමේ නියෝගය කලවංචිකුඩි කලාපීය මහේස්ත්‍රාත් ඒ.එම්.රිහාල් විසින් නිකුත් කරනු ලැබුව ද නඩුව අධීක්ෂණය කරනු ලැබුවේ විනිසුරු අබ්දුල් ගෆූර් විසිනි. කැණීම මුලින් ආරම්භ කිරීමට නියමිතව තිබුණේ 2014 ජූලි 01 වැනිදා වන අතර, අධිකරණ වෛද්‍ය විශේෂඥයන් (Bala 2017) එක්රැස් කිරීමට තවත් කාලයක් අවශ්‍ය බව පොලීසිය විසින් ප්‍රකාශ කළ බැවින් 2014 නොවැම්බර් 24 වැනිදාට එය කල් දමන ලදී. සමූහ මිනීවළ පිහිටා ඇත්තේ දෙමළ ජනතාව ජීවත්වන ප්‍රදේශයක බැවින්, වින්දිතයන්ගේ හඳුනාගත හැකි අනන්‍යතා පිළිබඳ වාචික සාක්ෂි බෙදා ගැනීමට දෙමළ පුරවැසියන් දිරිමත් කිරීමට ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධායකයෝ කටයුතු කළහ (Bala 2017). 2018 වන විට විනිසුරු ගෆූර් විසින් නැවත වරක් අස්ථි කොටස් ගොඩගැනීම සහ ඒ පිළිබඳ වැඩිදුර විමර්ශන කල් දමන ලදි. මෙම තීරණයට හේතුව ලෙස දක්වා ඇත්තේ සමූහ මිනීවළවල් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර වඩා හොඳ සංවාදයක් අවශ්‍ය වන අතර එමගින් වින්දිතයින් හඳුනා ගැනීමට වඩාත් පහසුකම් සැලසිය හැකි බවයි (Bala 2017). 2022 අගෝස්තු මාසය වන විටත් විමර්ශන ආරම්භ කර නොතිබුණි.

**මන්නාරම (2013)**

2013 වසරේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉදිකිරීම් සේවකයින් විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ (උතුරු පළාතේ) තිරුකේතීස්වරම් ගම්මානයේ සුප්‍රසිද්ධ විහාරස්ථානයක් අසල නව ජල නලයක් සවිකරමින් සිටියදී මිනිස් අස්ථි කොටස් සොයා ගන්නා ලදී. 2013 දෙසැම්බර් සහ 2014 මාර්තු අතර කාලය තුළ විවිධ අදියරයන් යටතේ මෙම ස්ථානයේ කැණීම් සිදු කරන ලදී. එහිදී පුද්ගලයන් 83 දෙනෙකුගේ අස්ථි කොටස් සොයා ගන්නා ලදී (එක්සත් ජනපද ජාතික වාර්තාව 2016).

රජයේ ක්‍රියාකාරීන් විසින් උපකල්පිතයන් කිහිපයක් ඉදිරිපත් කරන ලදී. 2014 මාර්තු මාසයේදී රජයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සෙනරත් දිසානායක "සිරුරු විධිමත් ආකාරයට වළදමා ඇත" යන්න වාර්තා කළේ එම ස්ථානය සැබවින්ම වසර 50ක් පමණ පැරණි සොහොන් බිමක් බව අඟවමින් ය (Aneez 2014). ගම්මානයේ ඓතිහාසික සැලසුම් කිසිවිටෙක සොහොන් බිමක පැවැත්මක් පෙන්නුම් නොකළ බැවින් මෙය පසුව මතභේදයට ලක් විය (Groundviews 2014). තවද, ප්‍රාදේශීය අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා ප්‍රමුඛ අධිකරණ වෛද්‍ය විශේෂඥයින් කණ්ඩායමක් ප්‍රකාශ කළේ, මළ සිරුරු එම ස්ථානයේ ස්තර කිහිපයක මිහිදන් කර තිබුණේ සුසාන භූමියකට සමාන නොවන ආකාරයකට බවයි (වීරසිංහම් 2014).

මෙම මරණ එල්.ටී.ටී.ඊ. සංවිධානය හෝ ඉන්දීය සාම සාධක හමුදාව විසින් සිදු කරන ලද බව හිටපු රාජපක්ෂ රජය විසින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලදි (එක්සත් ජනපද ජාතික වාර්තාව 2016). ඊට සමගාමීව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන දෙමළ පක්ෂය වන දෙමල ජාතික සන්ධානය (ටී.එන්.ඒ.) සමූහ මිනීවළ පිළිබඳ ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා සිටිය නමුත් (වීරසිංහම් 2014), එම ඉල්ලීම ඉටු නොවීය.

2014 අගෝස්තු මාසයේදී මෙම සමූහ මිනීවළ අසල අතහැර දමා තිබූ ළිඳක තිබී අස්ථි කොටස් සොයා ගන්නා ලදී. මානව හිමිකම් විශේෂඥයන් සිය කනස්සල්ල පළ කළේ, අධිකරණ වෛද්‍ය පරීක්ෂණයක් සැලසුම් කර තිබියදී, සොයාගැනීම පිළිබඳ වාර්තා වීමට පෙර සම්පල දූෂණය විය හැකි බැවින් සහ ඇතැම් සිරුරු පස් හාරා ඉවතට ගන්නා යන්ත්‍ර මගින් කැබලි කර තිබූ බැවින් "රජය විසින් භාවිතා කරන ලද කැණීම් ක්‍රම මගින් අර්ථවත් අධිකරණ වෛද්‍ය විශ්ලේෂණයක් සිදු කළ නොහැකි බවයි". (එක්සත් ජනපද ජාතික වාර්තාව 2016). තවත් මළ සිරුරු බොහෝමයක් හමුවූ තවත් ස්ථානයක් ඒ අසලින් සොයා ගන්නා තෙක් විමර්ශන නතර කරන ලදි (Haviland 2014).

**මන්නාරම (2018)**

2018 මැයි මාසයේදී මන්නාරම නගරයේ ඉදිකිරීම් ස්ථානයක තවත් සමූහ මිනීවළක් සොයා ගන්නා ලදී. මන්නාරමේ A14 මහා මාර්ගයට යාබදව (විජේසිංහ 2018) සතොස නමින් හැඳින්වෙන රජය සතු තොග සහ සිල්ලර වෙළෙඳ ජාලයක් පුළුල් කිරීමට ඉඩම හාරමින් සිටියදී කම්කරුවන් පිරිසක් විසින් 2018 මැයි 28 වැනි දින ප්‍රථම වරට මිනිස් අස්ථි කොටස් සොයා ගන්නා ලදී.

අතුරුදහන් වූවන්ගේ ඥාතීන් වෙනුවෙන් පෙනී සිටින නීතිඥයින් සැක කළේ එම අස්ථි කොටස් රාජ්‍ය ආරක්ෂක අංශ විසින් පැහැරගෙන ගොස් වධ දී මරා දමන ලද දෙමළ ජාතිකයින්ගේ බවයි (විජේසිංහ 2018). අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ එවකට ප්‍රධානියා වූ සාලිය පීරිස් දිස්ත්‍රික්කයේ අතුරුදන් වූවන්ගේ ඥාතීන් හමුවී තම ආයතනය කැණීම් කටයුතු සමීපව නිරීක්ෂණය කරන බව තහවුරු කළේය. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ සහාය ඇතිව, සිදුකරන ලද කැණීම්වලදී ළමුන් 28 දෙනෙකුගේ (OHCHR 2019) ඇටසැකිලි 300 කට වඩා ඇතුළත් සමූහ මිනීවළක් පිළිබඳව හෙළිදරව් විය.

2019 වර්ෂයේදී මිනිස් අස්ථි කොටස්වල කාබන් කාල නිර්ණය සහ විමර්ශකයින්ගේ විශේෂඥ අදහස් අතර විෂමතාවයක් පවතින බව හඳුනාගැනීමෙන් පසු මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණය විසින් කැණීම නතර කරන ලදී. එම ස්ථානයෙන් සොයා ගත් මිනිස් සිරුරුවල අස්ථි කොටස් මත පදනම්ව, ඇතැමුන් කියා සිටියේ එම අස්ථි කොටස් වසර 30 කට වඩා පැරණි නොවිය හැකි නමුත් (නැවතත් බීටා ඇනලිටික්ස් ඉන්කෝපරේෂන් විසින්) විශ්ලේෂණය කරන ලද සාම්පල 1477-1719 අතර කාලයට අයත් බවයි (Thomas 2019). තව දුරටත් කැණීම් නතර කිරීමට නියමිතව තිබුණේ වඩාත් තීරණාත්මක සාක්ෂි ලැබෙන තෙක් මාස තුනක් පමණ වන නමුත් එය මෑතකදී 2022 පෙබරවාරි මාසයේදී ඉවත් කරන ලදී (ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදීන් 2022).

ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය සමින්ද රාජපක්ෂ මහතා විමර්ශන කටයුතු නොමග යැවූ බව පවසමින් අතුරුදන්වූවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු ඔහුට එරෙහිව පැමිණිලි කිරීම නිසා නඩුව තවත් සංකූල විය. ඊට ප්‍රතිචාර වශයෙන් 2020 මාර්තු 10 වැනි දින මන්නාරම මහේස්ත්‍රාත්වරයා නියෝග කළේ අතුරුදන් වූවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ට වින්දිතයන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීමට නීත්‍යානුකූලව අවසර නැති බවයි.

විපතට පත් වූවන්ගේ පවුල්වල නීතීඥයින් විසින් ඊට විරෝධය පළ කරමින් මෙම නියෝගයේ නීත්‍යානුකූලභාවය අභියෝගයට ලක් කරමින් වවුනියාව මහාධිකරණයට සමාලෝචන පෙත්සමක් ගොනු කරන ලදි. මන්නාරම මහාධිකරණ විනිසුරු ඉලංචේලියන් විනිසුරුවරයා අතුරුදහන් වූවන්ගේ පවුල්වලට පක්ෂව තීන්දුවක් ලබා දෙමින් කැණීම් නැවත ආරම්භ කරන ලෙස නියෝග කළ අතර මන්නාරම සමූහ මිනීවළ හා අදාළ නඩු කටයුතු 2022 පෙබරවාරි දක්වා (CHRD Sri Lanka) අත්හිටුවීමට මෙම සමාලෝචනය දායක විය.

අතුරුදන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන් සහ ඔවුන්ගේ නීතිඥවරුන් විසින් විමර්ශන ක්‍රියාවලියට වැඩි වශයෙන් සම්බන්ධ කර ගැනීම සඳහා කරන ලද අඛණ්ඩ උද්ඝෝෂණයකින් පසුව මෙම තීන්දුව ලබා දී ඇත. මේ හේතුවෙන් අතුරුදන්වූවන්ගේ ඥාතීන්ට සහ ඔවුන්ගේ නීතිඥවරුන්ට විමර්ශන කටයුතු සඳහා පැමිණීමට අවසර ලබාදෙන බව මන්නාරම මහාධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගයේ සඳහන් විය. කැණීම් කරන දිනවලදී දස දෙනෙකුට පැමිණීමට අවසර ලබා දුන් අතර අනෙක් අයට එම ස්ථානයෙන් මීටර් 30ක් දුරින් සිටිය යුතු බවට නියෝග කරන ලදි. මාධ්‍යවේදීන්ට සෑම පැයකටම මිනිත්තු 10 ක කාලයක් තොරතුරු රැස් කිරීම සඳහා කැණීම් භූමියේ රැඳී සිටිය හැක (ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදීන් 2022). සමූහ මිනීවළවල් පිළිබඳ විමර්ශන කටයුතු හා මැදිහත් වීමට වින්දිතයන්ගේ පවුල්වලට ඇති අයිතිය පිළිබඳ සලකා බැලීමක් මින් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් වන විටත් මන්නාරමේ කැණීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි. කැණීම් ක්‍රියාවලිය තුළ තව තවත් බාධා ඇති කරමින්, මිනීවළ අවට ඇති වෙළඳසැල් කඩා ඉවත් කිරීම මෙන්ම නගරයට ජලය සපයන නල මාර්ගයක් වසා දැමීම අවශ්‍ය බව ප්‍රාදේශීය පොලිසිය තහවුරු කරන ලදි (ද ලීඩර් 2022). මෙම කොටසේ විස්තර කර ඇති ස්ථාන හත 1994 සිට කැණීම් සිදුකොට විමර්ශනය කරන ලද ප්‍රධාන ස්ථාන වේ. මෙම කිසිදු විමර්ශනයක් අපරාධ හා සම්බන්ධ සැකකරුවන්ට දඬුවම් කිරීමට හේතු නොවීය. සොයා ගන්නා ලද සිරුරු රාශියකින් චෙම්මනි අඩවියෙන් හඳුනාගත හැකිව තිබුණේ සිරුරු දෙකක් පමණි. එමනිසා වින්දිතයන්ගේ ඥාතීන්ට වන්දි හෝ යුක්තිය ඉටුකර ගැනීමට නොහැකි වී ඇත. තවත් බොහෝ ස්ථාන වාර්තා වී තිබුණත් ඒවා පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදුකර නැත. මෙම ස්ථාන සම්බන්ධයෙන් ඇත්තේ සුළු තොරතුරු ප්‍රමාණයක් වන අතර, දේශීය සහ ජාත්‍යන්තර නීති මගින් ඒවා විමර්ශනය කළ යුතු බව අඟවා ඇත. සමූහ මිනීවළවල් විමර්ශනය කළ යුතු රාමුවක් දේශීය සහ ජාත්‍යන්තර යන නීති දෙක විසින් ම ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න පහත කොටසින් දක්වා ඇත.

### 3. නීතිමය ව්‍යුහය

සමූහ මිනීවළවල් යනු විවිධ රෙගුලාසි සහ නීතිමය ව්‍යුහයන් හා සම්බන්ධ සංකීර්ණ ස්ථාන වේ. එවැනි ස්ථානයක් හඳුනාගැනීමේ සිට සමූහ මිනීවළක් අනුස්මරණය කිරීම දක්වා, සමූහ මිනීවළක් කළමනාකරණය කිරීමේ පියවර කිහිපයක් ඇති අතර ඒ සෑම එකක් ම නීතිමය රාමුවකින් පාලනය වේ. සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් බෝර්න්මවුත් (Bournemouth) ප්‍රොටෝකෝලය, අතුරුදහන් වූවන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම සමග සහයෝගිත්වයෙන්, 2020 දි සමූහ මිනීවළවල් කළමනාකරණය කරන ආකාරය පිළිබඳ ජාත්‍යන්තර නීතිමය සම්මතයන් ඉදිරිපත් කර ඇත. බෝර්න්මවුත් ප්‍රොටෝකෝලය ඒ සම්බන්ධයෙන් පියවර හතක් ඉදිරිපත් කර ඇති අතර එයට, සමූහ මිනීවළක් සොයාගැනීම සහ ආරක්ෂිතව ඒ පිළිබඳ වාර්තා කිරීම, එම ස්ථානය ආරක්ෂා කිරීම, විමර්ශන කටයුතු ආරම්භ කිරීම, වින්දිතයන් හඳුනා ගැනීම, මිනිස් සිරුරු නැවත ඥාතීන් වෙත භාර දීම සහ යුක්තිය සහ අනුස්මරණය එයට ඇතුළත් වේ (Klinkner 4). ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, අධිකරණ නීති කිහිපයක් මෙහි දක්වා ඇති පියවර කිහිපයක් එකවර ආවරණය කරයි. මේ අනුව, මෙය ශ්‍රී ලංකාවේ නීතිමය සන්දර්භයට ගැලපෙන ආකාරයට යොදා ගැනීමේ දි, එකී නීති නැවත යොදා ගැනීම වැළැක්වීම සඳහා පියවර පහක බෙදීමක් වඩාත් සුදුසු බව හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළක් කළමනාකරණය සඳහා වන නීතිමය රාමුව පහත පරිදි සැලසුම් කර ඇත.

A. සොයාගැනීම
B. විමර්ශන කටයුතු ආරම්භ කිරීම සහ හඳුනාගැනීම
C. නඩු පැවරීම
D. පවුල්වල අයිතිවාසිකම් වෙනු වෙන් ක්‍රියාත්මක වීම
E. අනුස්මරණය

මෙම පියවර බොහෝ විට එකිනෙක හා සම්බන්ධ වේ. නිදසුනක් වශයෙන්, පවුල්වල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගත් කළ එය මිනිවළ සොයාගැනීමේ මොහොතේ සිට සහ විමර්ශන ක්‍රියාවලිය පුරාවටම සලකා බැලිය හැකි කාරණාවකි. එකී කාර්ය වඩාත් පහසු කිරීම සඳහා, සෑම පියවරක් ම පෙර පැවති ආකාරයේ සිට පහත පරිදි අනුගමනය කරනු ලැබේ. ශ්‍රී ලංකාව පාලනය වන ජාත්‍යන්තර බැඳීම් සාකච්ඡා කිරීමට පෙර සෑම උප කාණ්ඩයක් ම හා අදාළ දේශීය නීති කවරේ ද යන්න සලකා බලනු ඇත. දේශීය සන්දර්භය තුළ, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ 2016 අංක 14 දරණ (මින් පසු එය OMP පනත ලෙස සඳහන් වේ) අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාල (ස්ථාපනය, පරිපාලනය සහ කාර්යයන් ඉටුකිරීම) පනත මේ සම්බන්ධයෙන් විශේෂයෙන් ම ප්‍රයෝජනවත් බව පෙන්නුම් කරයි. OMP කාර්යාලය අධිකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ සමූහ මිනීවළවල් හා සම්බන්ධ ප්‍රශ්න වටා

ඇති එකිනෙකට වෙනස් වූ නීති ඒකාබද්ධ කිරීමට එය පිහිටුවීම තුළ අවස්ථාව සලසා දී ඇත.[11] එය පිහිටුවන විට, අතුරුදහන් වූවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටින ඇතැම් නීතිඥයන් එහි විශ්වසනීයත්වය සහ සමූහ මිනීවළවල් විමර්ශනය කිරීමේදි අපක්ෂපාතීව කටයුතු කිරීමට එයට ඇති හැකියාව පිළිබඳව සැක පහළ කළ නමුත් එය තවමත් නිසි බලයක් ඇති ආයතනයක් ලෙස අවබෝධ කර ගෙන ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකික කතුවරුන් සහ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු පවසන්නේ 2019 දි ආණ්ඩුව වෙනස් වීමත් සමඟ එහි නායකත්වයේ සිදුවූ වෙනසත් සහ ඒ සඳහා වෙන් කරන ලද අයවැය දැඩි ලෙස කප්පාදු කිරීමත් නිසා OMP පිළිබඳ ඇති විශ්වාසනීයත්වය නැති වී ගොස් ඇති බවත්ය (Fernando 2022).

ජාත්‍යන්තර නීතිය තුළ, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය.[12] සමූහ මිනීවළවල් පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීමේදී අදාළ වේ. සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් නීතිමය වගකීම් පනවා ඇති බොහෝ එක්සත් ජාතීන්ගේ ගිවිසුම්වලට ශ්‍රී ලංකාව අත්සන් කර ඇති අතර, ජාතික නීති සම්මත කිරීම හරහා එම ගිවිසුම් දේශීය නීතිය හා බැඳී පවතී.[13] එබැවින්, රාජ්‍යය විසින්ම ජාත්‍යන්තර අධිකරණයට වගකියන අතර, එහි ගිවිසුම් වල ඇතුළත් බැඳීම් උල්ලංඝණය කරන බව පෙනී ගියහොත්, එයට අදාළව සමාන දේශීය නීතියක් සම්මත කර නොමැති නම් පුරවැසියන්ට තමන්ගේ රජයට එරෙහිව දේශීය වශයෙන් සමාන හිමිකමක් ඉල්ලා සිටිය නොහැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස මානව හිමිකම් සම්මුතීන් දේශීය පද්ධතියට අනුකලනය වීම මන්දගාමී වී ඇත. නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාව 2016 දී බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අනුමත කළ නමුත් එය සම්මත කරමින් රට තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ 2018 දීය.

තවද, සමූල ඝාතන, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ, යුද අපරාධ සහ ආක්‍රමණශීලී අපරාධ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් විමර්ශනය කර නඩු පැවරීමේ අධිකරණ බලය ඇති ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු නොවේ. මේ අනුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ශ්‍රී ලංකාවේ තත්ත්වය ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත යොමු කිරීමට ඡන්දය ප්‍රකාශ කළ නොහැකි අවස්ථාවක හැර, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ ඇති මෙම විකල්පයට තවමත් ප්‍රවේශ විය නොහැක.

---

11 OMP හි ඉතිහාසය, ක්‍රියාකාරිත්වය සහ සීමාවන් පිළිබඳ වැඩි විස්තර සඳහා, Isabelle Lassée විසින් රචිත, "අතුරුදහන් වූවන් පිළිබඳ ශ්‍රී ලංකා කාර්යාලයඃ සත්‍යය සහ යුක්තිය පාපැදියක් ද?" බලන්න, රතු කුරුස සංවිධානයේ ජාත්‍යන්තර සමාලෝචනය (2017), අංක 99 අංක 2, 619-639. 2020 OMP වාර්ෂික වාර්තාව ද බලන්න.

12 ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සාමය පවතින කාලයේ සහ යුධ සමයේදී රාජ්‍යයන්ට අදාළ වන නමුත් ජාත්‍යන්තර මානුෂීය නීතිය (ප්‍රධාන වශයෙන් ජිනීවා සම්මුති සහ සාමාන්‍ය නීති වලින් සමන්විත) යුධ සමයේදී පමණක් අදාළ වේ.

13 ඒ අනුව, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර නීතිය එහි දේශීය ක්‍රමය තුළ ඒකාබද්ධ කිරීම තුළ ද්විත්වවාදී රටක් ලෙස වර්ගීකරණය කර ඇත. එබැවින්, රජයම ජාත්‍යන්තර අධිකරණවලට වගකියන අතර, එහි ගිවිසුම් බැඳීම් කඩ කරන බව පෙනී ගියහොත්, සමාන දේශීය නීතියක් නොමැති නම්, රාජ්‍යයේ පුරවැසියන්ට ජාත්‍යන්තර ගිවිසුමක් මත පදනම්ව තමන්ගේම රජයට එරෙහිව හිමිකම් පෑමක් කළ නොහැක. මෙය 2006 දී සිංගරාසාට එදිරිව නීතිපති නඩුව හරහා තහවුරු වූ අතර එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේ ශ්‍රී ලංකාව සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අනුමත කර ඇතත්, දේශීය නීති නොමැතිකම නිසා එහි අඩංගු අයිතිවාසිකම් ඍජුවම ඉල්ලා සිටිය නොහැකි බවයි.

එය අනිවාර්‍යය බව පැහැදිලිව පෙනෙන්නට තිබුණද, දේශීය හා ජාත්‍යන්තර නීතිය යටතේ සමූහ මිනීවළවල් නිර්මාණය කිරීම නීති විරෝධී බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. දේශීය නීතියේ, 1899 අංක 9 දරන ආදාහනාගාර හා සුසාන භූමි ආඥාපනතේ, 2005 සංශෝධනයෙහි සියලුම භූමදානයන් ලියාපදිංචි කළ යුතු බව (15 වැනි වගන්තිය) සහ "සුසාන භූමිය තුළ සිදු කරනු ලබන සියලුම භූමදානයන් පිළිගත හැකි ප්‍රමිතියකින් හා ගෞරවාන්විත ආකාරයෙන් සිදුකරන බවටත් සොහොන් නිසි ගැඹුරකින් ඉදිකර ඇති බවටත්" නිසි බලධාරියා සහතික කළ යුතු බව සඳහන් කරයි (17 (අ) වගන්තිය)

චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂීය නීතියේ (Customary International Humanitarian Law) (මෙතැන් සිට, CIHL)), ගැටුමකට සම්බන්ධ පාර්ශ්වයන්ගේ මිනිස් දේහයන් භූමදාන කිරීමට පෙර සියලු හඳුනාගැනීමේ තොරතුරු සටහන් කර, සොහොන පවතින ස්ථානය සලකුණු කළ යුතුය (ක්‍ෂ්‍යබ රීතිය 115). තවද, ඔවුන්ගේ සොහොන් ගෞරවනීය හා නිසි ලෙස නඩත්තු කළ යුතු අතර ඔවුන්ගේ දේහ ගෞරවනීය ලෙස බැහැර කළ යුතුය. (CIHL රීතිය 115). කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සන්දර්භය තුළ, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA) සහ හදිසි නීති රෙගුලාසි (ER) යටතේ ආරක්ෂක හමුදාවන්ට මරණ පරීක්ෂණයකින් තොරව සිරුරු බැහැර කිරීමට අවසර දී ඇති බව සැලකිල්ලට ගත යුතුය (එක්සත් ජනපද ජාතික වාර්තාව 1990).

සමූහ මිනීවළවල් ජාත්‍යන්තර නීතියට අනුකූල වන එකම අවස්ථාව වන්නේ ස්වාභාවික විපත් හේතු කොට ගෙන මිනිසුන් මිය යාමය. නිදසුනක් ලෙස සමස්ථ ශ්‍රී ලංකාවම විනාශයට පත්කළ සහ 35,000 කට අධික පිරිසකට මරණය උරුම කළ 2004 සුනාමිය ගත හැක (පෙරේරා සහ බ්‍රිග්ස් 2008). මෙම මිනීවළවල් නිර්මාණය කිරීම පුහුණුව ලැබූ කාර්යමණ්ඩලයක් විසින් නිශ්චිත ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් සිදුකළ යුතුය. ශ්‍රී ලංකාවෙන් මේ වන විට සොයාගෙන ඇති සමස්ථ සමූහ මිනීවළවල් 32 න් 6 ක් සුනාමියේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ ඒවා වන අතර බොහෝ ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සාදන ලද ඒවා නොවේ (Perera 2005). මේවායේ විස්තර මෙම වාර්තාවේ ඇමුණුම 1 හි ඇතුළත් කර ඇත. පහත දැක්වෙන කොටස තුළින් සමූහ මිනීවළක් කළමනාකරණය හා අදාළ සෑම පියවරක් සඳහාම අදාළ නිශ්චිත රෙගුලාසි පෙන්වා දෙන අතර මෙම ස්ථාන වඩාත් සාධනීය ලෙස ආරක්ෂා කිරීමට සහ ඒ පිළිබඳ විමර්ශන කටයුතු ආරම්භ කිරීමට පවතින නීති භාවිතා නොකරන්නේ මන්ද යන්න මන්ද යන්න ප්‍රශ්න කරයි.

## A. සමූහ මිනීවළවල් සොයාගැනීම

ඇතැම් සමූහ මිනීවළවල් තොරතුරු සපයන්නන් හරහා හෙළිදරව් වී ඇති අතර, තවත් ඒවා සිවිල් වැසියන් විසින් (බොහෝ විට ඉදිකිරීම් කටයුතු සිදුකරන අතරතුර) අහම්බෙන් සොයා ගන්නා ලද ඒවා වේ. මෙම කොටස තුළින් සමූහ මිනීවළක් සොයාගැනීමේ මොහොතේ සිට එහි විමර්ශන කටයුතු නිල වශයෙන් ආරම්භ කිරීම දක්වා අදාළ වන වගකීම් ආවරණය කරයි.

**දේශීය නීතිමය ව්‍යුහය**

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත මගින් මිනිස් සිරුරු සොයාගැනීම හා අදාළ වාර්තා කිරීමේ නීතිමය බැඳීම දක්වා ඇත. 21(ආ) වගන්තියට අනුව ඕනෑම පුද්ගලයෙකු "ඕනෑම හදිසි හෝ අස්වාභාවික මරණයක් හෝ ප්‍රචණ්ඩත්වය නිසා සිදුවන මරණයක් හෝ සැක කටයුතු තත්ත්වයන් යටතේ සිදුවන ඕනෑම මරණයක් හෝ මරණය සිදුවූයේ කෙසේදැයි නොදැන කිසියම් පුද්ගලයෙකු මිය ගොස් ඇති බව දන්නේ නම්" එකී සිදුවීම පහත සඳහන් බලධාරීන්ගෙන් එක් අයෙකුට වාර්තා කිරීමට ඔහුට/ඇයට නීතිමය බැඳීමක් ඇතඃ

- ළඟම ඇති මහේස්ත්‍රාත් අධිකරණය
- ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපති (OIC)
- සාම නිලධාරියෙක්
- ආසන්නතම ගමේ ග්‍රාමසේවා නිලධාරී (ග්‍රාම නිලධාරි)

ඔවුන් මෙම සොයා ගැනීම පිළිබඳ වාර්තා නොකරන්නේ නම්, එසේ නොකිරීමට ඔවුන්ට සාධාරණ නිදහසට කරුණක් තිබූ බව ඔප්පු කිරීමට ඔවුන්ට වගකීමක් ඇත.

මෙම රාජකාරිය පොලිස් නිලධාරීන්ට ද අදාළ වේ. 22(ආ) සහ (ඇ) වගන්තියට අනුව, පුද්ගලයෙකුගේ පැහැදිලි කළ නොහැකි සහ අස්වාභාවික මරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලැබුණ විට සහ/හෝ "මරණයට පැමිණියේ කෙසේදැයි නොදන්නා ඕනෑම පුද්ගලයෙකුගේ මළ සිරුරක්" සොයා ගන්නා නිලධාරියෙකු එවැනි තොරතුරු පහත බලධාරීන්ගෙන් එක් අයෙකුට දැනුම් දිය යුතුයඃ

- ළඟම මහේස්ත්‍රාත්වරයා
- අධිකරණ බලය ඇති විමර්ශකයෙකුට
- ඔහුගේ/ඇයගේ ආසන්නතම උසස් නිලධාරියාට

නිල නොවන සොහොන් බිමක් පවතින බවට ප්‍රාදේශීය මහේස්ත්‍රාත් අධිකරණය දැනුවත් කළ පසු අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලයට ද එය දැනුම් දිය යුතුය. තොරතුරු සපයන්නෙක් සමූහ මිනීවළක් ඇති ස්ථානය OMP වෙත සෘජුවම සන්නිවේදනය කරන්නේ නම්, පසුව එම තොරතුර දැනගත් තැනැත්තා අදාළ කලාපයේ අධිකරණ බලය සහිත ප්‍රාදේශීය මහේස්ත්‍රාත් අධිකරණයට දැනුම් දිය යුතු අතර සැක සහිත සොහොන් භූමියේ කැණීමක් (OMP පනත) සිදු කිරීමට අධිකරණයේ නියෝගයක් ඉල්ලා සිටිය යුතුය, වගන්තිය 12 (d)).

OMP පනතේ 13 (1) (k) (iii) වගන්තියේ සඳහන් වන්නේ හඳුනාගත නොහැකි සහ හඳුනාගත හැකි දේහයන් පිළිබඳ කටයුතු කරන ආකාරය පිළිබඳව මහේස්ත්‍රාත්වරයා සහ එකී මළ සිරුරු ගොඩගැනීම සඳහා මැදිහත්වන විශේෂඥයන් ඇතුළු අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට OMP හට බලය පැවරී ඇති බවයි.

මළ සිරුරු වළ දැමූ බිමක් ලෙස සොයාගෙන එය හඳුනා ගැනීමෙන් පසුව, නිල පරීක්ෂණයක් ආරම්භ වන තුරු එකී ස්ථානය ආරක්ෂා කළ යුතුය. එකී ස්ථානයේ ආරක්ෂාව සම්බන්ධයෙන්, 2005 දී සංශෝධිත 1899 අංක 9 දරන ආදාහනාගාර හා සුසාන භූමි ආඥා පනතේ 14 වැනි වගන්තිය තුළින් යම් ස්ථානයක සිට මළ සිරුරක් ඉවත් කිරීම තහනම් කරන අතර," අපරාධ නීතියේ ඇතුළත් නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා, පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග කිරීමට අයත් බලතල කිසිවක් (...) සීමා කරවන කිසිවක් නොගත යුතුය" යන්න සඳහන් කර ඇත. අවශ්‍ය අවස්ථාවන්හිදී වළලනු ලැබූ මළ සිරුරු පිළිබඳ පසුකාලීන පරීක්ෂණ පැවැත්වීමේ හැකියාව නීතිය පැහැදිලිවම පුරෝකථනය කරන බැවින් මෙම පරීක්ෂණ සාර්ථකව සිදු කිරීම සඳහා සමූහ මිනීවළවල් දැඩිව ආරක්ෂා කිරීමට මෙම විධිවිධානය පෙන්වා දිය හැකිය. නාඳුනන පුද්ගලයින්ට අයත් මිනිස් සිරුරු වැඩිදුර විමර්ශනයට පහසුකම් සැලසෙන පරිදි ඒවා ආදාහනය නොකළ යුතුය.

මළ සිරුරු සොයා ගත් විට අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියට අදාළ විධිවිධාන 1975 අංක 40 දරණ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනතේහි ද ඇතුළත් වේ. පනතේ 29 වැනි වගන්තියට අනුව, පුද්ගලයෙකුගේ මරණය සම්බන්ධයෙන් තොරතුරු මරණ රෙජිස්ට්‍රාර්වරයාට ලබාදීමට ඥාතීන් නොමැති අවස්ථාවක, මළ සිරුරක් සොයා ගන්නා පුද්ගලයා "මෙම පනත යටතේ මියගිය පුද්ගලයා පිළිබඳ අදාළ තොරතුරු එකී පුද්ගලයා හෝ පුද්ගලයන් විසින් ඔවුන් දන්නා පරිදි අදාළ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දිය යුතු අතර, එම රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබුවහොත්, අදාළ මරණය ලියාපදිංචි කිරීම සඳහා ඔහු ඉදිරියේ අදාළ ස්ථානයේ අත්සන් කළ යුතුය. අනන්‍යතාවය තක්සේරු කිරීමකින් තොරව මිනිස් සිරුරු බැහැර කර ඇති තත්ත්වයන් තුළ, මරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි දේහයන් තැන්පත් කර ඇති ස්ථානය පිළිබඳ වාර්තාවක් තබා ගත යුතුද යන්න සහ හඳුනා නොගත් මළ සිරුරු තැන්පත් කළ ස්ථාන සලකුණු කිරීම සඳහා මුළු රටෙහිම අඛණ්ඩව භාවිතා කරන හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද යන්න පිළිබඳව පැහැදිලි බවක් නොමැත.

රටේ ඇතැම් ප්‍රදේශවල, ප්‍රාදේශීය ජනතාව සහ රාජ්‍ය බලධාරීන් අතර එකිනෙකා පිළිබඳ විශ්වාසයක් නොමැතිකම හේතුවෙන්, මිනිස් අස්ථි කොටස් සොයා ගන්නා ඇතැම් පුරවැසියන් තම සොයා ගැනීම පිළබඳ පළාත් පාලන ආයතනවලට වාර්තා කිරීමට උනන්දුවන්නේ නැත. මෙතෙක් සොයා ගෙන ඇති සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් ගත් කළ, 1994 වසරේ දී සූරියකන්ද සහ 2014 වසරේ දී කලවංචිකුඩිය (තවමත් කැණීම් සිදුවී නොමැති) යන සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් පමණක් තනි පුද්ගලයින් ඒ සම්බන්ධ තොරතුරු ලබාදීමට ඉදිරිපත් ව ඇත. එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් වාර්තා කිරීමට, ඒ හා අදාළව ඇති නීත්‍යානුකූල බැඳීම පිළිබඳව ඇතැම්විට ප්‍රජාව තුළ නිසි දැනුවත්භාවයක් නොමැති විය හැකිය. තවද, පරීක්ෂණ ආරම්භ කරන විට පවා, එකී ස්ථානය භෞතිකව ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවයට බලධාරීන් ගරු කර ඇත්තේ කලාතුරකිනි. සූරියකන්ද ප්‍රදේශය ගත් කළ එම ස්ථානයට බධාවකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට ඇතුල් වීමට අවසර ලබා දී තිබූ බැවින්, මේ පිළිබඳ දැනුවත්භාවයක් නොමැති පුරවැසියන් පවා කැණීම් කටයුතු සඳහා

සහභාගී වූ අතර, ඒ හේතුවෙන් සාක්ෂි වලට අර්ධ වශයෙන් හානි සිදු විය. යාපනය දොරේඅප්පා ක්‍රීඩාංගණයෙන් සහ මාතලේ මහ රෝහලට පහළින් හමුවූ සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ඇනහිටීමෙන් පසුව, එහි ඉදිකිරීම් කටයුතු නැවත කරගෙන යාමට අවසර ලැබිණි. මෙම ස්ථාන සම්බන්ධයෙන් රජය ගත් නොසැලකිලිමත් පියවර හේතු කොට ගෙන එවැනි සොයාගැනීම් පිළිබඳ වාර්තා කිරීමට ප්‍රජාව තුළ ඇති උනන්දුව ගිලිහී යා හැකිය.

**ජාත්‍යන්තර නීතිමය ව්‍යුහය**

2016 දී ශ්‍රී ලංකාව බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතිය (Convention for the Protection of All Persons from Enforced Disappearance (CED)) අනුමත කළ අතර, 2018 අංක 5 දරණ බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට අනුමැතිය දෙමින්, 2018 මාර්තු මාසයේදී එය ක්‍රියාත්මක කරමින් දේශීය නීති සම්පාදනය කරන ලදි. CED හි 12(1) වගන්තියට අනුව, බෝර්න්මවුත් ප්‍රොටකෝලය නිර්දේශ කරන්නේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වාර්තා කිරීමට පුරවැසියන්ට ඇති අයිතිය රාජ්‍යයන් විසින් ආරක්ෂා කළ යුතු බව සහ, සමූහ මිනීවලවල් සොයා ගැනීම සම්බන්ධයෙන් ආරක්ෂිතව වාර්තා කිරීමේ අයිතිය දක්වා එය ව්‍යාප්ත කළ හැකි බවයි. එපමණක් ද නොව, අතුරුදහන් වූ පුද්ගලයන් සෙවීම, සිටින ස්ථානය හඳුනාගැනීම සහ නිදහස් කිරීම සහ මරණයකදී ඔවුන්ගේ සිරුරු නැවත ගොඩගෙන හඳුනාගෙන එම දේහ ආපසු භාරදීම රාජ්‍යයේ යුතුකමක් බව 15 වැනි වගන්තියේ සඳහන් වේ. ශ්‍රී ලංකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් විශාල සංඛ්‍යාවක් ඇති බැවින්, සමූහ මිනීවළක් සොයා ගැනීමෙන් පසු ප්‍රථමයෙන් සහ මූලික වශයෙන්, සිරුරු ගොඩගෙන හඳුනාගැනීම ආරම්භ කරයි.

ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුව මියගිය අය සෙවීම ද අවශ්‍ය වේː ජිනීවා සම්මුතියේ (I) 15 වැනි වගන්තියේ යුධබිමේදි සන්නද්ධ හමුදාවේ තුවාල ලැබූ සහ රෝගී වූ පුද්ගලයන්ගේ තත්ත්වය වඩාත් යහපත් කිරීම සඳහා එකිනෙකට වෙනස් වගකීම් දෙකක් සඳහන් කරයිː මියගිය පුද්ගලයින් සෙවීම සහ ඔවුන්ගේ සිරුරු නරක්වීම වැළැක්වීමයි (2016 ජිනීවා සම්මුතිය පිළිබඳ විස්තර ප්‍රකාශයේ (I) දක්වා ඇති පරිදි).

සිවිල් ජනතාව සමූහ මිනීවළක් සොයා ගත් විට, අතිරේක ප්‍රොටෝකෝලය I හි 17(2) වගන්තියට අනුව ඒ පිළිබඳව ආරක්ෂිතව වාර්තා කිරීමට ඔවුන්ට ආරක්ෂාව ලබා දිය යුතුය. තවද, 34 වන වගන්තිය මගින් මියගිය අයගේ දේහ සම්බන්ධයෙන් " මියගිය අයගේ දේහ නරක් වීම වැළැක්වීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගැනීමේ" අවශ්‍යතාවය ඇතුළුව වැළලු ස්ථානය ආරක්ෂා කළ යුතු බවට නියෝග කරයි. සමූහ මිනීවළකින් ලබාගත් සාක්ෂිවල අඛණ්ඩතාව පවත්වා ගෙන යාම සඳහා, පළමු ප්‍රතිචාර දැක්වූවන් ඇතුළු තුන්වන පාර්ශවයන් විසින් සමූහ මිනීවළක් හා සම්බන්ධ කරුණු විකෘති නොකිරීම ඉතා වැදගත් වේ. එබැවින්, සමූහ මිනීවළක් සොයා ගැනීමෙන් පසු කළමනාකරණය කිරීමේ පළමු පියවර විය යුත්තේ නිල විමර්ශනයක් ආරම්භ කිරීමට පෙර පළාත්

පාලන ආයතන වෙත ඒ පිළිබඳව ආරක්ෂිතව වාර්තා කිරීම සහ භූමියේ භෞතික ආරක්ෂාව සහතික කිරීමයි.

මෙම ජාත්‍යන්තර නීති, සම්මුති සහ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා අවස්ථා කිහිපයකදී හඳුනාගත හැකිය. පළමුවැන්න නම්, ඇතැම් විද්වතුන් සහ නීතීඥයින් පශ්චාත් ගැටුම් කාල පරිච්ඡේදය තුළ ජාත්‍යන්තර මානුෂීය නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටියද, රාජ්‍යයන්ට එසේ කිරීමට බල කරන බැඳීම් රීතියක් නොමැති වීමයි. දෙවැන්න නම්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය තුළ, ශ්‍රී ලංකාව 2016 දී බලහත්කාර අතුරුදහන්වීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය (CED) අනුමත කළ නමුත්, දේශීය නීති ක්‍රියාත්මක කිරීම සම්මත කරන ලද්දේ 2018 දීය. මෙම පනත සම්මත වූ පසුගිය වසර හතර සහ මෙම වාර්තාව ලියන කාලය අතරතුර ප්‍රධාන සිදුවීම් කිහිපයක් සිද්ධ වී ඇතඃ සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ ක්‍රියාවට නැංවීමට නැඹුරු නොවූ රජයක් නැවත පාලන බලයට පැමිනීම (2019 දී), කොරෝනා වසංගතය (ආරම්භය 2020 දී) සහ විරෝධතා ව්‍යාපාර (2022 දී) ආරම්භවීම සහ 2022 අවසන් වනවිට ජනාධිපතිවරයා නෙරපා හැරීම. තුන්වෙනි බාධාව වී ඇත්තේ ජාත්‍යන්තර නීතිමය මෙවලම් භාවිතා කරමින් සමූහ මිනීවළවල් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකරන රජයේ නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට සිවිල් සමාජය තුළ ප්‍රමාණවත් සම්පත් නොමැතිකමයි. මෙම බධාවන් සමූහ මිනීවළවල් කළමනාකරණයේ පසු අදියර සඳහා ද අදාළ වේ.

## B. විමර්ශන කටයුතු

සමූහ මිනීවළක් සොයා ගෙන ඒ පිළිබඳ වාර්තා කළ පසු, දේශීය මෙන්ම ජාත්‍යන්තර නීතිමය ව්‍යුහයන් තුළින් පෙන්නුම් කරන්නේ විමර්ශනයක් ආරම්භ කළ යුතු බවයි. සාක්ෂි සෙවීමට සහ විශ්ලේෂණය කිරීමට සාධාරණ උත්සාහයක් ගැනීමෙන් පසුව ඒ තුළින් කිසිදු ප්‍රතිඵලයක් ලබා ගැනීමට නොහැකි වූ විට, විමර්ශනයක් අවසන් කිරීම සඳහා මෙම නීතිමය ව්‍යුහයන් අවසර දෙන්නේ කවදා ද යන්න පැහැදිලි නැත. එසේ වුවද, විමර්ශනයකට අවම වශයෙන් අදියර තුනක් ඇතුළත් විය යුතුයඃ සැලසුම් කිරීම, අධිකරණ වෛද්‍ය පරීක්ෂණ සහ හඳුනාගැනීමේ උත්සාහයන්. මෙම සෑම පියවරක්ම බෝර්න්මවුත් ප්‍රොටකෝලයේ හි මැනවින් විස්තරාත්මකව ඉදිරිපත් කර ඇති අතර මෙම වාර්තාව එහි නිර්දේශ අනුගමනය කිරීමට නිර්දේශ කරයි. අපි මෙහිදී මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ විමර්ශනයක් ආරම්භ කිරීම සහ එය අඛණ්ඩව සිදුකරගෙන යාම සඳහා, එයට වගකිව යුතු නිසි බලධාරීන්ගේ වගවීම ඇගයීම සඳහා භාවිතා කළ හැකි නියාමන රාමුව වෙතය.

### දේශීය නීතිමය ව්‍යුහයන්

ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළක් පිළිබද විමර්ශනයක් සිදුකිරීමේ වගකීම ඇත්තේ කාටද යන්න නියාමනය කිරීමේදී ව්‍යවස්ථාදායක මෙවලම් කිහිපයක් එකිනෙක හා සම්බන්ධ වේ. වඩාත්ම අදාළ නීතිමය මෙවලම වන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහය සහ OMP පනතයි.

සමූහ මිනීවළක් පිළිබඳව ළඟම ඇති මහේස්ත්‍රාත්වරයාට හෝ ප්‍රාදේශීය පරීක්ෂකයෙකු වාර්තා වූ විට, අපරාධ නඩු විධාන සංග්‍රහයේ සඳහන් වන්නේ මරණ පරීක්ෂණ පැවැත්විය යුත්තේ පරීක්ෂකයෙකු විසින් බවය. 370(1) වගන්තියට අනුව, පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට තොරතුරු ලැබෙන පරීක්ෂකයින් විසින් වහාම එය සොයා ගත් ස්ථානයට ගොස් මරණය සම්බන්ධයෙන් පෙනෙන්නට ඇති හේතුව පිළිබඳ වාර්තාවක් ලිවීම අවශ්‍ය වේ. මෙම වාර්තාව ප්‍රාදේශීය මහේස්ත්‍රාත්වරයා වෙත යැවීමට නියමිත අතර, අපරාධයක් සිදුවී ඇති බවට කිසියම් සැකයක් ඇත්නම්, පරීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍ය වේ (370(4) වගන්තිය).

මහේස්ත්‍රාත්වරුන් විසින් පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට අදාළ සියලුම සිද්ධි තවදුරටත් විභාග කර ඒ පිළිබඳ සාක්ෂි සටහන් කරගැනීම අවශ්‍ය වේ (9(iii) වගන්තිය). ඔවුන් විසින් මළ සිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීමට ද අවශ්‍ය වේ (373 වගන්තිය). දෙවැනි කාරණාව සඳහා, මහේස්ත්‍රාත්වරයාට මළ සිරුර නැවත ගොඩගැනීමට ද හැක (373 (2) වගන්තිය).

තවද, මියගිය පුද්ගලයා සහ ඔවුන්ගේ වයස හඳුනා ගැනීම සඳහා 1895 අංක 14 දරන සාක්ෂි ආඥාපනත භාවිතා කළ හැක. "පුද්ගලයෙකුගේ වයස සම්බන්ධයෙන් අධිකරණයට මතයක් සැකසීමට අවශ්‍ය වන විට, එකී පුද්ගලයාගේ අනුමාන වයස පිළිබඳව වෛද්‍ය වෘත්තිකයෙකු විසින් නිකුත් කළ යුතු යැයි කියන ප්‍රකාශයක් ඇතුළත් සහතිකයක් අදාළ වේ" යනුවෙන් 1999 දී හඳුන්වා දුන් 38 වගන්තියේ සඳහන් වේ. සොයාගත් දේහයේ අනන්‍යතාවය සීමා කිරීමට මෙය භාවිතා කළ හැකිය. කෙසේ වෙතත්, සොයාගත් මිනිස් අස්ථි කොටස් හඳුනාගැනීම, සාක්ෂි ගබඩා කිරීම සහ එකතුකරගත් සාක්ෂි විශ්ලේෂණය කර ලේඛනගත කරන කාලානුක්‍රමික ක්‍රියාදාමයක් තිබීමේ අවශ්‍යතාවය පිළිබඳ නීතිය තුළ නිශ්චිතතාවක් නොමැත. සැබවින්ම, මළ සිරුරු ගොඩගැනීම ආරම්භ කිරීමේ සිට හඳුනාගැනීම දක්වා සහ එකී දේහයන් සමඟ කළ යුතු දේ පිළිබඳ අවසන් තීරණය ගන්නා තෙක් එකී කටයුතු හැසිරවීම සඳහා මධ්‍යගත සහ ඒකීය ක්‍රියා පටිපාටියක් විමර්ශන කණ්ඩායම්වලට තිබිය යුතුය. "විමර්ශනය අතරතුර සාක්ෂි අයිතම හැසිරවූ අනුපිළිවෙල ආරක්ෂා වී ඇති බවට සහ පරීක්ෂණ සඳහා බහුවිධ ප්‍රවේශයන් අනුගමනය කිරීම සහතික කිරීම සඳහා පරීක්ෂණ ඒකීය හා ස්ථාවර ආකාරයකින් සිදු කරන බවට සහතික කිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණ සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලෙස" OMP සිය 2020 වාර්ෂික වාර්තාව තුළින් රජයේ අධිකරණ සේවාවන්ගෙන් ඉල්ලා සිටියේය. (OMP 2020, 14).

මෙම මාර්ගෝපදේශය ගැටළුවක් වී තිබේද, එසේ නැත්නම් එය ක්‍රියාත්මක කර තිබේ ද යන්න අපැහැදිලි ය.

අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව, සමූහ මිනීවළක් පිළිබඳ වාර්තා වූ විට, විමර්ශනය ආරම්භ කරන මහේස්ත්‍රාත් අධිකරණයට, සාක්ෂිකරුවන් හෝ සාක්ෂි කැඳවීම සහ අවශ්‍ය අවස්ථාවල දී පුළුල් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම ඇතුළු විමර්ශනයේ කොටසක් ලෙස අවශ්‍ය පියවර ක්‍රියාත්මක කළ හැකිය.

අපරාධ නඩු විධාන සංග්‍රහයේ මෙම විධිවිධාන OMP පනතේ 12 වැනි වගන්තිය සමග ඒකාබද්ධව කියවිය යුතු අතර, OMP හට කැණීමක් සිදු කිරීමට සහ/හෝ සැක සහිත සොහොන් බිම්වල මළ සිරුරු ගොඩගැනීමට අවශ්‍ය අවසරය ලබා දෙන නියෝගයක් සඳහා අදාළ මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම් කිරීමට එය OMP හට බලය පවරා ඇත. "එවැනි කැණීම්වලදී හෝ ගොඩගැනීම් වලදී සහ අනෙකුත් ක්‍රියාදාමයන්හිදී නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කිරීමට" මෙම වගන්තිය මගින් තවදුරටත් OMP හට බලය ලබාදේ. OMP පනතේ 12(e) වගන්තිය, එහි නියෝග සාක්ෂාත් කර ගැනීම සඳහා නියෝජිතායතන හෝ නිලධාරීන්ගෙන් අවශ්‍ය ඕනෑම සහායක් ඉල්ලා සිටීමට OMP ඉඩ සලසයි. මෙමගින්, පුරාවිද්‍යාඥයින් සහ මානව විද්‍යාඥයින් පත් කිරීම සඳහා OMP හට අධිකරණ වෛද්‍ය උපකාර ඉල්ලා සිටිය හැකි අතර අවශ්‍ය නම් ජාත්‍යන්තර විශේෂඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට අරමුදල් ද ඉල්ලා සිටිය හැක.

හඳුනා ගැනීම සම්බන්ධයෙන් ගත් OMP විසින්, එවැනි පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථාව, ඔවුන්ට අත්ව ඇති ඉරණම (2 වගන්තිය) සහ "අතුරුදහන් වූ පුද්ගලයන් හා අදාළ දත්ත (...) එක්රැස් කිරීම සහ මෙම පනත යටතේ ස්ථාපිත කර ඇති දත්ත ගබඩාව තුළ පවතින සියලුම දත්ත මධ්‍යගත කිරීම අනිවාර්ය වේ." (Article 10(1)(e)). මෙම ලිපි සියල්ල එක්ට ගත්කළ ඒ තුළ ඇඟවෙන්නේ සමූහ මිනීවළකින් හමුවූ මළ සිරුරු ලැයිස්තුගත අතුරුදන් වූවකුට අයත් විය හැකිදැයි හඳුනා ගැනීම OMP හි නිල නියෝගයේ කොටසක් බවයි. 13 (1) (k) (iii) වගන්තියේ සඳහන් වන්නේ හඳුනා ගත නොහැකි සහ හඳුනාගත හැකි දේහයන් පිළිබඳ කටයුතු කිරීමට අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමට OMP හට බලය ඇති බව ය.

කලින් සඳහන් කළ පරිදි, OMP සහ ප්‍රාදේශීය මහේස්ත්‍රාත් කාර්යාලය වැනි අනෙකුත් අදාළ ආයතන අතර සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් සම්බන්ධයෙන් පවතින නීතිවල හිඩැස් ඇති බවක් පෙනෙන්ට ඇත. විමර්ශනයක සැලසුම් සකස් කිරීමේ අදියරේදී, මෙම ක්‍රියාවන් ක්‍රියා පටිපාටිමය වශයෙන් තර්කානුකූල වීමට සහ පහසුවෙන් බලාත්මක කිරීම සඳහා සන්නිවේදන මාධ්‍යයන්, සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් සහ මහේස්ත්‍රාත්වරයාගේ සහ OMP හි අදාළ භූමිකාවන් පැහැදිලි කළ යුතුය. කෙසේ වෙතත්, OMP පනත නොමැතිව වුවද, සමූහ මිනීවළක් පිළිබඳ විමර්ශන කටයුතු නියම කළහැකි විධිවිධාන ශ්‍රී ලංකාවේ නීතිවල ඇතුළත්ව ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති අනෙකුත් අයිතීන්, රජය විසින් පූර්ණ පරීක්ෂණයක් පවත්වන බව සහතික කිරීම සඳහා භාවිතා කළ හැකිය. නිදසුනක් වශයෙන්, ජීවත්වීමේ සහ වධ හිංසාවලින් තොරව ජීවත්වීමේ අයිතිය සහ පුද්ගල නිදහස සහ ආරක්ෂාව සඳහා ඇති අයිතිය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය)ː මෙම අයිතිවාසිකම් පිළිබඳ ඇපකරුවෙකු ලෙස, මෙම අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් විමර්ශනය කිරීමට රජයට බැඳීමක් ඇත. සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය සහ අධිකරණමය වගකීම සඳහා ඇති අයිතිය (13.2 වගන්තිය) සාර්ථක පරීක්ෂණයක් සහතික කළ යුතුය.

**ජාත්‍යන්තර නීතිමය ව්‍යුහය**

සමූහ මිනීවළවල් සොයා ගැනීම සම්බන්ධයෙන් බලපාන වැදගත්ම නීතිය වනුයේ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ ඇතුළත් (CED) ඒ පිළිබඳ සෙවීමේ සහ විමර්ශනය කිරීමේ රාජ්‍යයන්ගේ යුතුකමයි. එය ක්‍රමවේදය පිළිබඳ වගකීමක් දරනවා මිස ප්‍රතිඵල කෙරෙහි වගකීමක් නැත (Klinkner 2020), එයින් අදහස් වන්නේ සත්‍යය සෙවීම සඳහා විශාල විමර්ශන කටයුතු ආරම්භ කිරීමට සහ ඒ සඳහා සාධාරණ ක්‍රියාමාර්ග බලමුලු ගැන්වීමට රාජ්‍යයන් බැඳී සිටින නමුත්, ප්‍රතිඵල අවිනිශ්චිතව පවතින්නේ නම්, මෙම විමර්ශනවල සාධනීය ප්‍රතිඵල ස්ථාපිත කිරීමට ඔවුන් බැඳී නොසිටින බවයි. බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියෙහි සමූහ මිනීවළවල් විමර්ශනය කිරීමට අදාළව තවත් විධිවිධාන ඇතුළත් කර ඇතः

- 7 වන මඟපෙන්වීමේ මූලධර්මයः අතුරුදහන් වූවන්ගේ ඉරණම සහ/හෝ ඔවුන් සිටින ස්ථානය තහවුරු කරන තුරු ඔවුන් පිළිබඳ සෙවීම අඛණ්ඩ වගකීමකි.
- 12(2) වගන්තියः "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමක් සිදුවී ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින තාක් කල්, බලධාරීන් විසින් විමර්ශන කටයුතු සිදුකිරීම අවශ්‍ය වේ".
- 12(4) වගන්තියः "පරීක්ෂණයක් පැවැත්වීමට බාධා කරන ක්‍රියාවන් වැළැක්වීමට සහ තර්ජනාත්මක දඬුවම් කිරීමට සාමාජික රාජ්‍යයන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය." මෙම විමර්ශන ස්වාධීන සහ ගුණාත්මකව පිළිගත හැකි එකක් විය යුතු අතර කරුණු නිශ්චය කිරීමට සහ වගකිව යුත්තන් හඳුනා ගැනීමට හැකියාව තිබිය යුතුය.[14]
- 24(2) වගන්තියः "බලහත්කාරයෙන් අතුරුදහන් වීමට ලක් වූ අවස්ථාව, විමර්ශනයේ ප්‍රගතිය සහ එහි ප්‍රතිඵල සහ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම සම්බන්ධයෙන් සත්‍යය දැන ගැනීමට සෑම වින්දිතයෙකුටම අයිතියක් ඇත. සෑම රාජ්‍ය පාර්ශවයක්ම මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි."
- 24(3) වගන්තිය "සෑම රාජ්‍ය පාර්ශවයක්ම අතුරුදහන් වූවන් රඳවා ඇති ස්ථාන සොයා ගැනීමට සහ ඔවුන් නිදහස් කිරීමට සහ මරණයකදී, ඔවුන්ගේ දේහ සොයා ගැනීමට, ගෞරව දැක්වීමට සහ එම දේහ නැවත ඔවුන්ගේ ඥාතීන්ට භාරදීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය."

## C. නඩු පැවරීම

**දේශීය නීතිමය ව්‍යුහය**

විමර්ශනයකින් පසු සමූහ මිනීවළක් බිහිවීමට හේතු වූ සිදුවීම පිළිබඳ විශාල වශයෙන් තොරතුරු ලැබෙන විට ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. මෙය නියාමනය කරනු ලබන්නේ

[14] Kukhalashvili and others v Georgia, Judgment, ECtHR Application Nos 8938/07 and 41891/07 (2 April 2020) para 129 - යන නඩුව විසින් තීරණය කළ පරිදි

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 9 වැනි වගන්තිය මගින් වන අතර, එහි සඳහන් වන්නේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සිදු කරන ලද, මෙම නීති සංග්‍රහය හෝ වෙනත් නීතියක් මගින් පිළිගත් වරදක් පිළිබඳ සියලුම නඩු හෝ නඩු පැවරීම් සාරාංශගත ආකාරයෙන් ඇසීමට, උත්සාහ කිරීමට, තීරණය කිරීමට සහ බැහැර කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලය සහ අවසරය ඇති අතර ඒවා මහේස්ත්‍රාත් අධිකරණයක් හෝ දිසා අධිකරණයක් මගින් දැනගත හැකි වේ. කෙසේ වෙතත්, වින්දිතයින් ඝාතනයට අමතරව, සමූහ මිනීවළක් නිර්මාණය කිරීමේ අපරාධයට වෙනම චෝදනාවක් ලෙස, කුමන ආකාරයේ දඬුවමක් සුදුසු වේද යන්න පිළිබඳ විස්තර අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඇතුළත් ව නොමැත.

අපරාධකරුවන් හඳුනා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය නොකළ ද, සාම්පලවල සාක්ෂිමය වටිනාකම ප්‍රවේශමෙන් ආරක්ෂා කළ යුතු වන්නේ එවැනි සාක්ෂි දූෂණය හෝ විනාශ වීම, එකී සාම්පල අතුරුදහන් වූවෙකුගේ ද යන්න සහ එකී පුද්ගලයා මරණයට ලක්වීමට පෙර වධ හිංසාවලට හෝ වෙනත් අපරාධවලට ලක් වූවාද යන්න නිවරිදිව තහවුරු කර ගැනීමට නොහැකි වීමට හේතු විය හැකි බැවිනි.

ව්‍යවස්ථාදායකයේ පවතින තවත් හිඩැසක් වන්නේ අධිකරණ වෛද්‍ය විශ්ලේෂණ හසුරුවන නිශ්චිත නීතියක් නොමැති වීමයි. 2017 වසරේ (The Colombo Post 2017) යෝජනා කරන ලද මරණ පරීක්ෂණ පිළිබඳ යෝජිත නීතියට අදාළව ප්‍රතිපත්තියක් සහ නෛතික රාමුවක් තිබුණ නමුත් මෙම රාමුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රසිද්ධියේ ලබාගත හැකි තොරතුරු කිසිවක් නොමැත. එය ක්‍රියාත්මක කර තිබුණා නම්, OMP හි ක්‍රියාකාරිත්වයට බලපාන අභියෝගවලට මුහුණ දීමට එය උපකාර විය හැකිව තිබුණි.ග

**ජාත්‍යන්තර නිතිමය ව්‍යුහය**

"නිසි ප්‍රමිතියකින් තොරව මළ සිරුරු බැහැර කිරීම ම" ජාත්‍යන්තර අපරාධයක් බවට පත්විය හැකි බව විද්වතුන් වන කැරොලයින් ෆෝර්නෙට් සහ නිකොල් සිලර් තර්ක කරන අතර (Fournet and Siller 2015), වත්මන් ජාත්‍යන්තර නීතිය මගින් මිනීවළ නිර්මාණය කිරීමට වඩා සමූහ මිනීවළක් බිහිවීමට තුඩු දුන් ක්‍රියාවන් අනුමත කරයි. වධහිංසා පැමිණවීම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම ගිවිසුම මගින් තහනම් කර ඇති අතර, අපයෝජනයන් සිදු වන විට නිසි දඬුවම් ලබාදීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් දේශීය නීති සම්පාදනය කිරීම අවශ්‍යව ඇත. මෙය ජිනීවා සම්මුතිය තුළ නිරවද්‍යතාවය තහවුරු කර නැවත අවධාරණය කර ඇත. (I) ජිනීවා සම්මුතිය 49 වැනි වගන්තිය; (II) 50 වැනි වගන්තිය; ජිනීවා සම්මුතිය (III) 129 වගන්තිය; ජිනීවා සම්මුතිය (IV) 146 වගන්තිය; වධහිංසාවන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2 සහ 4 වගන්ති; CED 6 වගන්තිය; සහ ජන සංහාර සම්බන්ධයෙන් ICCPR 6 වැනි වගන්තිය. ජිනීවා සම්මුතීන් තවදුරටත් ඉල්ලා සිටින්නේ නඩු විභාග සඳහා ඉදිරිපත් කිරීමට රාජ්‍ය පාර්ශවකරුවන් විසින් චූදිත අපරාධකරුවන් ක්‍රියාකාරීව සෙවිය යුතු බවයි (GC (I) වගන්තිය 49; GC (II) වගන්තිය 50; GC (III) වගන්තිය 129; GC (IV) වගන්තිය 146).

"අතුරුදහන් වූ පුද්ගලයා සෙවීම සහ අතුරුදහන් වීමට වගකිව යුතු පුද්ගලයින් පිළිබඳ අපරාධ විමර්ශනය අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් විය යුතුය" යන්න CED- මඟපෙන්වීමේ මූලධර්මවල නිශ්චිතවම සඳහන් කර ඇත (මූලධර්මය 13(1)). ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, සමූහ මිනීවළවල් හා අදාළ විය හැකි සිදුවීම්වලට රජයේ ඇතැම් නියෝජිතයන් සම්බන්ධ වීම, එයට එරෙහිව නඩු පැවරීම සහ මහජන වගවීම අඩාල කර ඇත. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර නීතියේ විෂය වන්නේ රාජ්‍යය වන බැවින්, උනන්දුව පිළිබඳ පවතින මෙම ගැටුම හිමිකම් ගෙන ඒම වැළැක්වීම සඳහා නිසැකවම ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇත. විශේෂයෙන් ම එක් ජාතික රාජ්‍යයක් තුළ පවතින යුධමය සන්දර්භයක, රාජ්‍යයක්, ජාත්‍යන්තර අධිකරණය ඉදිරියේ තමන්ට එරෙහිව හිමිකම් පෑමක් ගෙන එනු ඇතැයි සිතීම දුෂ්කර ය. න්‍යායාත්මකව වෙනත් රාජ්‍යයන්ට, ශ්‍රී ලංකාවට එරෙහිව එවැනි ප්‍රකාශයක් ගෙන ඒමට හැකි වුවද, එසේ කිරීමට තරම් ප්‍රමාණවත් දිරිගැන්වීම් ලැබී නොමැත.

## D. පවුල්වල අයිතිවාසිකම්

මෙම කොටසේ දී අප මිනිස් දේහ සමඟ කටයුතු කිරීම නියාමනය කරන නීති මොනවාද යන්න සහ විමර්ශනය අතරතුර සහ ඉන් අනතුරුව පවුල් සමඟ සම්බන්ධවන ආකාරය ආවරණය කරයි.

**දේශීය නීතිමය ව්‍යුහය**

OMP පනත මගින් අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට එකී පුද්ගලයින් අතුරුදහන් වූ අවස්ථාවන්, ඔවුන්ගේ ඉරණම සහ ඔවුන් සිටින්නේ කොහේද යන්න දැන ගැනීමට හිමිකම් ඇති බව පිළිගනී. OMP හි එක් ප්‍රධාන වගකීමක් වන්නේ අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සහතික කිරීමයි. විමර්ශනවල ප්‍රගතිය ඔවුන්ට දැනුම් දෙන ලෙසත් මළ සිරුරු ගොඩගැනීමේ කටයුතු නිරීක්ෂණය කිරීමට ඔවුන්ට ඉඩ සලසන ලෙසත් ඉල්ලා පවුල් නිතර උද්ඝෝෂණ කර ඇත. මන්නාරම සමූහ මිනීවළේ කැණීම් කටයුතු පවුලේ සාමාජිකයන්ට නිරීක්ෂණය කිරීමට අවසර දෙමින් 2022 පෙබරවාරි මාසයේ වවුනියාව මහාධිකරණය දුන් තීන්දුව මේ සම්බන්ධයෙන් අපට වැදගත් පූර්වාදර්ශයක් ඉදිරිපත් කරයි. සමූහ මිනීවළක් පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීමට බලපෑම් කරන, විටෙක ප්‍රධාන ක්‍රියාකාරීන් වන පවුල්වල බලය එය හඳුනාගෙන ඇත. OMP හි වගකීම් වලට අතුරුදහන් වූවන්ගේ ඥාතීන් සඳහා "සහන සැලසීමේ මාර්ග" සහතික කිරීම ඇතුළත් වන අතර, වින්දිතයන්ගේ පවුලේ සාමාජිකයන් විසින් ඉල්ලා සිටින්නේ නම්, එවැනි සහභාගීත්වයක් සඳහා ආරක්ෂාව සැපයීම එයට ඇතුළත් වේ.

OMP පනතේ පහත සඳහන් වගන්ති ද අදාළ වන අතර, සියල්ල එකට ගත් කළ, මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු ආරක්ෂිතව පවුල් වෙත නැවත ලබාදීම නියම කිරීම ලෙස අර්ථ දැක්විය හැකඃ

- පූර්විකාවඃ "අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ට එකී පුද්ගලයන් අතුරුදහන් වූයේ කුමන අවස්ථාවක ද සහ ඔවුන්ගේ ඉරණම සහ ඔවුන් සිටින්නේ කොහේද යන්න දැන ගැනීමට අයිතියක් ඇත."
- 2 (ඇ) වගන්තියඃ "OMP විසින් එවැනි අතුරුදහන් වූ පුද්ගලයන්ට හෝ ඔවුන්ගේ ඥාතීන්ට පිහිටවිය හැකි සහන සැලසීමේ මාර්ගය දැක්විය යුතුය."
- 13(1)(අ)(ii) වගන්තියඃ "පරීක්ෂණයක් අවසන් වූ පසු, OMP විසින් පැමිණිල්ලකට අදාළ පුද්ගලයා අතුරුදහන් වූ හෝ මිය ගිය තැනැත්තෙකු බවට නිගමනය කළ විට, එකී පුද්ගලයා නොමැති බවට සහතිකයක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ටාර් ජනරාල්වරයාට හැකි වන පරිදි, අතුරුදහන් වූ තැනැත්තෙකුගේ ඥාතියෙකුට වාර්තාවක් නිකුත් කළ යුතුය."
- 13(1)(ඇ)ඃ "විමර්ශනයක් අවසානයේදී OMP විසින් [...]
  - "(i) අතුරුදහන් වූ පුද්ගලයා මිය ගොස් ඇති අවස්ථාවක හෝ ඔහු සිටින ස්ථානය නොදන්නා විට, අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතීන්ට සහ වෙනත් පැමිණිලිකරුවෙකුට එකී පුද්ගලයා අතුරුදහන් වූ අවස්ථාව සහ ඔහුගේ ඉරණම පිළිබඳව අවශ්‍ය පරිදි දැනුම් දිය යුතුය;
  - "(ii) අතුරුදහන් වූ පුද්ගලයා සිටින ස්ථානය දන්නාවිට [...], එවැනි පුද්ගලයෙකු අතුරුදහන් වූ අවස්ථාව පිළිබඳව අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතීන්ට දැන්විය යුතුය."

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 අ(1) වගන්තිය යටතේ පිළිගත් තොරතුරු දැනගැනීමේ අයිතිය තුළ පුළුල් ලෙස සංකල්පගත කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය තුළ, අතුරුදහන් වූවන්ගේ පවුලේ සාමාජිකයන්ට තම ආදරණීයයන්ගේ ඉරණම දැන ගැනීමට ඇති අයිතිය අර්ථ දැක්විය හැකිය. තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ හදිසි ඉල්ලීම් සඳහා විශේෂ විධිවිධානයක් ද ඇතුළත් වන අතර, යම් පුරවැසියෙකු යම් පුද්ගලයෙකුගේ ජීවිතය සහ නිදහස පිළිබඳ තත්ත්වයක් ගැන විමසන්නේ නම්, ඔහුට ඒ සම්බන්ධ පිළිතුරක් පැය 48 ක් ඇතුළත ලැබිය යුතුය.

මරණ ලියාපදිංචි කිරීමේ පනතේ විශේෂ විධිවිධානවලට අනුව, අතුරුදහන් වූවන්ගේ පවුල්වලට එකී පුද්ගලයා නොමැති බවට සහතිකයක් හෝ මරණ සහතිකයක් ලබා ගැනීමට තීරණය කළ හැකිය. දැනට, සමූහ මිනීවළවල් වලට ගොදුරුවූවන්ගේ සිරුරු හඳුනාගෙන නොමැති නිසා, බොහෝ පවුල්වලට මිනිස් අස්ථි කොටස් ආරක්ෂිතව නැවත භාරදීම පිළිබඳ මෙම නීතිවලින් ප්‍රතිලාභ ලැබී නොමැත. දැනට හඳුනාගත් සිරුරු කිහිපයෙන් (චෙම්මනි සමූහ මිනීවළෙන් සොයාගත් සිරුරු 15 න් දෙකක් වැනි) දේහය නැවත ලබා ගෙන නිසි භූමදානයක් කිරීමට පවුල්වලට හැකි වූවාද යන්න කිසිවෙකුත් නොදනී. OMP පිහිටුවීමට පෙර, අතුරුදහන් වූවන් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ සහ කොමිෂන් සභා හරහා අතුරුදහන් වූ තම ආදරණීයන් සඳහා මරණ සහතිකයක් සඳහා ඉල්ලුම්

කරන ලෙස ඇතැම් පවුල්වලට බලපෑම් කර තිබුණේ විසඳුම් ඉල්ලා ඔවුන් සිදුකරන විරෝධතා අවලංගු කිරීමට බව සඳහන් කළ යුතු කරුණකි (බ්‍රිටෝ ප්‍රනාන්දු, 2022).

**ජාත්‍යන්තර නීතිමය ව්‍යුහය**

මිනිස් අස්ථි කොටස් නැවත භාර දීම සම්බන්ධයෙන්, CED හි 24(3) වගන්තිය විසින්, මියගිය පුද්ගලයින්ගේ සිරුරු එකතු කිරීම, ගබඩා කිරීම සහ ඒවා හඳුනා ගැනීම ඇතුළුව සමූහ මිනීවළවල් කැණීම සඳහා අවශ්‍ය සම්පත් වෙන් කිරීමේ වගකීම නැවත අවධාරණය කරයි. මීට අමතරව, අතුරුදහන් වූවන්ගේ දේහයන් ජීවත්ව සිටින පවුලේ සාමාජිකයන් වෙත නැවත භාර දීම සහ මරණ සහතිකයක් නිකුත් කිරීම ඇතුළු මියගිය පුද්ගලයා පිළිබඳ ලේඛනගත තොරතුරු ඉදිරිපත් කිරීමට වගකියනු ඇත. 15 වැනි වගන්තියට අනුව, මියගිය පුද්ගලයන්ගේ සිරුරු සෙවීමේදී, නැවත ඒවා මව් රටට ගෙන්වා ගැනීමේ දි සහ නැවත ඒවා ඔවුන්ගේ ඥාතින්ට භාරදීමේ උත්සාහයන්හිදී රාජ්‍යයන් විසින් එකිනෙකාට සහයෝගීතාව දැක්වීම සහ උපකාර කිරීම අවශ්‍ය වේ.

සාමාන්‍ය ජාත්‍යන්තර මානුෂීය නීතියේ, 114 රීතියේ සඳහන් වන්නේ, "ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් ඔවුන් අයත් වන පාර්ශ්වයේ ඉල්ලීම මත හෝ ඔවුන්ගේ සමීපතම ඥාතීන්ගේ ඉල්ලීම මත, මියගිය අයගේ දේහය නැවත ආපසු භාරදීමට පහසුකම් සැලසීමට උත්සාහ කළ යුතුය. කෙසේ වෙතත්, මෙම වගකීම්වලට ගරු කරන බව සහතික වීම සඳහා නිල යාන්ත්‍රණයක් නොමැත.

**E. අනුස්මරණය**

සමූහ මිනීවළක් සැමරීම හා සම්බන්ධ කටයුතු අදාළ ප්‍රජාවන් සමඟ එක්ව සිදුකරන ක්‍රියාවලියක් ඔස්සේ තීරණය කළ යුතුය. සමූහ මිනීවළවල් අනුස්මරණය කිරීම අනිවාර්ය කරන රෙගුලාසි දේශීය හෝ ජාත්‍යන්තර මට්ටමින් නොමැත. කෙසේ වෙතත්, තම ආදරණීයයන්ගේ සිරුරු නැවත භූමදාන කිරීමට පවුල්වලට ඇති අයිතිය පුද්ගලික සහ පවුල් ජීවිතය ආරක්ෂා කිරීම තුළ අර්ථ දැක්විය හැකිය. OMP විසින් 2018 දී අනුස්මරණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අනිවාර්ය නිර්දේශය තුළින් යෝජනා කළේ, කැණීම්වලින් පසු සමූහ මිනීවල ස්මාරක ස්ථානයක් ලෙස සංරක්ෂණය කළ යුතු බවයි (OMP අතුරු වාර්තාව 2018, 17). තවද, "අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මහජන සහයෝගය ගොඩනැංවීමට" සහ අනුස්මරණය කිරීම, වන්දි ගෙවීම, එවැනි සිද්ධීන් නැවත සිදුනොවන බවට සහතික වීමට සහ නීතිමය ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලය OMP හට ඇත (OMP වාර්ෂික වාර්තාව 2020). මහජන සහයෝගය ගොඩනැංවීම සම්බන්ධයෙන් පරිපූර්ණ අනුස්මරණය, අධ්‍යාපනය සහ දැනුවත් කිරීම යන කාරණා ඇතුළත් වේ.

ජාත්‍යන්තර වශයෙන් ගත් කළ, දණ්ඩමුක්තියට එරෙහිව සටන් කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ-ඔරන්ට්ලිචර් මූලධර්ම පිළිගනු ලබන්නේ සිදුවීම් පිළිබඳ සාමූහික මතකය රාජ්‍යයන් විසින් ආරක්ෂා කළ යුතු බවයි (මූලධර්මය 3). කලින් සඳහන් කළ පරිදි, මියගිය පුද්ගලයින්ගේ

සිරුරු බැහැර කිරීම පිළිබඳ සාමාන්‍ය ජාත්‍යන්තර මානුෂීය නීතියේ 115 රීතිය තුළ සඳහන් වන්නේ සොහොන්වලට ගරු කළ යුතු අතර ඒවා නිසි ලෙස නඩත්තු කළ යුතු බවයි - මෙය දැවැන්ත අනුස්මරණීය ඉලක්කයක් තුළ අර්ථ දැක්විය හැකිය.

මෙම වාර්තාව සඳහා තොරතුරු රැස්කිරීමේ දී සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගි වූ කතුවරුන් සහ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු අනුස්මරණය පිළිබඳ නිශ්චිත සඳහනක් සහිතව, පහත සඳහන් මාර්ගෝපදේශවල වැදගත්කම අවධාරණය කර ඇතඃ

- කැණීමක් සිදුකිරීමට පෙර ප්‍රදේශයේ ප්‍රජාවගේ ආරක්ෂාව සහ විමර්ශන කටයුතු සඳහා ඔවුන්ගේ සහාය සහතික කිරීම සඳහා සහ ඔවුන් කැමත්තක් දක්වන්නේ නම් ඔවුන් ද විමර්ශන කටයුතු සඳහා සහභාගී කරවා ගැනීම. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ රජයේ ආරක්ෂක අංශ විසින් කරන විමර්ශන කටයුතු පිළිබඳ ප්‍රජාව තුළ අනාරක්ෂිත හැඟීමක් ඇති කරන උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලය (කබීර් 2022). කැණීමක් ප්‍රජාවන්ට සහ ඔවුන්ගේ අරගලවලට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව විවේචනාත්මකව සිතීම ද මෙයට ඇතුළත් වේ (කොඩිකාර 2022).
- සමූහ මිනීවළවල් අනුස්මරණය කිරීමේදී, මානයන් තුනක් සමතුලිත විය යුතුයඃ එකී ස්ථාන හා අදාළ අධ්‍යාත්මික කාරණා වලට ගරු කළ යුතුය, නීතිමය වැදගත්කම (ඉදිරියේදී අපරාධයක් සිදුවීමට ඇති ඉඩකඩ ඇහිරීම) සහ දේශපාලන වැදගත්කම ( එවැනි සිද්ධීන් නැවත සිදු නොවිය යුතු දෙයක නියෝජනයක් ලෙස පෙනී සිටීම). සමූහ මිනීවළවල් වෙත සාමාන්‍ය ජනතාවට ද ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතුය (රුකී ප්‍රනාන්දු 2022).
- සමූහ මිනීවළවල් අනුස්මරණය කිරීම සඳහා ඉදිකරන ලද ස්මාරක තිබේ නම්, එම ස්ථාන වලට ගරු බුහුමන් දැක්වීමට ප්‍රජාවට අවස්ථාව සලසා දිය යුතුය. ස්මාරක හෝ සමරු ඵලක ඉතා වැදගත් වන අතර ඒවා අවම වශයෙන් අරමුණු දෙකක් ඉටු කරයි ඃ තම අහිමි වූ ආදරණීයයන් වෙනුවෙන් ශෝක වීමට එය ඥාතීන්ට පොදු සොහොන් බිමක් වන අතර එවැනි සාහසික ක්‍රියා නැවත සිදුවීම වැළැක්වීමට සිහිකැඳවීමක් ලෙස ද එය ක්‍රියාකාරීව දායක වනු ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දැනටමත් එවැනි බොහෝ ස්මාරක ඇති අතර ඇතැම් විට එක් ආඛ්‍යානයක් තවත් ආඛ්‍යානයක් ශක්තිමත් කිරීමට පමණක් ඒවා පෙනී සිටී. එබැවින් සමූහ මිනීවළවල් සඳහා සජීවී පැවැත්මක් තිබිය යුතු අතර සියලු අංගයන් ඇතුළත් පරිපූර්ණ සැමරුම් ස්ථාන බවට ඒවා පත්විය යුතුය (බ්‍රිටෝ ප්‍රනාන්දු 2022). ප්‍රජාව මූලිකව සිදුකරන අනුස්මරණ උළෙලවල් පැවැත්වීම සඳහා ඉඩප්‍රස්ථාව ලබා දීම සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් ලබා දීම පළමු ඵලදායී ආරම්භය විය හැකිය.

අනුස්මරණය සම්බන්ධයෙන් නිශ්චිත නීති පද්ධතියක් නොමැති වුවද, මෙකී ස්ථාන අනුස්මරණය කිරීමේ දි වෙනත් අයිතිවාසිකම් මෙයට අදාළ විය හැකි අතර ඒ සඳහා සහභාගීවන පවුල් සහ ප්‍රජාවන් ආරක්ෂා කිරීමට ඒවා භාවිතා කළ හැකිය. එවැනි අයිතිවාසිකම්වලින් කිහිපයක් පහත දැක්වේ ඃ

- ආගමික සහ ඇදහීමේ නිදහස භුක්තිවිඳීමේ අයිතිය (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි වගන්තිය)
- භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස භුක්තිවිඳීමේ අයිතිය (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි වගන්තිය);
- පුද්ගලික ජීවිතයට ඇති අයිතිය[15]

කෙසේ වෙතත්, සැමරීමට සමගාමීව, ප්‍රජාවන්ගේ මූලික සමාජ-ආර්ථික අවශ්‍යතා සලකා බැලිය යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. අනුස්මරණය සංහිඳියාව සඳහා පදනම තහවුරු කිරීමට උපකාරී වන අතර, උතුරේ සහ නැගෙනහිර ප්‍රජාවන් යුද්ධයේ ප්‍රතිවිපාකවලින් මෙන්ම පොදු ජන ජීවිත තුළ දිගින් දිගටම සිදුවන මිලිටරිකරණයෙන් අසමාන ලෙස පීඩාවන්ට ලක්වෙති. අනුස්මරණය සඳහා යොදවන අරමුදල් ප්‍රාදේශීය ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවන් හා සංවේදී විය යුතුය. කතුවරියක සහ ක්‍රියාකාරිනියක වන ත්‍යාගි රුවන්පතිරණ යෝජනා කර ඇත්තේ මෙම ගැටළුවලට විසඳුම් ලබා දෙන ස්මාරක මගින් සමාජයේ යහපත උදෙසා ද යම් සේවයක් කළ හැකි බවයි. ස්මාරකයක් ලෙස මෙන්ම ප්‍රජාවගේ දැඩි අවශ්‍යතාවක් සපුරාලීම සඳහා ඉදිකරන ලද නේපාලයේ ජල පොම්ප පද්ධතිය මේ සඳහා ආදර්ශයක් ලෙස ඇය පෙන්වා දෙයි (රුවන්පතිරණ 2016, 5).

15 පුද්ගලිකත්වය සඳහා ඇති අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තහවුරු කර නොමැති අතර, එය ව්‍යවස්ථාමය අර්ථ නිරූපණය සහ නඩු නීතිය මගින් ආරක්ෂා කර ඇත. වැඩි විස්තර සඳහා, Centre for Policy Alternatives, "Right to Privacy in Sri Lanka", September 2020 at 11-13. බලන්න.

## 4. සාකච්ඡාව සහ යහ භාවිතයන්

සමූහ මිනීවළක් සොයා ගැනීම සහ පසුව එහි වූ මළසිරුරු ගොඩගැනීම සමාජයකට සාමූහික අවස්ථාවක් වන අතර ඒ මගින් පොදු අවකාශය තුළ බරපතල ප්‍රශ්න ගණනාවක් අසනු ලැබේ. බොහෝ විට සමූහ මිනීවළකට තුඩු දුන් තත්ත්වයන් පිළිබඳ ඓතිහාසික විමර්ශන වත්මන් දේශපාලන පසුබිම පිළිබඳ මතභේද සඳහා අරගල කරන ස්ථානයක් බවට පත්ව ඇත. මෙම ස්ථාන මිනිස් අවශේෂ අඩංගු පූජනීය ස්ථාන ලෙස මෙන්ම අනාගත නීතිමය සාක්ෂි ලෙස ද පැටලිලි සහිත ස්වභාවයක් උසුළයි. කැණීම් ක්‍රියාවලිය සහ ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සහ දේශපාලනයේ සමූහ මිනීවළ සන්දර්භගත කිරීම සඳහා, සමූහ මිනීවළක කැණීම් කටයුතු සිදුකරන විට අවදානමට ලක්ව ඇති දේ ගැන අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

කැණීම් බොහෝ විට නව ප්‍රශ්න සහ ගැටුම් ඇති කරන අතර විවිධ අවශ්‍යතා සහ යහපත සඳහා එය මෙහෙය විය යුතුය යුතුය. නිදසුනක් වශයෙන්, නඩු පැවරීමට නැඹුරු වූ සමූහ මිනීවළවල් පිළිබඳ විමර්ශන කටයුතු ඇතැම් විට මියගිය තම ආදරණීයයන් යළි භූමදාන කිරීමට කැමැත්තෙන් සිටින පවුල්වල අවශ්‍යතා සමඟ ගැටිය හැක. විද්වතුන් වන Eric Stover සහ Rachel Shigekane විසින් වළදැමූ සිරුරුවල අස්ථි කොටස් සාක්ෂි ලෙස සැලකීම තුළින් යුධ අපරාධ හා සම්බන්ධ නඩු විභාග, පවුල්වල අවශ්‍යතා නොසලකා හැරිය හැකි ආකාරය විස්තර කර ඇත (Stover and Shigekane 2002). නිදසුනක් වශයෙන්, Srebrenica සමූලඝාතනයෙන් පසු කොසෝවෝහි සමූහ මිනීවළක් සම්බන්ධයෙන්, නඩු පවරන්නන් අවධානය යොමු කළේ වින්දිතයන්ගේ අනන්‍යතාවය කෙරෙහි නොව ඔවුන් සිවිල් වැසියන් ද යන්න සහ මරණ විශාල ප්‍රමාණයක් භූමියේ විවිධ ස්ථානවල වළලා තිබීම සහ ඒවායේ යම් ක්‍රමානුකූල බවක් පෙන්නුම් කළ නිසා ඔවුන් ඝාතනය කරන ලද ආකාරය අනුව යුද අපරාධයක් සිදු වූ බව පෙන්නුම් කළ හැකිද යන්නයි. (Stover and Shigekane 2002, 857). එපමණක් නොව, රට තුළ DNA දත්ත ගබඩාවක් නොමැතිකම හේතුවෙන් සිරුරු හඳුනා ගැනීම බොහෝ විට ඉතා අපහසු වේ.

වින්දිතයන් තම ඥාතීන් විසින් හඳුනාගත හැකි හඳුනාගැනීමේ ලියකියවිලි හෝ භාණ්ඩ රැගෙන නොයන විට, සිරුරුවලින් අතිමහත් බහුතරයක් හඳුනාගැනීමට නොහැකිව ඇත. 1995 දී රුවන්ඩාවේ කිබුයේ සමූහ මිනීවළ ගොඩගැනීමේදී මෙය සිදු වූ අතර එහිදී හමු වූ වින්දිතයන් 500 කින් සිරුරු 17 ක් හඳුනා ගන්නා ලදී (ස්ටෝවර් සහ ෂිගෙකේන් 2002, 851). හඳුනා ගත් වින්දිතයින්ගෙන් දෙදෙනෙකුට පමණක් ඔවුන්ගේ සිරුරු නැවත භූමදාන කළ හැකි ඥාතීන් ජීවතුන් අතර විය. මෙම සංඛ්‍යා පෙන්වා දෙන්නේ හඳුනා ගැනීම සහ මිනිස් සිරුරු නැවත පවුල් වෙත භාරදීම සම්බන්ධයෙන් ප්‍රජාව තුළ ඇති අපේක්ෂාවන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයයි.

ස්ටෝවර් සහ ෂිගෙකේන් තර්ක කරන්නේ පවුල්වලට තම ආදරණීයයන්ගේ ඉරනම ගැන 'දැන ගැනීමට ඇති අයිතියට' වඩා වැඩි යමක් තිබිය යුතු බවත්, එම නිසා ඔවුන්ගේ සිරුරු

ගොඩගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ඔවුන්ට හැකි විය යුතු බවත්ය. සමූහ මිනීවළවල් කැණීම සහ සිරුරු ගොඩ ගැනීම සඳහා තම රජයට බලපෑම් කරන්නේ බොහෝ විට පවුල් වන නමුත් විමර්ශන කටයුතු ආරම්භ වූ පසු ඔවුන් ව අමතක වේ. 1990 ගණන්වල මුල් භාගයේදී ගොතමාලාවේ සමූහ මිනීවළක කැණීම් කටයුතු ආරම්භ කරන විට, අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින් එවැනි ස්ථානයක වැඩ කරන ආකාරය දැක බලා ගැනීමට, මුළු ගම්මානයම පැමිණි ආකාරය ස්ටෝවර් සහ ෂිගෙකේන් සිහිපත් කරයි. වසර ගණනාවක් තිස්සේ ඔවුන්ට හමුදාවෙන්, පොලිසියෙන් සහ උසාවියෙන් තම ආදරණීයයන් පිළිබඳ ලබා දුන්, ඔවුන් ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු වලට වඩා වෙනස් විනිවිදභාවයක් ලබා දුන් බැවින් මෙම අත්දැකීම අතුරුදහන් වූවන්ගේ පවුල්වලට වැදගත් විය. කැණීම් කටයුතු නිරීක්ෂණය කිරීම තුළින්, පවුලේ ඇතැම් සාමාජිකයින්ට තමන්ගේ අතුරුදහන් වූ ඥාතියෙකු සොයා ගැනීමේ ක්‍රියාවලියේදී අධිකරණය බලය සහ එහි කටයුතු පිළිබඳ හැඟීමක් නැවත ලබා ගත හැකි වනු ඇත (Stover and Shigekane 2002, 850). කෙසේ වෙතත්, පවුල්වල සහභාගීත්වය මනාව සංවිධානය නොකරන්නේ නම්, එය සූරියකන්දේ ගොඩගැනීමේ සිද්ධියේ දී මෙන් සාක්ෂි දූෂණය වීමට ද හේතු විය හැක. සැබවින්ම, මෙකී අත්දැකීමේ ඇති පරස්පර අවශ්‍යතාවන් තේරුම් ගැනීමට, විවිධ හඬවල්වලට ඇහුම්කම් දිය යුතුව ඇත. සමූහ මිනීවළවල් පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීමේ දි දිවි ගලවා ගත් අය, විපතට පත් වූවන්ගේ පවුල්වල අය, සමූහ මිනීවළට යාබදව වෙසෙන ප්‍රජාව, මාධ්‍යවේදීන්, දේශපාලනඥයන්, අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු තවත් බොහෝ පිරිසක් ඇතුළත් වේ. අපරාධකරුවන් ද මෙම ක්‍රියාකරුවන් අතර කොටසකි. සමූහ ප්‍රචණ්ඩකාරී සිදුවීම් අනුස්මරණය කිරීම පිළිබඳව ලියමින් විද්වතුන් වන Elizabeth Anstett සහ Jean-Marc Dreyfus වින්දිතයන් සහ අපරාධකරුවන් දිගු කාලීන සබඳතාවයක් පවත්වාගෙන යන අය ලෙස සලකන අතර සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාව "සිදුවීමක් ලෙස නොව, මියයාම සහ මිය ගිය සිරුරුවලට සැලකීම එකිනෙකට වෙනස් නමුත් නිසගයෙන්ම එකිනෙකට සම්බන්ධ වූ අවස්ථාවන්ගෙන් යුත් දිගුකාලීන ක්‍රියාවලියක් ලෙස සලකයි" (Anstett and Dreyfus 2014, 7). සමූහ මිනීවළක් ගොඩගැනීම සහ සිත කම්පනයට පත් කරන ඒ තුළ සොයා ගන්නා අස්ථි කොටස්වලට අතීතයේ සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් හෙළිදරව් කළ හැකි නමුත්, මෙම ප්‍රචණ්ඩත්වයේ වේදනාවන් සමඟ ජීවත් වන ප්‍රජාවගේ දුක්බර මතකයන් ඒ තුළින් නැවත, නැවත මතුවිය හැකිය. මෙකී ස්ථාන කැණීම සහ වළලා තිබුණු මිනිස් සිරුරු ගොඩගැනීම, පශ්චාත් ගැටුම් තත්ත්වයක ප්‍රජාව ගොඩනැංවීමේ ක්‍රියාවලියේ සියුම් අංගයකි. රජය විසින් අපට පිළිගන්නා ලෙස බල කරන සිවිල් යුද්ධය පිළිබඳ ආඛ්‍යානය විසින් අතීතයේ (කරුණාරත්න, 2021) අනෙකුත් ආඛ්‍යාන මකා දැමීමට සක්‍රියව උත්සාහ කරන සන්දර්භයක් තුළ, මෙම සාමූහික අවස්ථාවන්, වඩාත් පරිපූර්ණ අනුස්මරණ ක්‍රියාවලියක් සඳහා දොරක් විවෘත කළ හැකි අතර එමඟින් වඩාත් ස්ථායී අනුස්මරණ ක්‍රියාවලියක් වෙත ප්‍රවේශ විය හැකි වනු ඇත. කෙසේ වෙතත්, මෙය යථාර්තයක් වීමට නම්, මෙම ක්‍රියාවලීන් මෙහෙයවන ක්‍රියාකාරීන් (OMP සහ රජය වැනි) තවමත් සියලුම ප්‍රජාවන් අතර, විශේෂයෙන් ම දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර සුජාතභාවය ඇති කර ගත යුතුය.

රාජ්‍යයන්, බලපෑමට ලක් වූ විවිධ ප්‍රජාවන් සහ ජාත්‍යන්තර සංවිධාන විසින් එකිනෙකා පරයමින් ඉදිරිපත් කරන ඉල්ලීම් සැලකිල්ලට ගෙන, සමූහ මිනීවළවල් පිළිබඳ සිදුකරන විමර්ශන පුළුල් කිරීම සඳහා, සිවිල් සමාජය තුළ සහ අතුරුදහන් වූවන්ගේ පවුල් අතර පුළුල් සංවාදයක ආරම්භක විකල්පයන් ලෙස පහත සඳහන් මූලධර්ම ඉදිරිපත් කර ඇත. මෙම මූලධර්මයන් බෝර්න්මවුත් ප්‍රොටර්කෝලයෙහි ඇතුළත් නිර්දේශයන් යම් ප්‍රමාණයකට වෙනස් කර ඇත.

1. **"කිසිදු හානියක් නොකරන්න" යන ප්‍රවේශය අනුගමනය කරන්නඃ** විමර්ශන කණ්ඩායම් හැකිතාක් දුරට, එයට සම්බන්ධ සියලුම ප්‍රජාවන් ඇතුළත් කිරීමට උත්සාහ කළ යුතු අතර, කම්පනයට පත් වූ පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදුකිරීමේ දි මානව හිමිකම් විමර්ශනවලදී භාවිතා කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය (අතිරේක මාර්ගෝපදේශ සඳහා 4 වන ඇමුණුම බලන්න).
2. **ශාරීරික හා චිත්තවේගීය ආරක්ෂාවඃ** සමූහ මිනීවළට මනා ආරක්ෂාව ලබා දිය යුතුය. තවද, ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීමට සහ විමර්ශනය සමඟ සම්බන්ධව කටයුතු කිරීමට ඔවුන් දිරිමත් කිරීමට, ඒ අවට වෙසෙන ප්‍රජාව එකී ස්ථානය සහ එහි ආරක්ෂාව පිළිබඳව දැනුවත් විය යුතුය (Klinkner 7). සමූහ මිනීවළකට තුඩු දුන් සිද්ධීන් සම්බන්ධයෙන් ඇතැම් විට ලබා ගත හැකි එකම සාක්ෂිය වනුයේ ඔවුන්ගේ වාචික සාක්ෂි බැවින්, වින්දිතයන් හඳුනා ගැනීමට උපකාර කිරීම සඳහා අවට ප්‍රජාවගේ මැදිහත් වීම අවශ්‍ය වේ.
3. **ප්‍රජාවගේ මැදිහත්වීම කේන්ද්‍රගත කිරීමඃ** අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහ වින්දිතයන් බවට පත් විය හැකි අයගේ පවුල්වලට විමර්ශන ක්‍රියාවලියට සහභාගී වීමට සහ ඔවුන් කැමති නම්, එම ස්ථානයේ කැණීම් නිරීක්ෂණය කිරීමට අවසර ලබා යුතුය. සමූහ මිනීවළක විමර්ශන කටයුතු සඳහා සහභාගීවීමට ප්‍රජාවක් කැමැත්තක් නොදක්වන්නේ නම්, එම කැමැත්තට ද ගරු කළ යුතුය.
4. **ස්වාධීනත්වය සහ අපක්ෂපාතීත්වයඃ** විමර්ශනයට නායකත්වය දෙන කණ්ඩායම ඔවුන්ගේ ක්‍රියාකාරකම් "දේශපාලන, ආගමික හෝ වාර්ගික පක්ෂග්‍රාහී හෝ බලපෑමට අවනත නොවන" බවට සහතික විය යුතුය (ක්ලින්ක්නර් 7). නීතියේ ආධිපත්‍යය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්, රජය විසින් පාලනය කරනු ලබන ආරක්ෂක අංශ වගකියන ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ, ඇතැම් ප්‍රජාවන් විසින් අධිකරණ වෛද්‍ය විමර්ශන කණ්ඩායම් පක්ෂග්‍රාහී ලෙස කටයුතු කරනු ඇතැයි අනුමාන කෙරේ. එබැවින් මෙම ප්‍රජාව තුළ පිළිගැනීම ගොඩනැගීම සඳහා මෙකී කණ්ඩායම් විවිධ ප්‍රජාවන් නියෝජනය කරන සාමාජිකයන් සහ ජාත්‍යන්තර ප්‍රවීණයන් වැනි බාහිර ක්‍රියාකාරීන් ඇතුළු විවිධ පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතුය. කැණීම් කටයුතු වලදී මානව හිමිකම් සංවිධාන සහ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය නිරීක්ෂකයින් ලෙස කටයුතු කිරීම ද අතුරුදහන් වූවන්ගේ පවුල්වල අවශ්‍යතාවන්ට ගරු කිරීම සහතික කිරීම සඳහා වැදගත් වේ. 2019 ආණ්ඩු මාරුවෙන් පසු OMP සඳහා ලබා දෙන සම්පත් ක්‍රමිකව අඩු කළ ද මෙය අඛණ්ඩව කළ යුතුය. විශේෂයෙන් ම එකිනෙකා පරයා ගොඩනැගෙන ආඛ්‍යාන වලින් සමන්විත සන්දර්භයක් තුළ, සමූහ මිනීවළක් පිළිබඳ නිර්මාණය වන ආඛ්‍යානය පිළිබඳව ද අවධානයෙන් සිටීම වැදගත්ය. එක කතාවක් අනෙක මත තහවුරු නොකර, මෙම සමූහ මිනීවළවල් සහ ඒවා

නිර්මාණය කළ සංකීර්ණ සිදුවීම් අමතක නොවන බව සහතික කිරීම සඳහා, ප්‍රජාව විසින් ලබා දෙන වාචික සාක්ෂි හෝ භෞතික සාක්ෂි ඇතුළු සාක්ෂිමය දත්ත සුරක්ෂිත කිරීම ද ඉතා වැදගත් ය.

5. **රහස්‍යභාවය:** විමර්ශන කටයුතුවලට සහභාගී වන සිවිල් වැසියන්ගේ රහස්‍යභාවය සහතික කළ යුතුය; රහස්‍යභාවයේ විෂය පථය නිර්ණය කිරීම අත්‍යවශ්‍ය කරුණු දෙකකින් මෙහෙයවීම අත්‍යවශ්‍ය වේ: (i) සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ (ii) සත්‍යයට සහ යුක්තියට වින්දිතයන්ට ඇති අයිතිය.
6. **විනිවිදභාවය:** විමර්ශනයේ ප්‍රතිඵල පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතුය. හඳුනා ගත් පසු සිරුරු නැවත ඔවුන්ගේ පවුල් වෙත භාර දිය යුතුය.
7. **සන්නිවේදනය:** විමර්ශනයේ සෑම අදියරකදීම බලපෑමට ලක් වූ ප්‍රජාව සමඟ පැහැදිලි සහ අඛණ්ඩ සන්නිවේදනය ඉතා වැදගත් වේ. සමූහ මිනීවළ පිළිබඳ විමර්ශන කටයුතු සහ ඒවා අනුස්මරණය කිරීම යන කාර්යයන් දෙකෙහිදීම, එහි භාවිතයන් වටා භාවිතා වන පාරිභාෂික වචන මාලාව සහ සියලුම නිල භාෂාවන්ගෙන් එහි පරිවර්තනයන් පිළිබඳව අවධානයෙන් සිටීම වැදගත් වේ.
8. **යථාර්ථවාදී අපේක්ෂාවන්:** විපතට පත් ප්‍රජාවන් අපේක්ෂා කරන අරමුණු ඉටුකිරීම සඳහා සමූහ මිනීවළක් කැණීමක දී අත්කර ගත හැකි දේ පිළිබඳව විමර්ශන කණ්ඩායම යථාර්ථවාදී නොවන පොරොන්දු ප්‍රජාවට ලබා නොදිය යුතුය.

**5. නිගමනය**

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමේදි මුහුණදීමට සිදුවන දේශපාලන හා නීතිමය අභියෝග රැසක් ඇත. එම නිසා පශ්චාත්-ගැටුම් සමයේ තිරසාර සංහිඳියාවක් ගොඩනැගීම සඳහා සමූහ මිනීවළවල් විමර්ශනය කිරීමේ සහ අනුස්මරණ කිරීමේ අවශ්‍යතාව විවේචනාත්මකව ඇගයීමට ලක් කිරීමට සිදුවේ. එරික් ස්ටෝවර් සහ රේචල් ෂිගාකේන් වැනි විද්වතුන් අපට යෝජනා කරන්නේ නඩු පැවරීමට වඩා වින්දිතයන්ගේ පවුල්වල අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන ප්‍රවේශයන් සලකා බැලීම වැදගත් බවයි. Adam Rosenblatt ඔහුගේ කෘතියක් වන Digging for the Disappeared: Forensic Science after Atrocity, හී නඩු පැවරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අරමුණු කොට ගෙන සිදුකරන ගොඩගැනීම් සඳහා වෙනස් ප්‍රවේශයක් ලෙස 'පවුල් කේන්ද්‍රීය' අධිකරණ වෛද්‍ය කටයුතු හඳුන්වාදීම ගැන සාකච්ඡා කරයි. මන්නාරමේ සිදුකෙරෙන විමර්ශනයන් සඳහා පවුල් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් පෙන්නුම් කරන අතර, දේශීය හා ජාත්‍යන්තර යන නීති දෙකම ක්‍රියාත්මක කිරීමට දේශපාලනමය බාධාවන් පවතී. විශේෂයෙන් ම රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකුට යුද අපරාධ චෝදනා එල්ල වී ඇති ශ්‍රී ලංකාව වැනි අහිතකර දේශපාලන වතාවරණයක් පවතින රටක් තුළ, වැඩ කරන රජයේ නිලධාරීන් විමර්ශනවලට අනුකුලව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කිරීම යථාර්ථවාදී විය නොහැක.

මෙම වාර්තාවේ සමීක්ෂණය කරන ලද විමර්ශන හත තුළම, තම සමීපතමයන් සමූහ භූමදානයකට ගොදුරු වන්නට ඇතැයි විශ්වාස කරන අතුරුදන් වූවන්ගේ පවුල්වලට, ඔවුන්ට අවශ්‍ය පිළිතුරු කිසිවක් ලබා දීමට සමත්වී නැත. බොහෝ විට සත්‍ය සෙවීම සහ නඩු පැවරීම යන කාරණා දෙකම අරමුණු කරගත් විමර්ශනයක විවිධ අරමුණු පැහැදිලිව අර්ථ දැක්වීම වැදගත් වේ. මෙම අරමුණු දෙක අතර සම්බන්ධය සංකීර්ණ වන අතර ලොව පුරා පවතින සත්‍ය කොමිෂන් සභා තුළ විවිධ වූ ආදර්ශ ගණනාවකින් එය ප්‍රකාශ කර ඇත.[16] ගෝතමාලාවේ දී, සත්‍යය හෙළි කිරීමට අපරාධකරුවන් දිරිමත් කිරීමේ උත්සාහයේදී, සත්‍ය කොමිසමේ නඩු විභාගයේ කොටසක් ලෙස ලබා දුන් වාචික සාක්ෂි නඩු පැවරීමේ සාක්ෂි ලෙස භාවිතා කළ නොහැකි බව තීරණය කරන ලදී (Hartnett 2016). දකුණු අප්‍රිකාවේ, සත්‍ය කොමිසම විසින්, සහයෝගයෙන් ක්‍රියා කළ පුද්ගලයන්ට අවශ්‍ය ශක්තිය ලබා දීමෙන් අපරාධ නඩු පැවරිය හැකි සංඛ්‍යාව අඩු කිරීමට පෙරහනයක් ලෙස ක්‍රියා කළේය. ඊට ප්‍රතිවිරුද්ධව, පේරුහි සත්‍ය කොමිසම විසින් අපරාධ නඩු පවරන්නන් වෙනුවෙන් සාක්ෂි ලබා දෙන ලදි (Hartnett 2016).

[16] Connor Hartnett ගේ කෘතියක් වන The Relationship between Truth-Seeking and Prosecution මෙම සංකීර්ණ තේමාව රුවන්ඩාවේ, කොලොම්බියාවේ සහ තවත් බොහෝ රටවල සත්‍ය කොමිෂන් සභා වල විවිධ ආකෘතීන් ගවේෂණය කරමින් සංසන්දනාත්මක ආකාරයකින් වැඩිදුර විස්තර කරයි.

පවතින දේශපාලන අභියෝග සහ රජය විසින් අපරාධකරුවන්ට දඬුවම් ලබා නොදීමෙන් ඔබ්බට, පවතින නීතිමය හිඩැස් ද සමූහ මිනීවළවල් විමර්ශනයට බාධාවක් වී ඇත. සාක්ෂි සඳහා එහි අනුපිළිවෙල වාර්තා කරන කාලානුක්‍රමික ලියකියවිලි හෝ ලිඛිත සාක්ෂි පිළිබඳ පැහැදිලි නියාමනයක් නොමැතිකම නිසා සමූහ මිනීවළවලින් එකතු කරන ලද සාක්ෂි වල තත්ත්වය, එය එකතු කර සංරක්ෂණය කළ ආකාරය සහ විශ්ලේෂණය සඳහා යවන ලද ස්ථානය පිළිබඳ විනිවිදභාවයක් නොමැතිකමට හේතු වී තිබේ. රජය විසින් සිදුකරන පැහැදිලි කිරීම් කෙරෙහි විශ්වාසයක් නොමැතිවීමට මෙය ද හේතු වී ඇත. 2012 වසරේ මාතලේ පරීක්ෂණයේ දී සමූහ මිනීවළවල් පිළිබඳ එකිනෙකට පරස්පර ආඛ්‍යාන මතු වූයේ විවිධ සාක්ෂි විශ්ලේෂණවලින් සහ ඇමරිකාවේ රසායනාගාරයකට යවන ලද සාක්ෂි විකෘති වී ඇති බවට ඇති ඉඩකඩ හේතුවෙනි.

අනෙකුත් නීතිමය හිඩැස් අතරට අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සහ පොලීසිය සහ අධිකරණ ව්‍යුහයන් අතර පැහැදිලි සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් නොමැතිකම ඇතුළත් වේ. සමූහ මිනීවළවල් විමර්ශනය කිරීම සඳහා විශේෂඥයින් පත් කිරීමට බලය ඇති බැවින් OMP හි භූමිකාව අධිකරණ ව්‍යුහයන් සමඟ එක මත එක පතිත වන ස්වභාවයක් ඇත. එහෙත්, මෙම භූමිකාව විමර්ශකයින්ගේ දේශීය බල ධුරාවලිය සමඟ ඒකාබද්ධ වන්නේ කෙසේද යන්න අපැහැදිලි ය. තුන්වන බාධාව වනුයේ සමූහ මිනීවළක් හා සම්බන්ධ විමර්ශන කටයුතු අවසන් කළ හැක්කේ කවදාද යන්න තීරණය කිරීමේ නීතිමය හිඩැස්ය, එය දෙවන කොටසේ සඳහන් කරන ලද සමූහ මිනීවළවල් හා සම්බන්ධ විමර්ශන කිහිපයක ම සිදුවිය. සමූහ මිනීවළවල් සහ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ ජාත්‍යන්තර නීති විද්‍යාව තහවුරු කරන්නේ විමර්ශන උත්සාහයන් යනු "ප්‍රතිඵල මූලික කරගත් දෙයක් නොව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා සම්බන්ධ වගකීමක්" බවයි (Klinkner 2020, 5). මින් අදහස් වන්නේ සාධනීය විමර්ශනයක් සිදුකිරීම සහ අතුරුදහන් වූවන් සොයා ගැනීම, වින්දිතයන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ දේහයන් නැවත ඥාතීන් වෙත භාරදීම සඳහා "ගතහැකි ක්‍රියාමාර්ග " ගැනීමේ වගකීම රජය සතු බවයි (CIHL රීතිය 117). දෙවන කොටසේ ඇතුළත් කරන ලද සමූහ මිනීවළවල් සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශන කිහිපයක් අවිනිශ්චිත ප්‍රතිඵල සමඟ අතරමඟ නතර කර ඇත. රජය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග ඵලදායී විමර්ශනයක වගකීම ඉටු කර ඇති බවට පැහැදිලිව තහවුරු කිරීමට තවමත් නොහැකිව ඇත.

එවැනි බාධා පවතින අතර ම, මෙම ස්ථාන අනුස්මරණය කිරීම සඳහා සහ ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ සංහිඳියාවේ විශාල අරමුණු අත්පත් කරගැනීම සඳහා වෙනත් ක්‍රියාමාර්ග ගත හැකිව ඇත. විමර්ශනවලදී අපේක්ෂිත ප්‍රතිඵල පෙන්නුම් නොකළ ද, සමූහ මිනීවළවල් විපතට පත් ප්‍රජාවන් කෙරෙහි සහ ශ්‍රී ලංකීය ඉතිහාසය පිළිබඳ පොදු ජනතාව තුළ ඇති අවබෝධය කෙරෙහි ඇති කරන පරම්පරා අනුව යන බලපෑම සලකා බලන අතරම, අනුස්මරණය සඳහා සිදුකරන ක්‍රියාකාරකම් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා හැකි. සාහිත්‍යමය, දෘශ්‍ය සහ බහුමාධ්‍ය නිර්මාණ මගින් සමූහ මිනීවළක් සොයාගැනීමෙන් පසු වින්දිතයන්ගේ පවුල් තුළ අවුළුවාලන වේදනාවන්

ප්‍රතිනිර්මාණය කිරීමට ද අවස්ථාව සැලසිය හැකිය. මෙම සමූහ මිනීවළවල් තුළ ඇති වේදනාකාරී යථාර්ථය ඔවුන්ට තේරුම්ගත හැකිය.[17]

සමූහ මිනීවළවල් පිළිබඳ කිසිදු හැඟීමක් නැති හෝ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට කිසිදු සහායක් නොදක්වන ප්‍රජාවගේ සංහකම්පනය මේ තුළට ආකර්ශනය කර ගැනීමට මෙකී කලාත්මක නිර්මාණයන් ඔස්සේ හැකිවනු ඇත. සමූහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ විශාල පිරිසක් තුළ, තනි මාතෘකාවන් පිළිබඳ කතාබහ යටපත් නොකර එකී වින්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලැබිය යුතු ගෞරවය ලබා දීම සඳහා පසුබිමක් ඒ තුළින් නිර්මාණය කළ හැකි වනු ඇත. යුක්තිය ඉටුකිරීම සඳහා වඩාත් පිළිගත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා පවතින බාධාවන් සැලකිල්ලට ගෙන, මෙම ගැටළු පිළිබඳ සමාජ දැනුවත්භාවය පෝෂණය කිරීම අවශ්‍ය වන අතර එය සමූහ මිනීවළවල්වලට ගොදුරු වූවන්ගේ පවුල් වෙනුවෙන් පෙනී සිටීමේ එක් අංගයකි. ඉදිරියේදී තව තවත් සමූහ මිනීවළවල් සොයා ගැනීමට ඇති ඉඩ කඩ වැඩි බැවින්, ශ්‍රී ලංකාවේ සමූහ මිනීවළවල් පිළිබඳ ඓතිහාසික හා නීතිමය තොරතුරු මධ්‍යගත කිරීම මෙම ගැටලුව සම්බන්ධයෙන් වැඩිදුර පර්යේෂණ සිදුකිරීම සඳහා මෙන්ම උද්දේශන ක්‍රියාකාරකම් සඳහා පසුබිම සකසනු ඇතැයි අපේක්ෂා කෙරේ.

---

17 ඇටකාමා කාන්තාරයේ තම පවුලේ සාමාජිකයින්ගේ දේහයන් සොයන කාන්තාවන්ගේ දුක්ඛිත තත්ත්වය ගවේෂණය කරන චිලී චිත්‍රපට අධ්‍යක්ෂක Patrizio Guzman විසින් නිර්මාණය කළ Nostalgia for the Light වාර්තා චිත්‍රපටය උදාහරණයකි.

1 වන ඇමුණුම - හඳුනාගත් සමූහ මිනීවළවල් වල අකාරාදී වගුව

| | ස්ථානය | වාර්තා වූ දවස | සොයාගැනීමේ ඉතිහාසය | විමර්ශනය | සොයාගත් මළසිරුරු සංඛ්‍යාව | සැක සහිත වින්දිතයන් සහ හේතුකාරක සිදුවීම | මූලාශය |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංකුඹුර (මධ්‍යම පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | අධිකරණ නියෝගය මත මළ සිරුරු ගොඩගැනීම සිදුකරන ලද නමුත් නිල විමර්ශනයක් සිදුකළ බවට පොදු වාර්තා නොමැත | 36 | 1989 1989 පොලිසිය විසින් සිදුකරන ලද ඝාතන | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010;<br>1994 මානව හිමිකම් පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය වාර්තා |
| 2 | අඹගහහේනකන්ද (සබරගමුව පළාත) | 1998 | 1994-1996 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | 2014<br>ශ්‍රී ලංකා රජය 1998;<br>ඉලංගමුව 2014 |
| 3 | බටපොල (දකුණු පළාත) | 2004 | අදාළ නොවේ | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 4 | මඩකලපුව (නැගෙනහිර පළාත) | 2014 | මඩකලපුව දිස්ත්‍රික්කයෙන් සමූහ මිනීවළක් සොයා ගැනීමට සිවිල් ප්‍රජාවගේ ඉල්ලීම් හේතු විය. | | | 1992 දී මඩකලපු දිස්ත්‍රික්කයේ මයිලන්තනි ගම්මානයේදී දෙමළ සිවිල් වැසියන් 35 දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් සොල්දාදුවන් 21 දෙනෙකුගේ නඩු විභාග යට සම්බන්ධයක් ඇත (1994 එක්සත් ජනපද ජාතික වාර්තාව) | ඉලංගමුව 2014; විජේදාස 2019 |
| 5 | බර්මුල්ල (සබරගමුව පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ශ්‍රී ලංකා රජය 1998;<br>ඉලංගමුව 2014 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 | වෙම්මනි (උතුරු පළාත) | 1998 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 1998-2006 | 15 | 1995-6 යාපන අර්ධද්වීපයේ හමුදා මෙහෙයුම්වලදී ශ්‍රී ලංකා හමුදාව විසින් මරා දමන ලද දෙමළ සිවිල් වැසියන් | ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |
| 7 | හීන්දෙලිය, දික්වැල්ල (දකුණු පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014 |
| 8 | දියදවකැලේ, දෙනිවි (සබරගමු පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014 |
| 9 | ඇසැල්ල (බස්නාහිර පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | මළ සිරුරු ගොඩගැනීම සිදුකරන ලද නමුත් නිල විමර්ශනයක් සිදුකළ බවට පොදු වාර්තා නොමැත | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |
| 10 | හම්බන්තොට (දකුණු පළාත) | 2004 | අදාළ නොවේ | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 11 | හෝකන්දර (බස්නාහිර පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | මළ සිරුරු ගොඩ ගැනීම සිදුකරන ලද නමුත් නිල විමර්ශනයක් සිදුකළ බවට පොදු වාර්තා නොමැත | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |
| 12 | යාපනය, තුරෙයිඅප්පා ක්‍රීඩාංගණය (උතුරු පළාත) | 1999 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 1999 | 49 | 1987 දී ඉන්දීය සාම සාධක හමුදාව විසින් උතුරු පළාත අත්පත් කර ගැනීමේදී මියගිය දෙමළ වින්දිතයන් | ඉලංගමුව 2014, එක්සත් ජනපද ජාතික වාර්තා 2000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | කලුවංචිකුඩි (නැගෙනහිර පළාත) | 2014 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 2014 වසරේ කැණීම් කිරීමට නියෝග ලබාදී ඇතත් විමර්ශන කටයුතු ආරම්භ කර නොමැත | 100 ක් පමණ ඇතැයි සැක කෙරේ | නැගෙනහිර එල්.ටී.ටී.ඊ. ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ මුස්ලිම් ජාතිකයන් සිටින බවට විශ්වාස කෙරේ | කරුණාරත්න 2014 |
| 14 | කල්මුණේ (නැගෙනහිර පළාත) | 2004 | අදාළ නොවේ | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 15 | කිලිනොච්චිය (උතුරු පළාත) | | | | | | ඉලංගමුව 2014 |
| 16 | කිරින්ද (දකුණු පළාත) | 2004 | අදාළ නොවේ | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 17 | කුරුදුවත්ත-ගාල්ල (දකුණු පළාත) | 2004 | අදාළ නොවේ | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 18 | මාමඩල, අම්බලන්තොට (දකුණු පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ඉලංගමුව 2014 |
| 19 | මාන්කුලම් (උතුරු පළාත) | 2020 | මාන්කුලම් ප්‍රදේශයේ රෝහලක් ඉදිකරන ස්ථානයක තිබී එහි සේවකයන් විසින් මිනිස් අස්ථි කොටස් සොයා ගෙන ඇත | 2020 | | | සතිපතා 2020 ශ්‍රී ලංකා https:// www'srilankaweekly. co.uk/sri-lankan-police-investigating-mass-grave-northern-province/ වෙතින් ලබා ගත හැකිය |
| 20 | මන්නාරම (උතුරු පළාත) | 2013 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 2013-2017 | 83 | | ඉලංගමුව 2014 |
| 21 | මන්නාරම නගරය (උතුරු පළාත) | 2018 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 2018- විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී | | | |
| 22 | මාතලේ (මධ්‍යම පළාත) | 2012 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | 2012-2015 | 154 | ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලේ රාජ්‍ය මර්දනයට ගොදුරු වූ සිංහල ජාතිකයන් | ඉලංගමුව 2014; බාලා 2017 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 23 | මිරුසුවිල් (උතුරු පළාත) | 2000 | හමුදා අත්අඩංගුවේ සිටියදී සිවිල් වැසියෙකු (පොන්නතුරෙයි මහේෂ්වරන්), සමූහ මිනීවළක් ඇති බවට සාක්ෂි දී ඇත. | 2005. 2000 දෙසැම්බරයේදී මළ සිරුරු ගොඩග ැනීම සිදු කරන ලදි, නඩුව චාවකච්චේරි මහේස්ත්‍රාත් අධිකරණයේ සිට කොළඹට ගෙන ගිය අතර 2005 න් පසු එහි කටයුතු ඇනහිටිණි. | 8 | යාපනයේ මිරුසුවිල් ප්‍රදේශයේදී ආරක්ෂක හමුදා විසින් අත්අඩංගුවට ගෙන ඇති කුඩා ළමුන් ඇතුළු දෙමළ සිවිල් වැසියන් | ඉලංගමුව 2014; බෝපගේ 2017; බීබීසී සිංහල, https://www.bbc.com/sinhala/news/story/2005/03/050306_mirusuvil වෙතින් ලබා ගත හැකිය |
| 24 | නිකවැරටිය (වයඹ පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | 20 | පොලිසිය විසින් ඝාතනය කරන ලද තරුණයන් බවට සැක කෙරේ | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; එක්සත් ජනපද ජාතික වාර්තාව 1998 |
| 25 | පුනරීන් (උතුරු පළාත) | 2014 | | | | | ඉලංගමුව 2014 |
| 26 | පුදුකුඩිඉරිප්පු මුලතිව් (උතුරු පළාත) | 2014 | ශ්‍රී ලාංකික පවුලක් ගෙවත්තේ තිබී මළ සිරුරු සොයා ගෙන ඇත | | 9 | | ඉලංගමුව 2014, බැංකොක් පෝස්ට් 2014 |
| 27 | සූරියකන්ද (සබරගමුව පළාත) | 1994 | මෙම වාර්තාවේ 2 කොටස බලන්න. | ඔව්, 1994-1995 | 300 | ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ලේ රාජ්‍ය මර්දනයට ගොදුරු වූ සිංහල ජාතිකයන් | 2010 ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |
| 28 | තිස්සමහාරාම (දකුණු පළාත) | 2004 | | | | සුනාමියෙන් විපතට පත් වූවන් | ඉලංගමුව 2014 |
| 29 | වල්පිට (රජයේ ගොවිපල) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | මළ සිරුරු ගොඩගැනීම සිදුකරන ලද නමුත් නිල විමර්ශනයක් සිදුකළ බවට පොදු වාර්තා නොමැත | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 30 | වවුල්කැලේ (සබරගමුව පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | මළ සිරුරු ගොඩගැනීම සිදුකරන ලද නමුත් නිල විමර්ශනයක් සිදුකළ බවට පොදු වාර්තා නොමැත | | 1990 දී වවුල්කැලේ සිවිල් වැසියන් 12 දෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් 1994 දී අධිචෝදනා ලැබූ පොලිස් නිලධාරීන් හතර දෙනා මෙම සිදුවීම හා සම්බන්ධයක් තිබිය හැක (1994 එක්සත් ජනපද ජාතික වාර්තාව) | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010, එක්සත් ජනපද ජාතික වාර්තාව 1994. |
| 31 | විල්පිට, අකුරස්ස (දකුණු පළාත) | 1998 | 1994-1998 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |
| 32 | යක්කලමුල්ල (දකුණු පළාත) | 1998 | 1998 1994-1996 අතුරුදන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශන ජනාධිපති කොමිසම | | | | ශ්‍රී ලංකා රජය 1998; ඉලංගමුව 2014; ඉක්බාල් 2010 |

**2 වන ඇමුණුම : ජාත්‍යන්තර සහ විදේශීය නීති සංග්‍රහය**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ හැකි භාවිතයන් සඳහා ලොව පුරා පවතින සමූහ මිනීවළවල් පිළිබඳ පහත නඩු තීන්දු නිදසුන් ලෙස ගත හැකිය.

**අන්තර්-ඇමරිකානු මානව හිමිකම් අධිකරණයෙන්**

- එල් මොසෝටේ සහ අනෙකුත් ස්ථාන එදිරිව එල් සැල්වදෝරයේ සමූලඝාතන, ඉදිරිපත් කරන ලද සාක්ෂිමත අනාවරණය වූ සත්‍ය කරුණු, වන්දි සහ වියදම් මත ලබා දුන් විනිශ්චය, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය C අංක 252 (2012 ඔක්තෝබර් 25):
    - බරපතළ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශන කටයුතුවලදී සිදුවීම් වටා ඇති පුළුල් සන්දර්භය සහ සංකීර්ණතා (299 ඡේදය) සලකා බැලිය යුතු අතර, මියගිය පුද්ගලයා පිළිබඳ වාර්තාමය තොරතුරු සැපයීමට රාජ්‍යයන් බැඳී සිටී (334 ඡේදය).
- Valle Jaramillo et al. එදිරිව කොලොම්බියාව, ඉදිරිපත් කරන ලද සාක්ෂිමත අනාවරණය වූ සත්‍ය කරුණු, වන්දි සහ වියදම් මත ලබා දුන් විනිශ්චය, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය C අංක 192 (2008 නොවැම්බර් 27):
    - "සාමූහික ක්‍රියාවක රටා නිර්ණය කිරීම ඇතුළුව, ඉදිරිපත් කළ හැකි වඩාත් සම්පූර්ණ ඓතිහාසික සත්‍යය" සඳහා විමර්ශනයක් උත්සාහ කළ යුතුය (102 ඡේදය).
- Pueblo Bello Masacre Colombia, ඉදිරිපත් කරන ලද සාක්ෂිමත අනාවරණය වූ සත්‍ය කරුණු, වන්දි සහ පිරිවැය මත ලබා දුන් විනිශ්චය, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය ක අංක 140 (2006 ජනවාරි 31)
    - වින්දිතයන් හඳුනා ගැනීම සඳහා තොරතුරු ලබා දෙන ලෙස රාජ්‍යයන් මහජනතාවගෙන් ඉල්ලා සිටිය යුතුය (272 ඡේදය).
    - රාජ්‍යයන් විසින් හඳුනාගත් මිනිස් දේහයන් හැකි ඉක්මනින් ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙත නැවත භාර දිය යුතුය. සමීපතම ඥාතීන් සමඟ එකඟව (273 ඡේදය) රාජ්‍යය භූමදානය කිරීමේ වියදම් ද ආවරණය කළ යුතුය.
    - සමීප ඥාතීන් සඳහා මනෝවිද්‍යාත්මක රැකවරණය ඇතුළුව, විපතට පත් වූවන්ට සිදු වූ හානිය සඳහා ප්‍රමාණවත්, සාධනීය වන්දි මුදලක් ඉක්මනින් ලැබීමට අයිතියක් ඇත (274 ඡේදය)
    - රාජ්‍යයන් නඩුවක කරුණු විමර්ශනය කළ යුතු අතර, අදාළ අවස්ථාවලදී, වගකිව යුත්තන් හඳුනාගෙන, නඩු පැවරීමට සහ දඬුවම් ලබාදීමට සිදුවේ (265-269 ඡේදය).

- Velásquez Rodríguez එදිරිව Honduras, ඉදිරිපත් කරන ලද සාක්ෂිමත අනාවරණය වූ සත්‍ය කරුණු මත ලබා දුන් නඩු තීන්දුව, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය C අංක 4 (29 ජූලි 1988)ː
    - සත්‍යයට ඇති අයිතිය සඳහා තනි පුද්ගලයින්ගේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් මෙන්ම අපයෝජනයට තුඩු දෙන සමාජ-දේශපාලන සන්දර්භය පිළිබඳ විශ්වසනීය විමර්ශනයක් අවශ්‍ය වේ; සමාජයට සහ පුද්ගලයාට ප්‍රතිලාභ සැලසෙන පරිදි විමර්ශන ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ ක්‍රියාවලිය තුළ වින්දිතයාගේ සහභාගීත්වයේ අංගයක් ඇතුළත් වේ (177 ඡේදය).
- Mapiripán Massacre එදිරිව Colombia, ඉදිරිපත් කරන ලද සාක්ෂිමත අනාවරණය වූ සත්‍ය කරුණු සහ පිරිවැය මත ලබා දුන් විනිශ්චය, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය C අංක 134 (15 සැප්තැම්බර් 2005)ː
    - "විමර්ශන සහ අධිකරණ ක්‍රියාවලීන් අතරතුර, මානව හිමිකම් කඩවීම්වලට ගොදුරු වූවන්ට හෝ ඔවුන්ගේ සමීපතම ඥාතීන්ට, කරුණු පැහැදිලි කිරීම සහ වගකිවයුත්තන්ට දඬුවම් කිරීම සහ සාධාරණ වන්දි ලබා ගැනීම යන දෙකටම සහභාගී වීමට සහ ඔවුන්ගේ හඬට ඇහුම්කන් දීමට ඕනෑ තරම් අවස්ථාව තිබිය යුතුය" (219 ඡේදය).
- 'Las Dos Erres' Massacre එදිරිව Guatemala, මූලික විරෝධතා, ඉදිරිපත් කරන ලද සාක්ෂි මත අනාවරණය වූ සත්‍ය කරුණු, වන්දි සහ පිරිවැය මත ලබාදුන් විනිශ්චය, අන්තර්-ඇමරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණ දාමය ස හඳ 211 (2009 නොවැම්බර් 24)ː
    - උල්ලංඝණය වීමක් මත පැන නගින වින්දිතයන්ගේ අයිතියක් ආරක්ෂා කිරීම සඳහා, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාධාරණ අපේක්ෂාවක් ලෙස සහ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම ඉහළ නැංවීමේ පියවරක් ලෙස, ඕනෑම විමර්ශනයක ප්‍රතිඵල සම්පූර්ණයෙන් ප්‍රකාශ කළ යුතුය (...) මියගිය අය වෙනුවෙන් ස්මාරක ඉදිකිරීම එවැනි සිද්ධීන් නැවත නැවත සිදු නොවන බවට සහතික වීමේ නිමිත්තක් ලෙස පැවතිය හැක (256-264 ඡේදය).

**මානව හිමිකම් පිළිබඳ යුරෝපීය අධිකරණයෙන්**

- Aslakhanova and others එදිරිව Russia, විනිශ්චය, ECtHR අයදුම් අංක 2944/06 සහ 8300/07, 50184/07, 332/08, 42509/10 (2012 දෙසැම්බර් 18)ː
    - මිනිස් අස්ථි කොටස් එකතු කිරීම, ගබඩා කිරීම සහ ඒවා හඳුනා ගැනීම ඇතුළුව සුසාන භූමි කැණීම් කටයුතු සඳහා අවශ්‍ය සම්පත් රාජ්‍යයන් විසින් වෙන් කළ යුතුය (226 ඡේදය).
- Kukhalashvili and others එදිරිව ජෝර්ජියාව, විනිශ්චය, ECtHR අයදුම් අංක 8938/07 සහ 41891/07 (2020 මැයි 2)ː

- ජීවිතය අහිමි වීමෙන් පසුව, විමර්ශනය කිරීමේ රාජකාරියට "වගකිවයුත්තන් හඳුනා ගැනීම සහ අවශ්‍ය නම් ඔවුන්ට දඬුවම් කිරීම" (129 ඡේදය) ඇතුළත් වේ.

- Sabanchiyeva and others එදිරිව Russia, විනිශ්චය, ECtHR අයදුම් අංක 38450/05 (6 ජූනි 2013)ː
    - මිය ගිය පුද්ගලයින්ගේ සිරුරු ආපසු භාර නොදීම සහ පැහැදිලිව හෝ නිශ්චිතව නම් නොකරන ලද ස්ථානවල භූමදානය කිරීම පවුලේ සහ පෞද්ගලික ජීවිතයට ඇති අයිතිය උල්ලංඝනය කිරීමක් වනු ඇත; නීත්‍යානුකූල අරමුණක් ඉටුකර ගැනීමේ දී නීතියට එකඟව මැදිහත් වීමක් සිදු කිරීමට අවසර ඇති අතර (මහජන ආරක්ෂාව, අක්‍රමිකතා වැලැක්වීම හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස වැනි) එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ අත්‍යාවශය අංගයකි (117-134 ඡේදය).

- Johannische Kirche සහ Peters එදිරිව Germany, Decision, ECtHR අයදුම් අංක 41754/98 (10 ජූලි 2001)
    - සිතීමේ නිදහස, හෘදය සාක්ෂිය සහ ආගමික පිළිවෙත් යටතේ ආරක්ෂා කර පරිදි, මියගිය අය භූමදාන කරන ආකාරය ආගමික පිළිවෙතෙහි අත්‍යවශ්‍ය අංගයක් විය හැකිය.

**පෙර යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙන් (ICTY)**

- පැමිණිල්ල මෙහෙයවන්නාට එදිරිව Mladić, විනිශ්චය, IT-09-02-T-117281 (2017 නොවැම්බර් 22)
    - පවුලේ සාමාජිකයන් භූමදාන කිරීමේ අයිතිය සාමාන්‍යයෙන් ආවරණය වන්නේ පුද්ගලික සහ පවුල් ජීවිතය ආරක්ෂා කිරීම මගිනි.

**දේශීය නීති තුළින්**

**ආර්ජන්ටිනාව**

- 1994 මැයි 11 දින ආර්ජන්ටිනාවේ නීති අංක 14,321ː මෙම නීතිය, නීත්‍යානුකූලව සිවිල් අරමුණු සඳහා වන මරණයකට සමාන වන "බලහත්කාරයෙන් අතුරුදහන් වූ" යන කාණ්ඩය නිර්මාණය කරයි, නමුත් පුද්ගලයා "නැවත පෙනී සිටීමේ" ඉඩකඩ ඇත. මෙම ප්‍රකාශය පුද්ගලයාගේ මරණයට රාජ්‍ය මැදිහත්වීම හෝ රජය වගකිව යුතු බව පිළිගනී.

**බොස්නියාව සහ හර්සගොවිනාව**

- 2003 බොස්නියා සහ හර්සගොවිනා අපරාධ සංග්‍රහයේ 231 අ වගන්තිය සමූහ මිනීවළක් පිළිබඳ වාර්තා කිරීමට අපොහොසත් වීම සිරදඬුවම් ලැබිය හැකි අපරාධයක් ලෙස සලකයි (බොස්නියා සහ හර්සගොවිනාː අපරාධ සංග්‍රහය (2003 ජූනි 27), බොස්නියා සහ හර්සගොවිනා නිල ගැසට් පත්‍රය 37/03).

**ඉරාකය**

- සමූහ මිනීවළවල් පිළිබඳ කටයුතු සහ ආරක්ෂාව පිළිබඳ 2015 අංක 13 දරන ඉරාක නීතිය, සමූහ මිනීවළ ආරක්ෂා කිරීම පිළිබඳ 2006 අංක 5 දරන සංශෝධිත නීතියː මෙම නීතිය ඉරාකයේ සමූහ මිනීවළවල් විමර්ශනය කිරීමේ ක්‍රියා පටිපාටිය නියම කරයි. සොයා ගැනීම වාර්තා කිරීම පුරවැසියන්ගේ යුතුකමකි. මානව හිමිකම් අමාත්‍යාංශය සමූහ මිනීවළවල් සුවිගත කිරීම සහ ලේඛනගත කිරීම අධීක්ෂණය කරන අතර එම ස්ථානය අත්පත් කර ගනී. කැනීම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා කොමිසමක් නිර්මාණය කර ඇති අතර එයට අභිචෝදක දෙපාර්තමේන්තුවේ, පොලිසියේ සහ අභියාචනාධිකරණයේ නියෝජිතයින් ඇතුළත් වේ. අතුරුදහන් වූවන්ගේ ඉරණම තහවුරු කිරීම, නඩු පැවරීම් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ සාපරාධී වගකීම ඔප්පු කිරීම සඳහා සාක්ෂි එකතු කිරීම විමර්ශනයක් අරමුණු කරයි (Lassie 2017).

3 වන ඇමුණුම 3ː **උපුටාගත් නිති**

**දේශීය**

- 2005 දී සංශෝධිත 1899 අංක 9 දරන සුසාන භූමි සහ ආදාහනාගාර ආඥාපනත
- 2016 අංක 14 දරණ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාල (ස්ථාපිත කිරීම, පරිපාලනය සහ කාර්යයන් ඉටුකිරීම) පනත
- 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත
- 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) 1 (සංශෝධන) පනත
- 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය
- 1975 අංක 40 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ පනත
- සංශෝධිත 1895 අංක 14 දරන සාක්ෂි ආඥාපනත
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත
- 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත

**ජාත්‍යන්තර නීතිය**

ජාත්‍යන්තර මානුෂීය නීතියː

- ජිනීවා සම්මුතීන්ː GCI, GCII, GCIII, GCIV, 1977 ජිනීවා සම්මුතිවලට අතිරේක ප්‍රොටෝකෝලය 1, 2016 අතිරේක විවරණ
- චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂීය නීති රීති (https://ihl-databases.icrc.org/customary-ihl/eng/docs/v1_rul හි ඇත)

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියː

- 1980 දී ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR)

- 2016 දී ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද බලහත්කාර අතුරුදහන්වීම් වලින් සියලු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය (CED)

**4 වන ඇමුණුම : තවදුරටත් අදාළ මාර්ගෝපදේශ**

- ජිනීවා ඇකඩමිය සහ රතු කුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව (ICRC) (2019), ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (2016), නීති විරෝධී යැයි සිතිය හැකි මරණය පිළිබඳ විමර්ශනය පිළිබඳ මිනසෝටා ප්‍රොටෝකෝලය www.ohchr.org/Documents/Publications/MinnesotaProtocol.pdf) වෙතින් ලබා ගත හැක
- ලෝක ව්‍යාප්ත රුධිර පාරවිලයනය සහ සලීය ප්‍රතිකාර ක්‍රම දියුණු කිරීම (2010), මහා මරණ DNA හඳුනාගැනීමේ මෙහෙයුම් සඳහා මාර්ගෝපදේශ (ලබා ගත හැකියඃ www.aabb.org/programs/disasterresponse/Documents/aabbdnamassfatalityguidelines.pdf)
- Cox, M et al. (eds) (2008), සමූහ මිනීවළවල් පිළිබඳ විද්‍යාත්මක විමර්ශනයඃ ප්‍රොටෝකෝල සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් (කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය)
- අතුරුදහන් වූවන් පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (ICMP) (2018), පළමු ප්‍රතිචාර දක්වන්නන් සඳහා මාර්ගෝපදේශඃ දන්නා හෝ සැක කරන මිනිවළවල් හෝ සිරුර බැහැර කරන ස්ථාන ආරක්ෂා කිරීම, ICMP.ST.AA.857.1 ඃ ප්‍රවේශය-www.icmp.int/wp-content/uploads/2018/10/icmp-st-aa-857-1-doc-guidelines-for-first-response-at-grave-or-body-disposal-locations.pdf)

## Bibliography

Amnesty International. *Sri Lanka: Chemmani exhumations - positive first steps towards truth and justice*. AI Index: ASA 37/17/99. Amnesty International 1999. https://www.amnesty.org/download/Documents/144000/asa370171999en.pdf

Anandakugan, Nithyani. "The Sri Lankan Civil War and Its History, Revisited in 2020" *Harvard International Review*, 31 August 2020, https://hir.harvard.edu/sri-lankan-civil-war/.

Aneez, Shihar. "Sri Lanka says suspected wartime mass grave is an old cemetery." *Reuters*, 7 March 2014, https://www.reuters.com/article/us-srilanka-rights-grave-idUKBREA261FT20140307.

Anstett, Elizabeth, and Jean-Marc Dreyfus. *Human Remains and Mass Violence: Methodological Approaches*. Manchester: Manchester University Press, 2016.

Anstett, Elisabeth. *Human Remains and Identification: Mass Violence, Genocide and the 'Forensic Turn'*. Manchester: Manchester University Press, 2015.

Anstett, Elisabeth, and Jean-Marc Dreyfus. *Destruction and Human Remains: Disposal and Concealment in Genocide and Mass Violence*. Manchester: Manchester University Press, 2014.

Asian Human Rights Commission. *Sri Lanka: Six years after Chemmani exhumation: Inquiry commission needed to review attorney general's department*, January 4 2006, http://www.humanrights.asia/news/ahrc-news/AS-002-2006/.

Bala, Mytili. "Transitional Justice and the Right to Know: Investigating Sri Lanka's Mass Graves." In *Transitional Justice in Sri Lanka — Moving Beyond Promises*, edited by B Fonseka, 258-9. Colombo: Centre for Policy Alternatives, 2017.

BBC Sinhala News. *No Instructions on Chemmani's CID*, 4 January 2006, https://www.bbc.com/sinhala/news/story/2006/01/printable/060104_chemmani_ag

Bopage, Lionel. *Mass graves everywhere, but where are the killers?*. Self-published paper, 2017. https://www.researchgate.net/publication/323772087_Mass_graves_everywhere_but_where_are_the_killers.

Borham, Maneshka and Indunil Usgoda Arachchi, "Sooriyakanda - the gruesome and forlorn grave." *Sunday Observer*, 4 Nov 2018, https://www.sundayobserver.lk/2018/11/04/news-features/sooriyakanda-gruesome-and-forlorn-grave

Callamard, Agnes. *Extrajudicial, summary or arbitrary executions*, *Note by the Secretary-General*. United Nations: New York, 2020.

Centre for Policy Alternatives. The *Right to Privacy in Sri Lanka*. Colombo: Centre for Policy Alternatives, 2020, https://www.cpalanka.org/wp-content/uploads/2020/09/Discussion-Paper-Right-to-Privacy-updated-draft-4-1.pdf

Cordner, Stephen, and Morris Tidball-Binz. 2017. "Humanitarian Forensic Action — Its Origins and Future." *Forensic Science International* 279 (October): 65–71. https://doi.org/10.1016/j.forsciint.2017.08.011.

Cronin-Furman, Kate, and Mario Arulthas. "How the Tigers Got Their Stripes: A Case Study of the LTTE's Rise to Power." *Studies in Conflict & Terrorism*, 2021.

Dziuban, Zuzanna, *Mapping the 'Forensic Turn': Engagements with Materialities of Mass Death in Holocaust Studies and Beyond*. Vienna: New Academic Press, 2017.

Embilipitiya Disappeared Schoolchildren's Parents Organisation Fonds. *Historical Dialogue. Records of the Secretary (SHC De Silva), 1990-2018*. Sri Lanka: Historical Dialogue, January 2022. https://historicaldialogue.lk/wp-content/uploads/2022/02/FINDING-AID_ESC1_24022022_HD.pdf

Fernández-Álvareza, José, David Rubio-Melendia, Antxoka Martínez-Velasco, Jamie K.Pringle, Hector-David Aguilera, "Discovery of a mass grave from the Spanish Civil War using Ground Penetrating Radar and forensic archaeology," Forensic Science International, Volume 267, October 2016, Pages e10-e17

Fernando, Brito. Interview with Sophie Bisping. Zoom, 27 July 2022.

Fernando, Ruki. Interview with Sophie Bisping. Zoom, 9 August 2022.

Fournet, Caroline, and Nicole Siller. "'We Demand Dignity for the Victims' – Reflections on the Legal Qualification of the Indecent Disposal of Corpses." *International Criminal Law Review* 15 no. 5 (2015): 896–925.

Ganguly, Meenakshi. "Families of Sri Lanka's Forcibly Disappeared Denied Justice", *Human Rights Watch*, 25 August 2021, https://www.hrw.org/news/2021/08/25/families-sri-lankas-forcibly-disappeared-denied-justice.

Government of Sri Lanka. *Final Report of the Commission of Inquiry Into Involuntary Removal and Disappearance of Certain Persons (all Island)*, 1998. Available at http://www.disappearances.org/news/mainfile.php/reports_srilanka/

Groundviews, "From mass grave to cemetery: Questioning the claims in Mannar", 3 December 2014, *Groundviews.org*, https://groundviews.org/2014/03/12/from-mass-grave-to-cemetery-questioning-the-claims-in-mannar/

Haglund, William D., Melissa Connor, and Douglas D. Scott. "The Archaeology of Contemporary Mass Graves." *Historical Archaeology* ٣٥, no. ١ :(٢٠٠١) -٥٧ ٦٩.)

Hartnett, Conor. 2016. *The Relationship between Truth-Seeking and Prosecution*. Colombo: ICES.

Haviland, Charles. "Sri Lanka mass grave yields more skeletons", *BBC News*, 18 January 2014, http://www.bbc.com/news/world-asia-25782902.

Hoole, Ranjan "Embilipitiya Schoolboys' Affair – The Thin End Of The Wedge", *The Colombo Telegraph,* 9 May 2014, https://www.colombotelegraph.com/index.php/embilipitiya-schoolboys-affair-the-thin-end-of-the-wedge/.

Human Rights Watch. *Human Rights Accountability in Sri Lanka*. Human Rights Watch 1992, https://www.hrw.org/reports/pdfs/s/srilanka/srilanka925.pdf.

Human Rights Watch. *Recurring Nightmare: State Responsibility for "Disappearances" and Abductions in Sri Lanka*. Human Rights Watch 2008, https://www.hrw.org/report/2008/03/05/recurring-nightmare/state-responsibility-disappearances-and-abductions-sri-lanka.

Ilangamuwa, Nilantha. "Sri Lanka, the island of mass graves", *Asian Human Rights Commission,* 3 June 2014, http://www.humanrights.asia/news/ahrc-news/AHRC-ART-043-2014/.

Iqbal, MCM. "Mass Graves: Nothing new to Sri Lanka", *Groundviews*, 6 July 2010, https://groundviews.org/2010/06/07/mass-graves-nothing-new-to-sri-lanka/

Judt, Tony, and Pierre Nora. "Realms of Memory: The Construction of the French Past." *The New York Review of Books* 45 no. 19 (1998): 51.

Journalists for Democracy in Sri Lanka, "Excavations to resume on Sri Lanka's largest mass grave", *Journalists for Democracy in Sri Lanka,* 24 February 2022.
http://www.jdslanka.org/index.php/news-features/human-rights/1079-excavations-to-restart-on-sri-lankas-largest-mass-grave.

Kabir, Sarah. Interview with Sophie Bisping. Zoom, 12 July 2022.

Karunarathne, Waruni. "Police Record Statements About Mass Grave", Sri Lanka Ministry of Foreign Affairs, 13 July 2014. Available online: https://mfa.gov.lk/police-record-statements-about-mass-grave/

Karunaratne, Natasha. *The Battleground of Sri Lankan History Education: Barriers to Teaching Inclusive Histories*. Colombo: International Centre for Ethnic Studies, 2021.

Klinkner, M. *The Bournemouth Protocol on Mass Grave Protection and Investigation*. Bournemouth: Bournemouth University Press, 2020.

Kodikara, Chulani. Interview with Sophie Bisping. Zoom, 03 August 2022.

Lassée Isabelle. "The Sri Lankan Office on Missing Persons: Truth and Justice in Tandem?" *International Review of the Red Cross* ٩٩, no. ٣٩–٦١٩ :(٢٠١٧) ٩٠٥. https://doi.org/10.1017/S1816383118000504.

"Matale Mass Grave: The Investigation Has Been Taken Away From The Judiciary", *The Colombo Telegraph*, 22 June 2013, https://www.colombotelegraph.com/index.php/matale-mass-grave-the-investigation-has-been-taken-away-from-the-judiciary/

McGilvray, Dennis B., and Mirak Raheem. 2007. "Muslim Perspectives on the Sri Lankan Conflict." http://hdl.handle.net/10125/3527.

Medawatte, Danushka. "Implementation of IHL Obligations with Regard to Missing Persons in Post-Armed Conflict Sri Lanka," *International Committee of the Red Cross*, 2019.

"More Finds in Sri Lanka Mass Grave", *Associated Press*, 12 April 1999, https://apnews.com/article/44e7d5e9af863e5a4778048eb66434a8.

"New proposals on laws over death inquests", *The Colombo Post*, 12 November 2017, https://www.thecolombopost.org/en/asia-en/asia-srilanka-en/20474/.

Office on Missing Persons, *Interim Report*, August 2018, Available at http://www.jdslanka.org/images/documents/disappearances_executions/the_office_on_missing_persons_interim_report_2018_august.pdf

Office on Missing Persons, *Annual Report*, 2020, Available at http://omp.gov.lk/omp-documents/omp-reports

Pass, Allan D., and Ayn Embar-Seddon. *Forensic Science*. Vol. Second edition, "Mass Graves," Salem Press, 2015.

Perera, C and C Briggs. "Guidelines for the effective conduct of mass burials following mass disasters: post- Asian Tsunami disaster experience in retrospect." *Forensic Science Medicine and Pathology* 4 (2008), https://journals.plos.org/plosmedicine/article?id=10.1371/journal.pmed.0020185

Perera, C. "After the Tsunami: Legal Implications of Mass Burials of Unidentified Victims in Sri Lanka", PLoS Med 2 no. 6: 185. https://journals.plos.org/plosmedicine/article?id=10.1371/journal.pmed.0020185.

"Police seek more time to resume Mannar mass grave excavations" *The Leader*, 1 December 2022, https://english.theleader.lk/news/3081-police-seek-more-time-to-resume-mannar-mass-grave-excavations

Ratnawalli, Darshanie. "Matale Mass Grave: Skeletons in Closets as Well?", *Colombo Telegraph,* 21 December 2014, http://www.colombotelegraph.com/index.php/matale-mass-grave-skeletons-in-closets-as-well/.

Rosenblatt, Adam. 2020. *Digging for the Disappeared: Forensic Science after Atrocity*.Stanford University Press. https://doi.org/10.1515/9780804794886.

Ruwanpathirana, Thyagi. *Memorialisation for Transitional Justice in Sri Lanka: A Discussion Paper*, Discussion Paper (Centre for Policy Alternatives, 2016).

Senanayake, Jane Thompson. "A sociological exploration of disappearances in Sri Lanka", *Asian Human Rights Commission*, http://www.humanrights.asia/wp-content/uploads/2018/08/A-SOCIOLOGICAL-EXPLORATION-OF-DISAPPEARANCES-IN-SRI-LANKA.pdf.

Somadeva, Raj. *Human Skeletal Remains Found at the District General Hospital Premises in Matale: The Report on Forensic Archaeology*. Colombo: Journalists for Democracy in Sri Lanka, 2013. http://www.jdslanka.org/images/documents/disappearances_executions/matale_forensic_archaeology_report.pdf

*Somaratne Rajapakse others v. Hon. Attorney* General, Sri Lanka Supreme Court, 2003.

"Sri Lanka family finds mass grave in garden", *Bangkok Post,* 1 March 2014, https://www.bangkokpost.com/world/397666/sri-lanka-family-finds-mass-grave-in-garden.

"Sri Lanka again delays dig at suspected Muslim mass grave", *Bangkok Post,* 18 August 2014, https://www.bangkokpost.com/world/427430/sri-lanka-again-delays-dig-at-suspected-muslim-mass-grave

"Sri Lanka begins exhumation of wartime mass grave", *Business Standard,* 18 August 2014, https://www.business-standard.com/article/news-ani/sri-lanka-begins-exhumation-of-wartime-mass-grave-114081800921_1.html

"Sri Lanka mass grave called 'a crime site'", *Aljazeera,* 18 February 2013, https://www.aljazeera.com/news/2013/2/18/sri-lanka-mass-grave-called-a-crime-site

Sri-Jayantha, Avis Harrell. "Mass Graves in the Tamil Homeland", *Scoop World*, 26 July 2004, https://www.scoop.co.nz/stories/WO0407/S00238/mass-graves-in-the-tamil-homeland.htm

Stover, Eric, and Rachel Shigekane. 2002. "The Missing in the Aftermath of War: When Do the Needs of Victims' Families and International War Crimes Tribunals Clash?" *Revue Internationale de La Croix-Rouge/International Review of the Red Cross* 84 (848): 845. https://doi.org/10.1017/S1560775500104201.

Thomas, Kris. "Sri Lanka mass grave excavation halted", *Asia Times,* 25 March 2019, https://asiatimes.com/2019/03/sri-lanka-halts-mass-grave-excavation-after-disparity-in-reports/.

United Nations High Commissioner for Human Rights. *Preliminary observations of the Working Group on Enforced or Involuntary Disappearances at the conclusion of its visit to Sri Lanka (9-18 November 2015)*. New York : United Nations Headquarters, 2015, https://www.ohchr.org/en/statements/2015/11/preliminary-observations-working-group-enforced-or-involuntary-disappearances?LangID=E&NewsID=16771#sthash.mVg%204dEyv.dpuf

United Nations High Commissioner for Human Rights (OHCHR). *Promoting reconciliation, accountability and human rights in Sri Lanka"*. Annual report of the and reports of the Office of the High Commissioner and the Secretary-General. New York: United Nations Headquarters. 2019.

United Nations High Commissioner for Human Rights (OHCHR). *The Minnesota Protocol on the Investigation of Potentially Unlawful Death*. New York: UN Headquarters, 2017.

United Nations, Special Rapporteur on Extra-Judicial Killings. *Report of the Special Rapporteur, Mr. Bacre Waly Ndiaye submitted pursuant to Commission on Human Rights resolution 1997/61, Visit to Sri Lanka*. New York, NY: UN Headquarters, 1998, https://documents-dds-ny.un.org/doc/UNDOC/GEN/G98/109/17/PDF/G9810917.pdf?OpenElement.

United Nations, Department of Economic and Social Affairs. *Report of the Special Rapporteur of the Human Rights Council on the rights of indigenous peoples*. New York, NY: UN Headquarters, 2016.

United Nations General Assembly, Human Rights Council. *Promoting reconciliation, accountability and human rights in Sri Lanka: Report of the Office of the United Nations High Commissioner for Human Rights*. New York, NY: UN Headquarters, 2019.

University Teachers for Human Rights (Jaffna). *Gaps in the Krishanthy Kumarasamy Case: Disappearances & Accountability*. Special Report No: 12, 1999, https://uthr.org/SpecialReports/spreport12.htm#_Toc515700090

U.S. Department of State. *Country Reports on Human Rights Practices, Sri Lanka: 1990 Report*, https://archive.org/details/countryreportson1990unit/page/1630/mode/2up?q=sri+lanka&view=theater.

U.S. Department of State. *Country Reports on Human Rights Practices, Sri Lanka: 1994 Report,* http://dosfan.lib.uic.edu/ERC/democracy.html.

U.S. Department of State. *Country Reports on Human Rights Practices, Sri Lanka: 1999 Report*, https://1997-2001.state.gov/global/human_rights/1999_hrp_report/srilanka.html.

U.S. Department of State. *Country Report on Human Rights Practices, Sri Lanka: 2000 Report*, 26 February 2001, available at: https://www.refworld.org/docid/3ae6aaa10.html

U.S. Department of State. *Country Reports on Human Rights Practices, Sri Lanka: 2016 Report*, https://www.state.gov/reports/2016-country-reports-on-human-rights-practices/sri-lanka/

"Vavuniya High Court passes an interim stay order to stop proceedings in the Mannar Mass grave case", *Centre for Human Rights and Development*, 26 August 2020, https://srilankachrd.org/dynamic.php?news=199

Veerasingham, Ramanan. "TNA calls for international probe into Mannar Mass grave", 12 February 2014, *Journalists for Democracy Sri Lanka* , available at <http://www.jdslanka.org/index.php/news-features/human-rights/435-tna-calls-for-international-probe-into-mannar-mass-grave-as-toll-soars-to-59>

"Vesak Day Reflections On The Matale Mass Grave", *The Colombo Telegraph*, 24 May 2013, https://www.colombotelegraph.com/index.php/vesak-day-reflections-on-the-matale-mass-grave/

Wickramasinghe, Nira. *Sri Lanka in the Modern Age: A History*. Oxford: Oxford University Press, 2014.

Wijedasa, Namini. "Mass graves: The dead tell a tragic tale of delays and disputes", *The Sunday Times,* 2014. available at https://www.sundaytimes.lk/190106/news/mass-graves-the-dead-tell-a-tragic-tale-of-delays-and-disputes-328719.html

Wijesinghe, Kithsiri. "Sri Lanka: Ten bodies found in Tamil area mass grave", 14 June 2018, *Journalists for Democracy in Sri Lanka*, available at < http://www.jdslanka.org/index.php/news-features/human-rights/783-mannar-cwe-massgrave-excavations>.

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

1982 සිට, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයෙහි (ICES) අදහස් ලෝකයට දායක වී ඇති අතර පර්යේෂණ, සංවාද, නිර්මාණාත්මක කලා සහ වෙනත් මැදිහත්වීම් හරහා ප්‍රතිපත්ති සහ භාවිතයන් දැනුවත් කර ඇත. ICES සංහිඳියාව, යුක්තිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ මානව හිමිකම් යන ක්ෂේත්‍රවල වැදගත් ක්‍රියාකාරිකයකු වී ඇති අතර ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, වාර්ගික විවිධත්වය, ආගමික සහජීවනය සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රතිපත්ති සහ මහජන පරිකල්පනය හැඩගැස්වීමේදී විශේෂයෙන් බලපා ඇත. ආයතනයේ ඉලක්කය වන්නේ අපගේ පොදු මනුෂ්‍යත්වය හඳුනා ගන්නා, විවිධ අනන්‍යතා ප්‍රවර්ධනය කරන සහ යුක්තිය, සාධාරණත්වය සහ සාමකාමී සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ආයතන දැනුවත් කරනු ලබන සහ මඟ පෙන්වන අදහස් ජනනය කිරීමට අදාළ දැඩි බුද්ධිමය සම්ප්‍රදායන් සඳහා දායක වීමයි.

Rosa Luxemburg Stiftung (RLS)

The Rosa Luxemburg Stiftung (RLS) යනු විවේචනාත්මක සමාජ විශ්ලේෂණය සහ සිවිල් අධ්‍යාපනය යන විෂයයන් සම්බන්ධයෙන් ලෝකයේ අනෙකුත් කලාපයන් හි මෙන්ම දකුණු ආසියාවේ ද ක්‍රියාත්මක වන ජර්මනිය පදනම් කරගත් පදනමකි. එය ස්වෛරී, සමාජවාදී, ලෞකික සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ පර්යායක් ප්‍රවර්ධනය කරන අතර සමාජයට සහ තීරණ ගනු ලබන්නන්ට විකල්ප ප්‍රවේශයන් ඉදිරිපත් කිරීම අරමුණු කරයි. පර්යේෂණ සංවිධාන, ස්වයං-විමුක්තිය සඳහා වන කණ්ඩායම් සහ සමාජ ක්‍රියාකාරීන් වැඩි වශයෙන් සමාජ හා ආර්ථික සාධාරණත්වයක් ලබා දීමේ හැකියාව ඇති ආකෘති සංවර්ධනය කිරීමට ඔවුන්ගේ මුලපිරීම්වලට සහාය වේ.

# ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් ස්ථාන: ඉතිහාසය සහ නෛතික රාමුව

## සොෆී බිස්පින්ග්

1992 සිට 2022 දක්වා කාලය තුළ අවම වශයෙන් සමූහ  සොහොන් ස්ථාන 32 ක් ශ්‍රී ලංකාවෙන් අනාවරණය කරගෙන ඇත. සිදු කරන ලද විමර්ශන කිහිපයෙන්, වින්දිතයන් සම්පූර්ණයෙන් හඳුනා ගැනීමට, එක් එක් සොහොනට පෙර සිදුවීම් පිළිබඳ ස්ථාවර ආඛ්‍යාන ස්ථාපිත කිරීමට හෝ වගකිවයුතු ක්‍රියාකාරීන්ට නඩු පැවරීමට කිසිවක් සාර්ථක නොවීය. වෙබ් අඩවි පිළිබඳ දැනුම විවිධ මූලාශ්‍ර හරහා විසිරී තිබූ අතර, මෙම ගැටලුව පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමට අපහසු විය. මෙම වාර්තාව එක් එක් වෙබ් අඩවියේ පවතින තොරතුරු ඒකාබද්ධ කරයි. එය ඓතිහාසික සන්දර්භය ලබා දීමෙන් සහ පූර්ව සොයා ගැනීම් සංස්ලේෂණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ විමර්ශනවලට ඇති අභියෝග පැහැදිලි කරයි. සමූහ සොහොන්  සොයා ගැනීම, විමර්ශනය කිරීම සහ සැමරීම නියාමනය කරන දේශීය සහ ජාත්‍යන්තර නීති රාමු තුළ මෙම දත්ත ස්ථානගත කරයි. සමූහ සොහොන් පිළිබඳ ප්‍රශ්නය පිළිබඳ නිවැරදි දැනුම සහ නීතිමය සන්දර්භගත කිරීම ශ්‍රී ලංකාව තුළ තිරසාර පශ්චාත් ගැටුම් සංහිඳියාවක් සඳහා එකසේ වැදගත් වේ. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ න්‍යායික ඉදිරි දර්ශන සහ ජාත්‍යන්තර පූර්වාදර්ශ මත පදනම්ව පශ්චාත්-ගැටුම් සහිත සමාජවල සමූහ සොහොන් කළමනාකරණය කිරීමේ හොඳම භාවිතයන් මෙම වාර්තාව තවදුරටත් සාකච්ඡා කරයි. ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය විසින් මෙහෙයවනු ලබන විශාල ව්‍යාපෘතියක කොටසක් ලෙස, මෙය ශ්‍රී ලංකාවේ සමූහ සොහොන් පිළිබඳ වඩා හොඳ මහජන අවබෝධයක් සඳහා අඩිතාලම දැමීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**සොෆී බිස්පින්ග්** දැනට කැනඩාවේ Montreal හි McGill විශ්ව විද්‍යාලයේ නීති උපාධිය සම්පූර්ණ කරමින් සිටින අතර මීට පෙර රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන්  සේවය කර ඇත.

ISBN: 978-624-5502-19-6
9 786245 502196

ROSA LUXEMBURG STIFTUNG SOUTH ASIA
INTERNATIONAL CENTRE FOR ETHNIC STUDIES

මුද්‍රණය: හොරයිසන් ප්‍රින්ටින් (පුද්) සමාගම